සැ. යු.-- 2009.10.09 දින පළ වූ අංක 1,623 දරන ගැසට් පත්‍රයේ IV(අ) කොටස පළ නොවීය.

# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

අංක 1,624 - 2009 ඔක්තෝබර් මස 16 වැනි සිකුරාදා - 2009.10.16

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)

## I වැනි කොටස : (IIඅ) වැනි ඡෙදය - පළකිරීම්

(වෙන වෙනම ගොනු කර ගත හැකි පරිදි සෑම කොටසකට ම අයත් එක් එක් භාෂාවකට වෙන වෙනම පිටු අංක යොදා ඇත.)


| | පිටුව | | පිටුව |
|---|---|---|---|
| තනතුරු - ඇබෑර්තු ... ... ... ... | 1562 | විභාග, විභාග ප්‍රතිඵල ආදිය ... ... ... | 1562 |


**සතිපතා නිකුත් වන ගැසට් පත්‍රයෙහි පළකිරීම සඳහා භාරගනු ලබන දැන්වීම් පිළිබඳ**

### වැදගත් නිවේදනයයි

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ *ගැසට් පත්‍රයේ* අවසන් පිටුවේ සෑම මාසයකම මුල් සතියේ දී පළ කරන නිවේදන භාරගන්නා දිනයන් සහ වේලාවන් පිළිබඳව මින් අවධානය යොමු කරනු ලැබේ.

*ගැසට් පත්‍රයේ* පළ කිරීම සඳහා භාරගන්නා සියළුම දැන්වීම් *ගැසට් පත්‍රය* පළකරනු ලබන දිනයට සති දෙකකට පෙර සිකුරාදා දිනයෙහි දහවල් 12.00 ට අවසන් කරනු ලැබේ. තනතුරු - ඇබෑර්තු, විභාග, ටෙන්ඩර් සහ වෙන්දේසි පිළිබඳ දැන්වීම්වල අවසන් දින සහ වේලාවන් ඒ පිළිබඳව උනන්දුවක් දක්වන අයට ප්‍රමාණවත් කාල වේලාවක් ලැබෙන පරිදි යොදාගත යුතු බවට, සියලුම දෙපාර්තමේන්තු, සංස්ථා සහ මණ්ඩල යනාදිය වගබලාගත යුතු බව මින් අවධාරණය කෙරේ. පළකිරීම සඳහා එවනු ලබන සෑම දැන්වීමක් ම තනි පැත්තේ පමණක් පැහැදිලිව පිටපත් කළ යුතුය. නිරවද්‍යතාවය පිළිබඳව කරන විමසීම් සහ පැමිණිලි *ගැසට් පත්‍රය* පළ වූ දින සිට තෙමසකට පසුව භාරගනු නොලැබේ.

*ගැසට් පත්‍රයේ* පළ කරන සෑම දැන්වීමක් ම *ගැසට් පත්‍රය* පළ කරනු ලබන දිනට සති දෙකකට පෙර එනම්, 2009 ඔක්තෝබර් මස 23 වැනි දින පළ කෙරෙන *ගැසට් පත්‍රයේ* දැන්වීම් 2009 ඔක්තෝබර් මස 09 වැනි දින දහවල් 12.00ට හෝ ඊට පෙර තැපෑලෙන් හෝ ගෙනවිත් රජයේ මුද්‍රණාලයට භාරදිය යුතුය.

**ලක්ෂමන් ගුණවර්ධන,**
රජයේ මුද්‍රණාලයාධිපති.

2009 ජනවාරි මස 01 වැනි දින,
රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුව,
කොළඹ 08.

## ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රයෙහි පළ කරනු ලබන රාජ්‍ය සේවා පත් කිරීම්වලට අදාළ වන පොදු කොන්දේසි

**අවශ්‍ය සාමාන්‍ය සුදුසුකම් :**

1.1 තමා ශ්‍රී ලාංකිකයෙකු බවට ප්‍රමාණවත් සාක්ෂි සෑම අයදුම්කරුවකු විසින්ම ඉදිරිපත් කළ යුතුය.

ශ්‍රී ලාංකික යනුවෙන් අදහස් කෙරෙනුයේ ලංකා පුරවැසි පනතේ අර්ථ දක්වා ඇති පරිදි පාරම්පරික වශයෙන් හෝ ලියාපදිංචි කරවා ගැනීමෙන් හෝ ශ්‍රී ලංකාවේ පුරවැසිකම් ලැබූවෙකි.

1.2 ජ්‍යෙෂ්ඨ පාඨශාලා සහතික පත්‍ර විභාගයෙන් හෝ ඊට සමාන හෝ ඊට වඩා උසස් විභාගයකින් සමත් වී තිබීම අවම අධ්‍යාපනික සුදුසුකමක් වශයෙන් නියම කොට ඇති යම් තනතුරක් සඳහා ඉල්ලුම් කරන අයදුම්කරුවෙකු සිංහල හෝ දෙමළ හෝ මාධ්‍යයෙන් අධ්‍යාපනය ලැබූ අයෙකු වේ නම්, ඔහු ජ්‍යෙෂ්ඨ පාඨශාලා සහතික පත්‍ර විභාගයෙන් හෝ ඊට සමාන විභාගයකින් හෝ සිංහල හෝ දෙමළ හෝ භාෂාව විෂයයෙන් අවස්ථාවෝචිත පරිදි සමත් වී සිටිය යුතුය. (1961 ජනවාරි මස 1 වැනි දිනට පෙර දිනක සිට රාජ්‍ය සේවයෙහි යෙදී සිටින්නාවූත් රාජ්‍ය සේවයෙහි වෙනත් තනතුරුවලට ඉල්ලුම් කරන්නාවූත් නිලධාරින් විෂයෙහි මෙම නියමය අදාළ නොවන්නේය.)

*1.3 අයදුම් කරනු ලබන තනතුර සඳහා නියමිත ඉහළම රාජ්‍ය භාෂා ප්‍රවීණතා පරීක්ෂණවලින් නිදහස් කිරීමට හිමිකම් ලබන සුදුසුකම් පසු කලකදී ලබා තිබේ නම් මිස, නියමිත රාජ්‍ය භාෂා ප්‍රවීණතා පරීක්ෂණය සමත්වීමට අපොහොසත්වීම නිසා පරිවාස/පරීක්ෂණ කාලයකට යටත් දෙන ලද සිය පත්වීම අවසන් කරනු ලැබූ, සිංහල හෝ දෙමළ හෝ නොවන භාෂා මාධ්‍යයකින් රජයේ සේවයට ඇතුළත්ව සිටි නව ප්‍රවේශක නිලධාරීන්ගෙන් ලැබෙන අයදුම්පත් භාරගනු නොලැබේ.

**2. සේවා කොන්දේසි - සාමාන්‍ය :**

2.1 රාජ්‍ය සේවයෙහි යෙදී සිටින සියලුම නිලධාරීහු මුදල් රෙගුලාසි, ආයතන සංග්‍රහය, දෙපාර්තමේන්තු නියෝග හෝ රෙගුලාසි සහ රජය විසින් වරින් වර නිකුත් කරනු ලැබිය හැකි වෙනත් නියෝග හෝ රෙගුලාසිවලට යටත් විය යුත්තා හ.

2.2 අදාළ අමාත්‍යාංශයෙහි ලේකම් විසින් තීරණය කරනු ලැබිය හැකි ප්‍රමාණයේ මුදලක් එම ලේකම් විසින් තීරණය කරනු ලැබිය හැකි අන්දමකින් ඇප තබන ලද රාජ්‍ය සේවා නිලධාරින්ගේ (ඇප) ආඥාපනත යටතේ රාජ්‍ය නිලධාරියකුට නියම කරනු ලැබිය හැකිය.

2.3 දිවයිනේ ඕනෑම තැනක සේවය කිරීමට රාජ්‍ය නිලධාරියෙකුට නියම කරනු ලැබිය හැකිය.

**3. ස්ථිර පත්වීම් දරන රාජ්‍ය නිලධාරින්ට අදාළ සේවා කොන්දේසි :**

3.1 ස්ථිර පත්වීම් දරන රාජ්‍ය නිලධාරිහු පූර්වෝක්ත 2 වන වගන්තියේ සඳහන් කොන්දේසිවලට අතිරේක වශයෙන් පහත දැක්වෙන අනිකුත් කොන්දේසිවලටද යටත් විය යුතුය.

3.1.1 යම්කිසි තනතුරක පරිවාස කාලය අවුරුදු තුනකට වැඩි විය යුතු යැයි සලකනු ලබන්නේ නම් විනා එසේ නොමැති නම් සියලුම පත් කිරීම් අවුරුදු තුනක පරිවාස කාලයකට යටත් වනු ඇත. පරිවාස කාලය තුළ හේතුවක් නොදක්වා සේවය නතර කරනු ලැබිය හැකිය.

3.1.2 සියලුම රාජ්‍ය නිලධාරිහු රාජ්‍ය භාෂා ප්‍රතිපත්තියෙහි අවශ්‍යතාවයන් සඳහා ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ IV වන පරිච්ඡේදයේ විධිවිධාන සහ රජයේ භාෂා ප්‍රතිපත්තිය ක්‍රියාත්මක කිරීම සඳහා දැනට පවත්නා වූ සහ මින් මතු පනවනු ලබන්නාවූ අනෙකුත් නීති, රෙගුලාසි සහ ව්‍යවස්ථා ද පිළිපැදිය යුත්තාහ.

3.1.3 රාජ්‍ය භාෂාවකින් වැඩ කිරීමට හැකිවන අන්දමේ දැනුමක් තමන්ගේ පරිවාස කාලය ඇතුළත ලබාගන්නා ලෙස සිංහල හෝ දෙමළ නොවන භාෂා මාධ්‍යයකින් රාජ්‍ය සේවයට ඇතුළත් වූ නිලධාරින්ට නියම කෙරේ.

3.1.4 සිංහල හෝ දෙමළ හෝ නොවන වෙනත් භාෂා මාධ්‍යයකින් සේවයට ඇතුළත් වූ නිලධාරියෙකු පරිවාස කාලය අවසානයේදී තනතුරෙහි ස්ථිර කරනු ලැබීමට අදාළ වන වෙනත් කරුණු අතර, අවුරුද්දක් ඇතුළත කවර හෝ රාජ්‍ය භාෂාවකින් නියමිත ප්‍රවීනතා පරීක්ෂණයෙහි I වැනි ශ්‍රේණියෙන් සමත්වීමත්, අවුරුදු දෙකක් ඇතුළත II වැනි ශ්‍රේණියෙන් සමත්වීමත් (අවශ්‍යනම්) අවුරුදු තුනක් ඇතුළත III වැනි ශ්‍රේණියෙන් සමත්වීමත් බලපවත්වනු ඇත.

නියමිත කාල සීමා ඇතුළත දී පරීක්ෂණයකින් අසමත් වුවහොත් වැටුප් වර්ධකයක් තාවකාලිකව අත්හිටුවනු ලැබිය හැකිය. නියමිත කාලසීමාව ඉක්මවා තව මාස හයක කාල සීමාවක් ඇතුළත යථෝක්ත පරීක්ෂණයෙන් සමත්වීමට අසමත් වුවහොත් එසේ වැටුප් වර්ධක තාවකාලිකව අත්හිටුවීම, වැටුප් වර්ධක නතර කිරීමකට පරිවර්තනය කෙරෙනු ඇත. පරීක්ෂණයෙන් සමත්වන තෙක් හෝ පහත දැක්වෙන 3.1.6 වැනි වගන්තියේ විධිවිධානයන් බලපවත්වන තෙක් හෝ යථෝක්ත වැටුප් වර්ධකයන් නතර කිරීම ක්‍රියාත්මක වන්නේය.

3.1.5 මෙවැනි නිලධාරින්ට පත්වීම ලැබීමෙන් පසු රාජ්‍ය භාෂාවක ප්‍රවීණතාවය ලබා ගැනීම පිණිස මාස හයක කාලයක් සඳහා පූර්ණ වැටුප් සහිත පහසුකම් සැළසිය යුතුය. ඉන් අනතුරුව අදාළ ප්‍රවීණතා විභාගයට ඔහු පෙනී සිටිය යුතු අතර, එම විභාගයෙන් අසමත් වුවහොත් පූර්ණ වැටුප් සහිත මාස හයක කාල පරිච්ඡේදයෙන් පසු ඒ සමගම එළඹෙන අවුරුදු දෙකක කාල පරිච්ඡේදය තුළ තමාගේ සාමාන්‍ය රාජකාරිවල නිරත වෙමින් සිටිය දී විභාගයෙන් සමත්වීමට ඔහුට අවස්ථාව සලසා දෙනු ලැබේ.

3.1.6 නියමිත අවුරුදු දෙකහමාරක කාල පරිච්ඡේදය තුළ විභාගයෙන් සමත්වීමට නොහැකි වුවහොත් ඔහුගේ සේවය අවසන් කරනු ලැබේ.

3.1.7 රාජ්‍ය සේවයෙහි ස්ථිර තනතුරක දැනටමත් ස්ථිර කරනු ලැබ සිටින රාජ්‍ය නිලධාරියෙකු රාජ්‍ය සේවයෙහි වෙනත් ස්ථිර තනතුරකට පත් කරනු ලැබූ විට යළි පරිවාස කාලසීමාවක් සේවය කරන ලෙස සාමාන්‍යයෙන් ඔහුට නියම කරනු නොලැබේ. එවැනි නිලධාරියෙකු සිය නව තනතුරෙහි කරන සේවය පරීක්ෂා කර බැලීම සඳහා ප්‍රථමයෙන් එම තනතුරෙහි නියමිත කාල සීමාවක් වැඩ බැලීම සඳහා ඔහු පත් කරනු ලැබිය හැකිය.

3.1.8 (රාජ්‍ය සේවයෙහි දැනටමත් ස්ථිර/තාවකාලික තනතුරු දරන්නාවූද වෛද්‍ය පරීක්ෂණයකට භාජනය කරනු ලැබුවා වූ ද, අය හැර) තෝරාගනු ලැබූ අපේක්ෂකයන් දිවයිනේ ඕනෑම පෙදෙසක සේවය කිරීමට ශාරීරිකව සුදුසුද නැද්ද යනු පරීක්ෂා කිරීම පිණිස රජයේ වෛද්‍ය නිලධාරියෙකු විසින් පවත්වනු ලබන වෛද්‍ය පරීක්ෂණයකට ඉදිරිපත්වන ලෙස ඔවුනට නියම කරනු ඇත.

**4. සේවයට භාර ගැනීම පිළිබඳ කොන්දේසි :**

4.1 ස්ථිර හා විශ්‍රාම වැටුප් සහිත තනතුරුවලට පත් කරනු ලබන රාජ්‍ය නිලධාරින් විසින් ඔවුන්ගේ වැටුපෙන් අයකර ගතයුතු යයි රජය විසින් නියම කරනු ලබන ප්‍රතිශතක ප්‍රමාණයට සමාන මුදලක් ස්වකීය වැටුපෙන් වැන්දඹු සහ අනත්දරු විශ්‍රාම වැටුප් ක්‍රමයට දායක මුදල් වශයෙන් ගෙවිය යුතුය.

4.2 අර්ථසාධක අරමුදල් පදනම මත ස්ථිර හෝ තාවකාලික තනතුරුවලට පත්කරනු ලැබූ රාජ්‍ය නිලධාරින් ස්වකීය ඒකාබද්ධ වැටුපෙන් 6%ක් රාජ්‍ය සේවා අර්ථසාධක අරමුදලට දායක මුදල් වශයෙන් ගෙවිය යුතු වන්නේය. මුදල් වර්ෂය අවසානයේදී අනිවාර්ය දායක මුදල් වශයෙන් අරමුදලට බැරකර ඇති මුදල් ප්‍රමාණය මෙන් 150%ක මුදල් ප්‍රමාණයක් රජය විසින් එම අරමුදලට රජයේ දායක මුදල වශයෙන් ගෙවනු ඇත.

4.3 පළාත් පාලන සේවයේ විශ්‍රාම වැටුප් සහිත තනතුරුවලට මුදවා හරිනු ලබන රාජ්‍ය සේවයේ විශ්‍රාම වැටුප් සහිත තනතුරු උසුලන්නාවූ නිලධාරින් සහ රාජ්‍ය සේවයේ විශ්‍රාම වැටුප් සහිත තනතුරුවලට මුදවා හරිනු ලැබ පළාත් පාලන සේවයේ (විශ්‍රාම වැටුප් සහිත) තනතුරු උසුලන්නාවූ නිලධාරින් හට පිළිවෙලින් ඔවුන්ගේ පළාත් පාලන සේවයේ සහ රාජ්‍ය සේවයේ තනතුරු සහ විශ්‍රාම වැටුප් හිමිකම් දෙනු ලැබේ.

4.4 විශ්‍රාම වැටුප් ව්‍යවස්ථා සංග්‍රහය යටතේ රාජ්‍ය සේවයේ විශ්‍රාම වැටුප් සහිත තනතුරුවලට මුදලා හරිණු ලැබූ යුද්, නාවික සහ ගුවන් හමුදාවේ නිත්‍ය සේවයෙහි නියුතු පිරිසට ඔවුන්ගේ රාජ්‍ය සේවයෙහි තනතුරු සඳහා විශ්‍රාම වැටුප් හිමිකම් දෙනු ලැබේ. මෙම ව්‍යවස්ථා සංග්‍රහය යටතේ විශ්‍රාම වැටුප් සහිත බවට ප්‍රකාශිත තනතුරක රාජ්‍ය නිලධාරියෙක් ලෙස පත්වීමක් භාර ගැනීම සඳහා මුදා හරිණු ලැබූ සන්නද්ධ හමුදාව යම් සාමාජිකයෙකුගේ සම්පූර්ණ වැටුප් සහිත අහිමි නොවූ සේවා කාල සීමාව මේ ව්‍යවස්ථා සංග්‍රහයේ පටහැනිව කුමක් සඳහන්ව ඇත්ද, මේ ව්‍යවස්ථා සංග්‍රහය යටතේ ගෙවිය යුතු යම් විශ්‍රාම වැටුප් පාරිතෝෂිකයක කාර්යය සඳහා ගණන් ගත යුතුය.

**5. යුද්ධ සේවා අනුග්‍රහය :**

5.1 එක්සත් රාජ්‍ය යුද්ධාවතීරණ හමුදාවන්හි සේව මුක්ත හටයින් ද, සහය ගිනි නිවන, ගගන ප්‍රහාර නිවාරණ සහ මහජන ආරක්ෂක සේවාවන්හි පූර්ණකාලීන සාමාජිකයන් වශයෙන් නියුක්තව සිටි තමන්ගේම ඕනෑකමින් එම සේවාවන්ගෙන් අස්ව නොගිය අයටද ඉහත කී සියලු සුදුසුකම් තිබේ නම් ද ඔවුන් මෙම හමුදාවන්ට බැඳී ඇත්තේ 1954 අගෝස්තු මස 15 වැනි දිනට පෙරාතුව නම්ද, ඔවුන්ගේ එස සේවාවන් සතුටුදායක ලෙස සහ අඛණ්ඩව පැවතිණි නම්ද, වයස අතින් සුදුසුකම් ලබා ගැනීම සඳහා ඔවුන්ට තමන්ගේ වයස්වලින් 1939 සැප්තැම්බර් මස 3 වැනි දින සිට 1949 දෙසැම්බර් මස 31 වැනිදා දක්වා වූ කාල සීමාව තුළ තම තමන් සේවය කළ කාලයන් අඩුකර ගැනීමට ඉඩදෙනු ලැබේ.

**6. රාජ්‍ය සේවයෙහි දැනට සේවය කරන නිලධාරිහු :**

6.1 රාජ්‍ය සේවයෙහි දැනට සේවයෙහි යෙදී සිටින්නාවූත්, අවශ්‍ය සියලු සුදුසුකම් ඇත්තාවූත්, නිලධාරින් විසින් ඉදිරිපත් කරන අයදුම්පත් ඔවුන්ගේ, දෙපාර්තමේන්තු ප්‍රධානීන්ගේ මාර්ගයෙන් එවිය යුතුය. නව තනතුරු සඳහා ඉල්ලුම් කරන්නා වූ ද, රාජ්‍ය සේවයෙහි දැනට ස්ථිර තනතුරු දරන්නාවූ ද, නිලධාරින්ගෙන් යමෙකු නව තනතුරකට තෝරාගනු ලැබුවහොත් ඒ සඳහා ඔවුන් මුදවාලිය හැකි ද නොහැකිද යන්න එම නිලධාරින් සේවයෙහි යෙදී සිටින දෙපාර්තමේන්තුවල ප්‍රධානීන් විසින් ඔවුන්ගේ අයදුම්පත් ඉදිරිපත් කරන විට සඳහන් කළ යුතුය.

6.2 නියමිත වේලාවක නියමිත ස්ථානයක දී සම්මුඛ පරීක්ෂණයක් සඳහා පෙනී සිටින ලෙස අයදුම්කරුවන්ට නියම කරනු ලැබිය හැක. මේ සම්බන්ධයෙන් දැරීමට සිදුවන ගමන් වියදම් හෝ වෙනත් වියදම් ආදියත් ගෙවනු නොලැබේ.

6.3 යම්කිසි අයදුම්කරුවකු නිර්දේශ කිරීමට අදහස් කරන කෙනෙකු විසින් අයදුම්කරුට චරිත සහතිකයක් දීමෙන් එසේ කළ යුතුය. යම් අයදුම්කරුවකු තෝරා ගන්නා පරිද්දෙන් කවර අන්දමේ වුවද අයථා අනුග්‍රහයන් පැතීම හෝ එහිලා යම් බලපෑමක් කිරීමට තැත් කිරීම හෝ එම අයදුම්කරු නුසුදුස්සකු කරනු ලැබීමට හේතුවනු ඇත.

6.4 අයදුම්කරුගේ අයදුම්පතෙහි කිසියම් සාවද්‍ය ප්‍රකාශයක් තිබෙන බැව් ඔහු තෝරා ගැනීමට කළින් දැනට ගන්නට ලැබුණි නම් ඒ හේතුවෙන් ඔහු එම තනතුරට නුසුදුස්සකු බවට පත් කරනු ලැබීමටත් තෝරා ගැනීමෙන් පසු ඒ බව අනාවරණය වුණි නම් ඔහු රාජකාරියෙන් පහකරනු ලැබීමටත් ඉඩ තිබේ.

6.5 මෙම දැන්වීමෙහි සඳහන් වන නියමයන්ට සෑම අතින්ම අනුකූල නොවන අන්දමේ අයදුම්පත් ප්‍රතික්ෂේප කරනු ලැබේ.

**7. සුදුසුකම් පිළිබඳ අවශ්‍යතාවයන් සඳහා වැටුප් යන්නෙහි අර්ථ දැක්වීම :**

7.1 සුදුසුකම් පිළිබඳ අවශ්‍යතාවයන් සඳහා වැටුප යන්නෙන් අදහස් කෙරෙනුයේ ඒකාබද්ධ වැටුප පමණකි. වැඩ බැලීමේ වැටුපක් හෝ දීමනා ආදිය ඊට ඇතුළත් නොවන්නේය.

**8. බඳවා ගැනීම සහ උසස් කිරීම සම්බන්ධ නව ජාතික ප්‍රතිපත්තිය :**

පසුව නිකුත් කෙරෙන රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ මගින් සංශෝධනය කිරීමට යටත්ව 1990.08.09 දිනැති අංක 15/90, 1990.03.05 දිනැති අංක 15/90(I) සහ 1990.06.15 දිනැති අංක 15/90 (II) දරන රාජ්‍ය පරිපාලන චක්‍රලේඛවල දක්වා ඇති ප්‍රතිපත්තියට අනුකූලව රාජ්‍ය සේවයට, පළාත් රාජ්‍ය සේවයට රාජ්‍ය සංස්ථා අංශයට සහ රජයට සම්පූර්ණයෙන්ම අයත් සමාගම්වලට බඳවා ගැනීම සහ උසස් කිරීම 1990.01.01 දින සිට සිදුකරනු ඇත.

# විභාග අපේක්ෂකයන් සඳහා නීති සහ උපදෙස්

"1968 අංක 25 දරන විභාග පනතේ දක්වා ඇති විධිවිධානයන්ට අනුකූලව කටයුතු කිරීමට සියළුම විභාගාපේක්ෂකයින් බැඳී ඇත"

සියලුම විභාගාපේක්ෂකයින් පහත සඳහන් නීති පිළිපැදීමට බැඳී සිටිය යුතුය. මේ නීති කිසිවක් උල්ලංඝනය කරන විභාගාපේක්ෂකයෙකුට විභාග කොමසාරිස්ට අභිමත පරිදි පහත සඳහන් දඬුවම් එකක් හෝ ඊට වැඩි ගණනක් හෝ පමුණුවනු ලැබේ.

i. මුළු විභාගයම හෝ ඉන් කොටසකට හෝ නැතහොත් එක් විෂයයකට හෝ ඉන් කොටසට හෝ පෙනී සිටීම හෝ තහනම් කිරීම.
ii. විභාගයේ එක් විෂයයකට හෝ මුලු විභාගයටම හෝ නුසුදුස්සෙකු කිරීම.
iii. එක් අවුරුදු හෝ අවුරුදු දෙකකට හෝ කිසිම විභාගයකට පෙනී සිටීම තහනම් කිරීම.
iv. මුළු ජීවිත කාලයේම විභාගයකට පෙනී සිටීම තහනම් කිරීම.
v. සහතික පත්‍රය යම්කිසි කාල සීමාවක් තුළ තහනම් කිරීම.
vi. විභාගාපේක්ෂකයාගේ ක්‍රියා පරිපාටිය සම්බන්ධයෙන් ඔහු ගැන වග කිවයුත්තන්ට සැලකර සිටීම හෝ විභාගාපේක්ෂකයාගේ පොලීසියට භාරදීම හෝ ඔහුගේ ක්‍රියාව සම්බන්ධයෙන් පොලීසියට පැමිණිලි කිරිම.

විභාගයට කලින් හෝ විභාගය පවත්වාගෙන යන අතරතුරු හෝ විභාගයට පසුව හෝ කොයිම අවස්ථාවකදි වුවත් එවැනි විභාගපේක්ෂකයෙකු සම්බන්ධයෙන් ක්‍රියා කිරීමේ බලය විභාග කොමසාරිස් සතුවේ. ඒ සම්බන්ධයෙන් ඔහුගේ තීරණය අවසාන තීරණය වන්නේය. එහෙත් රජයේ සේවකයන් බඳවා ගැනීම සඳහා පවත්වනු ලබන විභාග පිළිබඳව විභාග කොමසාරිස්ගේ තීරණය රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ සමීක්ෂණයට යටතේ වන්නේය.

1. සියළුම විභාගාපේක්ෂකයන් විභාග ශාලාව තුළදීත් ඒ අසළදීත් විභාගශාලාධිපතින්ට ද, ඔහුගේ සහාකාරයින්ට ද, අනිකුත් විභාගාපේක්ෂකයින්ට ද බාධාවක් හෝ අවහිරයක් හෝ ඇති නොවන ලෙස ශාන්තදාන්තව හැසිරිය යුතුය. විභාග ශාලාවට ඇතුළු වන විටත්, ඉන් පිටවන විටත් ඉතා සන්සුන් ලීලාවෙන් හැසිරිය යුතුය.

2. විභාගාපේක්ෂකයෝ විභාගශාලාධිපතීන්ට කීකරු විය යුත්තාහ. එබැවින් ඔවුන් විභාගය පවත්වාගෙන යන අතරතුරත්, විභාගය පටන් ගැනීමට පෙරත්, විභාගය අවසන් වූ විගසත් විභාගශාලාධිපතින්ගේ හා ඔහුගේ සහකාරයන්ගේ උපදෙස් අනුව ක්‍රියා කළ යුතුය.

3. විභාගයේදී ප්‍රශ්න පත්‍රයකට උත්තර ලිවීම පටන්ගෙන පැය භාගයක් ගතවුවාට පසු මොනම කාරණයක් නිසාවත් විභාගාපේක්ෂකයෙකු විභාග ශාලාවට ඇතුලු කරගනු නොලැබේ. විභාගය පටන් ගෙන පැය භාගයක් ගතවන තුරු ප්‍රශ්න පත්‍රයට පෙනී සිටින අපේක්ෂකයෙකුට විභාග ශාලාවෙන් පිටවී යාම තහනම්ය. ප්‍රායෝගික පරීක්ෂණවලට හෝ වාචික පරීක්ෂණවලට පමාවී පැමිණෙන අපේක්ෂකයන් විභාග ශාලාවට ඇතුළු නොකිරීමට ඉඩ තිබේ.

4. සෑම විභාගාපේක්ෂකයෙකුම තමාගේ විභාග අංකය දරන ආසනයේ හැර වෙන කිසිම තැනක වාඩි නොවිය යුතුය. විභාශාලාධිපතිගේ විශේෂ අවසරය නොමැතිව තමන්ගේ ස්ථානය වෙනස් නොකළ යුතුයි. තමන්ට නියම නොකරන ලද අසුනක් ගැනීම වංචනික අදහසින් කරන ලද ක්‍රියාවක් වශයෙන් සලකනු ලැබීමට අවකාශයකි.

5. විභාග ශාලාව තුළ සම්පූර්ණයෙන්ම නිශ්ශබ්දව සිටිය යුතුය. මොනම කාරණයක් නිසාවත් විභාග ශාලාව ඇතුළත දි විභාග ශාලාවේ කාර්ය මණ්ඩලයේ කෙනෙකු සමග හැර, විභාග ශාලාව ඇතුළත හෝ පිටත හෝ සිටින කිසිවකු සමග මොනයම් කරුණක් නිසාවත් කතාබස් කිරිම හෝ පණිවුඩ හුවමාරු කර ගැනීම හෝ වෙනත් අන්දමේ ගනුදෙනු කිරීම හෝ සම්පූර්ණයෙන්ම තහනම්ය. යම් කිසි හදිසි වුවමනාවක් සඳහා කිසිවෙකු සමග කතාබස් කිරීම් ආදියත් අවශ්‍ය වුවහොත් ප්‍රථමයෙන් ඒ සඳහා විභාගශාලාධිපතින්ගේ අවසරය ලබා ගත යුතුයි.

6. විභාගාපේක්ෂකයෙකුගේ උත්තර පත්‍රය හඳුනාගනු ලබන්නේ ඔහුගේ විභාග අංකයෙන් පමණක් හෙයින් උත්තර පත්‍රවල තමන්ගේ නම නොලිය යුතුයි. තමාගේ උත්තර පත්‍රයෙහි අන්‍ය විභාගාපේක්ෂකයෙකුගේ විභාග අංකය ලිවීම වංචනික ක්‍රියාවක් කිරීමට ප්‍රයත්න දැරීමක් ලෙස සළකනු ලැබේ. හඳුනාගත නොහැකි පරිදි විභාග අංකය ලියා ඇති උත්තර පත්‍ර ප්‍රතික්ෂේප කිරීමටද සිදුවෙනවා ඇත.

7. තමන් වෙත සපයන ලද කඩදාසි හැර තීන්ත පොවන කඩදාසියෙහි හෝ ප්‍රශ්න පත්‍රයෙහි හෝ මේසය මත හෝ වෙන කිසි තැනක හෝ කිසිවක් නොලිය යුතුය. මේ නීතිය නොසැලකීම වංචනික චේතනාවකින් යුක්තව ක්‍රියා කිරීමකැයි සැළකිය හැකිවේ.

8. තමන් වෙත සපයන ලද කඩදාසියක් හෝ උත්තර ලියන පොතක් හෝ ඉරාදැමීම හෝ පොඩි කිරීම හෝ නමා දැමීම හෝ අකාමකා දැමීම හෝ නොකළ යුතුය. කටුවැඩ ආදිය සඳහා පාවිච්චි කරන ලද සෑම කඩදාසියක්ම උත්තර පත්‍රයට ඇමිණිය යුතුය. ඒවා උත්තර පත්‍රයෙහිම කොටසක් විය යුතුය. (එබඳු කටුවැඩ පැහැදිලි ලෙස කපා හැරිය යුතුයි. විභාග ශාලාවේදී ලියන ලද කියන

9. ගණිත ප්‍රශ්නවලදී ගණන් වරදවා සාදා හෝ ගණනක් කොහෙත්ම නොසාදා හෝ නිවැරදි පිළිතුරු දැක්වීමක් චිත්‍ර කර්මයේදී තමන්ගේ චිත්‍රය තවත් අපේක්ෂකයෙකුගේ චිත්‍රයට ආකල්ප මාත්‍රයෙන් හෝ ස්වරූපයෙන් හෝ ක්‍රියාකාරිත්වයෙන් හෝ යනාදියකින් සමානව, එසේ නැතිනම් බොහෝ සෙයින්ම කිට්ටුවම තිබීමත්, වංචා සහගත ක්‍රියාවක් සේ සළකනු ලැබීමට හේතු විය හැකිය.

10. විභාගයේදි උත්තර ලිවීම සඳහා තමන්ට සපයනු ලබන කඩදාසි හෝ වෙනත් ද්‍රව්‍ය විභාග ශාලාවෙන් පිටතට ගෙනයාම තහනම්ය. මේ සියලුම දෑ විභාග කොමසාරිස් සතුය. මේ නීතිය කඩකිරීම වංචනික චේතනාවකින් යුත් ක්‍රියාවක් ලෙස සැළකීමට හේතු විය හැකිය.

11. තමන් වෙත සපයන ලද ලිපි ද්‍රව්‍ය හැර වෙනත් පොත්පත්, සටහන් පොත්, සාක්කුවේ පාවිච්චි කරන නෝට් පොත්, ඇක්සයිස් පොත් හා කඩදාසි කොල හෝ කැබලි ද, තමන්ගේ පාට පෙට්ටි හා පාර්සල් ආදිය ද, පයිල් කවර, කාඩ්බෝඩ් පෑඩ්, නැවූ ප්‍රවෘත්ති පත්‍ර, බ්‍රවුන් පේපර් යනාදිය ද, විභාග ශාලාව තුළ සිටින කිසි විටෙක තමා වෙත සමීපයෙහි හෝ තබා නොගත යුතුය. මේ නීතිය කඩ කිරීම දඬුවම් ලැබිය හැකි ක්‍රියාවකි.

12. විභාග ශාලාව තුළ කිසිම අපේක්ෂකයෙකු අත කිසිම පොත් පතක් හෝ සටහන් පොතක් හෝ සටහන් ලියන කඩදාසියක් හෝ තබා ගැනීම සම්පූර්ණයෙන්ම තහනම් ය. විභාගශාලාධිපතීන් නියම කළහොත් සෑම අපේක්ෂකයාම තමන් සන්තකව තිබෙන දෑ මේ මේ යයි සහතික කිරීමට බැඳී සිටි. මේ අවශ්‍යතා කඩකිරීම වංචා සහගත ක්‍රියාවක් කිරීමට යත්න දැරීමක් ලෙස සළකනු ලැබේ.

13. වෙනත් අපේක්ෂකයෙකුගේ උත්තර පත්‍රයකින් හෝ පොත පතකින් හෝ පත්‍රයකින් හෝ සටහන් සහිත කොලයකින් හෝ වෙන කිසිවකින් හෝ ගෙන හොර උත්තර ලිවීම හෙවත් කොපි කිරීම හොර උත්තර ලීවීමට ද, යන්න දැරීම තහනම් ය. තවත් අපේක්ෂකයෙකුගේ උත්තර පත්‍රයක් දෙස බැලීම ද නොකළ යුතුය. වෙන අයදුම්කරුවෙකුට උදව් දීමෙන් ද, වෙන අයදුම්කරුවෙකුගෙන් හෝ පුද්ගලයෙකුගෙන් හෝ උදව් ලබා ගැනීමෙන් ද සම්පූර්ණයෙන්ම වැළකිය යුතුය. උත්තර ලියා සම්පූර්ණ වූ සෑම කඩදාසියක්ම ලියමින් සිටින කඩදාසි යට තබා ගත යුතුය. ලියන කඩදාසි මේසය මත විසුරුවා නොදැමිය යුතුය.

14. ප්‍රශ්න පත්‍රයකට උත්තර ලියන අතරතුර මොනම කරුණක් නිසාවත් ස්වල්ප වේලාවකටවත් විභාග ශාලාවෙන් පිටවී යාමට කිසිම අපේක්ෂකයෙකුට ඉඩදෙනු නොලැබේ. එහෙත් යම්කිසි හදිසි කරුණක් නිසා විභාගාපේක්ෂකයෙකුට ඉන් පිටත යන්නට උවමනා වුවහොත් විභාග ශාලාධිපතිගේ සහකාර නිලධාරියෙකුගේ සුපරීක්ෂාව යටතේ විභාග ශාලාවෙන් ඔහුට ස්වල්ප වේලාවකට පිටතට යාමට අවසර දෙනු ලැබේ. එසේ පිටතට යාමට පෙරත් නැවත විභාග ශාලාවට ඇතුළු වන විටත් ඔහු සෝදිසියකට භාජනය විය යුතුය.

15. විභාග ශාලාවේදී පිළිතුරු පිළිතුරු ලියන විට විභාගය පටන් ගැනීමට පෙර හෝ නියම විභාග අපේක්ෂකයකු වෙනුවට ව්‍යාජ අපේක්ෂකයෙකු පෙනී සිටීම දඬුවම් ලැබිය යුතු ක්‍රියාවකි. අනන්‍යතා පත්‍ර වෙනස් කිරීම හෝ බොරු අනන්‍යතා පත්‍ර ඉදිරිපත් කිරීමත් කෙනෙකුගේ අනන්‍යතා සහතිකයේ වෙනස් කිරීමක් එබඳු වරදවල් ය. විභාගාපේක්ෂකයන් එවැනි වරදට අසු නොවිය යුතුය.

16. විභාග අපේක්ෂකයෙකු නොවන අයෙක් කිසිම අපේක්ෂකයෙකුට අයථා අන්දමින් වංචා සහගත ලෙස උදව් දීම බරපතල වරදක් ලෙස සළකනු ලැබේ.

විභාග අපේක්ෂකයන් විසින් තමන්ගේ පරෙස්සම සඳහා පහත සඳහන් උපදෙස් අනුව ක්‍රියා කළ යුතුය.

i. විභාගය පටන් ගන්නා නියමිත වේලාවට සෑහෙන පමණ කලින් විභාග ශාලාවට පැමිණෙන්න. එක් එක් ප්‍රශ්න පත්‍රය පටන් ගැනීමට නියමිත වේලාවට යටතේ පිරිසෙයින් විනාඩි 10කට හෝ 15කට කලින් විභාග ශාලාවට පැමිණ සිටීම සෑහේ. විභාග ශාලාව පිහිටා ඇති ස්ථානය හරිහැටි නොදත් විට විභාගය පටන් ගන්නා දිනයට කලින් ඒ ගැන සොයා බලා නියම ස්ථානය හරි හැටි දැන සිටිය යුතුය.

ii. යම්කිසි විෂයයකට ඇතුළත්වීම ගැන හෝ යම් විෂයයකට පෙනී සිටීමට ඇති සුදුසුකම් ගැන හෝ සැකයක් ඇති වූ විට එම ප්‍රශ්න පත්‍රයට පිළිතුරු සැපයීමට පටන් ගැනීමට පෙර විභාගශාලාධිපතින්ට ඒ බැව් සැළකර එම සැකය දුරුකර ගත යුතුයි. එලෙස ක්‍රියා නොකිරීම එම විෂයය හෝ විෂයයන් සම්බන්ධයෙන් තමන්ගේ විභාගපේක්ෂකත්වය අවලංගුවී යාමට හේතු විය හැකිය.

iii. විභාගයට පෙනී සිටීමේදී අපේක්ෂකයන් සෑම විෂයයකටම පෙනී සිටින විට අනන්‍යතා පත්‍ර ඉදිරිපත් කළ යුතුය. අනන්‍යතාවය ඔප්පු කිරීම සඳහා අවශ්‍ය ලියවිලි විභාග ශාලාවේදී ඉදිරිපත් නොකළහොත් ඔහුගේ විභාගාපේක්ෂකත්වය අවලංගු කිරීමට ඉඩ තිබේ. යම් හෙයකින් ඒ සඳහා අවශ්‍ය ලියවිලි විභාගශාලාවට ගෙන ඒමට අමතක වුවහොත් ඒ බැව් විභාගශාලාධිපතින්නට දන්වා විභාග අවසන් වීමට පෙර එය ඉදිරිපත් කිරීමට මං සළසා ගත යුතුය.

iv. විභාගය සඳහා සාමාන්‍යයෙන් සම්මත වර්ගයකට අයත් ලිපි ද්‍රව්‍ය (එනම්, ලියන කඩදාසි, තීන්ත පොවන කඩදාසි, ලැජර් කඩදාසි, සාරාංශ ලියන කඩදාසි) ආදිය සපයනු ලැබේ. සාමාන්‍යයෙන් කාටත් බෙදා දෙන වර්ගයකට වෙනස් වූ හෝ අමුතු මෝස්තරයක ලිපි ද්‍රව්‍ය ඔබට ලැබුණහොත් ඒ බව නොපමාව විභාගශාලාධිපතිට දැන්විය යුතුයි. විභාග ශාලාවේදී ඔබට දෙනු ලබන කඩදාසි හැර වෙන මොනම කඩදාසියක්වත් ප්‍රශ්නවලට උත්තර ලිවීම සඳහා පාවිච්චි නොකළ යුතුයි. ඉතිරි වන කඩදාසි සහ වෙනත් ද්‍රව්‍ය අපිරිසිදු නොකර නැවත ප්‍රයෝජනයට ගත හැකි වන සේ ඔබගේ ලියන මේසය මත තබන්න. ඔබට ලඝුගණක චක්‍ර සපයන ලද නම් ඒවා පරිස්සමින් පාවිච්චි කොට ඔබේ ලියන මේසය මත තිබෙන්නට හැරිය යුතුය.

v. විභාගාපේක්ෂකයන් තම තමන්ගේ පෑන්, පැන්සල්, තීන්ත කුඩු, මකන, රෙදි කෑළි, අඩිකෝදු, ජ්‍යාමිතික උපකරණ, පාට පැන්සල් පෙට්ටි, පාට හුණු පෙට්ටි යනාදිය රැගෙන ආ යුතුයි.

vi. තමන් පාවිච්චි කරන සෑම කඩදාසියකම පිළිතුරු ලිවීමට පටන් ගැනීමේදී නොපමාව තන්ගේ විභාග අංකය හා විභාගයේ නමත් පැහැදිලි ලෙස ලියන්න. කඩදාසියේ දෙපැත්තේම පැහැදිලිව ද පිරිසිදුව ද උත්තර ලියන්න. ප්‍රශ්නයක කොටසකට උත්තර ලිවීමෙන් පසු අනික් කොටස පටන් ගැනීමට පෙර එක රූලක්වත් හිස්ව තිබිය යුතුයි. සම්පූර්ණ ප්‍රශ්නයකට උත්තර ලිවීමෙන් පසු රූලක් හෝ රූල් කීපයක් හෝ හිස්ව තබන්න. ලියන සෑම දෙයක්ම එක ගොඩේ තෝරා බේරා ගන්නට නොහැකි ලෙස නොලිය යුතුයි.

vii. උත්තර ලියන කඩදාසියෙහි වම් පැත්තේ තිරය වෙන්කර ඇත්තේ ප්‍රශ්නවල අංක ලිවීම සඳහා ය. දකුණු පැත්තේ තීරය වෙන්කර ඇත්තේ පරීක්ෂකවරයාගේ ප්‍රයෝජනය සඳහා බැවින් එහි කිසිවක් නොලිවිය යුතුයි. තමන් විසින් උත්තර ලියන ලද ප්‍රශ්නවල අංක වරදවා යෙදීම ව්‍යාකූලත්වයට හේතුවන බැවින් ප්‍රශ්න අංක ඉතා පරෙස්සමින් නිවැරදි ලෙස යෙදිය යුතුය.

viii. අනිවාර්ය ප්‍රශ්න ද, තෝරා ගත යුතු අන් ප්‍රශ්න ද සම්බන්ධව ප්‍රශ්න පත්‍රයේ මුලින්ම සඳහන් කොට ඇති උපදෙස් ඉතා පරෙස්සමින් නිවැරදි ලෙස යෙදිය යුතුය.

ix. ගණිත ප්‍රශ්නවලට උත්තර සපයන විට ගැන බැලීම සහ කටුවැඩ ඒ ඒ ගණන් සෑදීමේ කොටසක් වශයෙන් අනුක්‍රමයෙන් විස්තර ලෙස දැක්විය යුතුය. අවශ්‍ය තැන්වල අඳිනු ලබන රූප සටහන් හා චිත්‍ර ආදිය නිවැරදිව සෑහෙන පමණ විශාලවද තිබිය යුතුයි. පිටු කීපයකට යන දිග පිළිතුරුවලදී එක පිටුවක අඳින ලද රූප සටහන් සම්බන්ධයෙන් ඊළඟ පිටුවලදීත් සිත් යොමුකර විය යුතු අවස්ථාවලදීත් ඒ රූප සටහන් නැවතත් ඇඳ පෙන්වීම යෝග්‍ය වේ.

x. එක් එක් ප්‍රශ්න පත්‍රයට පිළිතුරු සපයා අවසන් වූ විට උත්තර ලියන ලද කඩදාසි සියල්ලම ප්‍රශ්නවලට උත්තර ලියූ පිළිවෙල අනුව එකතුකොට වම් පැත්තේ ඉහළ කෙළවරේ තමන්ට සපයන ලද නූල් කැබැල්ලෙන් නොගැලවී යන පරිදි එකට තබා අමුණා ගැටගසන්න. දකුණු පැත්තේ උඩ කෙළවරවල් එකට තබා ගැට නොගසන්න.

xi. ඔබගේ උත්තර පත්‍රය විභාගශාලාධිපතින්ට හෝ ඔවුන්ගේ සහකාර මහතකුට හෝ සියතින්ම භාරදිය යුතුය. නැතහොත් ඒවා එකතු කරන තුරු ඔබේ අසුනේම වාඩිවී සිටිය යුතුය. මෙසේ නොකිරීම ඇතැම් විට ඔබගේ උත්තර පත්‍රය නැතිවී යාමටද ඔබ යම් විෂයයකට ඉදිරිපත් නොවුවකු සේ සලකණු ලැබීමටද හේතු විය හැකිය. මොනම කරුණක් නිසාවත් ඔබගේ උත්තර පත්‍රය විභාග ශාලාවේ සේවය කරන පියන් කෙනෙකුට හෝ වෙනයම් සේවකයකුට හෝ බාර නොදිය යුතුය.

xii. යම්කිසි කරුණක් නිසා විභාග ශාලාධිපතින්ට හෝ ඔහුගේ සහකාර මහතෙකුට හෝ කථා කිරීමට අවශ්‍ය වූ විටද කඩදාසි ආදිය අවශ්‍ය වූ විටද තම ආසනයෙන් නොනැගිට අත පමණක් එසවිය යුතුය.

**විභාග කොමසාරිස් ජනරාල්.**

ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව,
පැලවත්ත,
බත්තරමුල්ල.

# තනතුරු - ඇබෑර්තු

**රෙජිස්ට්‍රාර් ජනරාල් දෙපාර්තමේන්තුව**

විවාහ, උප්පැන්න හා මරණ ලියාපදිංචි කිරීමේ රෙජිස්ට්‍රාර් තනතුරු — කෑගල්ල දිස්ත්‍රික්කය

මෙහි පහත උපලේඛනයේ සඳහන් කොට්ඨාසවල ඇති විවාහ, උප්පැන්න සහ මරණ ලියාපදිංචි කිරීමේ රෙජිස්ට්‍රාර් තනතුරු සඳහා ඉල්ලුම්පත් කැඳවනු ලැබේ.

02. ඉල්ලුම්කරුවන් අදාළ උප්පැන්න හා මරණ ලියාපදිංචි කිරීමේ කොට්ඨාස තුළ ස්ථිර පදිංචියක් ඇත්තා වූ හා සැහෙන දේපළක් හිමි ප්‍රදේශ වාසීන්ගේ සැලකිල්ල ලබන අය ද විය යුතුය.

03. මෙම තනතුරු සඳහා ස්ත්‍රී/පුරුෂ දෙපක්ෂයටම ඉල්ලුම් කළ හැකිය.

04. ඉල්ලුම්කරුවන්ගේ වයස අවුරුදු 21 ට අඩු නොවිය යුතු අතර, අවුරුදු 65 ට වැඩි නොවිය යුතුය.

05. ඉල්ලුම්කරුවන් විවාහක අය විය යුතුය.

06. අධ්‍යාපන හා අනෙකුත් සුදුසුකම් ආදිය පිළිබඳ අමතර විස්තර අදාළ දිස්ත්‍රික් ලේකම් කාර්යාල, ඉඩම් හා දිස්ත්‍රික් රෙජිස්ට්‍රාර් කාර්යාල, ප්‍රාදේශීය ලේකම් කාර්යාල, ග්‍රාම නිලධාරි කාර්යාල, ග්‍රාම සංවර්ධන සමිති සහ සමුපකාර සමිති ආදී කොට්ඨාසයේ ප්‍රසිද්ධ ස්ථානවල ප්‍රදර්ශනය කර ඇති දැන්වීම්වලින් බලාගත හැකිය.

07. මේ සඳහා අවශ්‍ය ඉල්ලුම්පත් අදාළ දිස්ත්‍රික්කයේ දිස්ත්‍රික් ලේකම් (දිසාපති) කාර්යාලයෙන් සහ ඉඩම් සහ දිස්ත්‍රික් රෙජිස්ට්‍රාර් කාර්යාලයෙන් ලබාගත හැක.

08. සම්පූර්ණ කරන ලද ඉල්ලුම්පත් 2009 නොවැම්බර් මස 13 වැනි දින හෝ එදිනට පෙර උපලේඛනයේ සඳහන් ලිපිනයට ලැබෙන සේ ලියාපදිංචි තැපැල් මගින් යැවිය යුතුය.

ඊ. එම්. ගුණසේකර,
රෙජිස්ට්‍රාර් ජනරාල්.

2009 සැප්තැම්බර් මස 16 වැනි දින,
බත්තරමුල්ල, ඩෙන්සිල් කොබ්බෑකඩුව මාවත,
අංක 234/A3, රෙජිස්ට්‍රාර් ජනරාල් දෙපාර්තමේන්තුවේ දී ය.

**උපලේඛනය**

| *දිස්ත්‍රික්කය* | *ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසය* | *ඉල්ලුම්පත් කැඳවන කොට්ඨාසය හා තනතුර* | *ඉල්ලුම්පත් එවිය යුතු ලිපිනය* |
|---|---|---|---|
| කෑගල්ල | කෑගල්ල | කෑගල්ල නගර කොට්ඨාසයේ උප්පැන්න හා මරණ වෛද්‍ය රෙජිස්ට්‍රාර් ධුරය | දිස්ත්‍රික් ලේකම්/ අතිරේක රෙජිස්ට්‍රාර් ජනරාල්, දිස්ත්‍රික් ලේකම් කාර්යාලය, කෑගල්ල. |

10-429

# විභාග, විභාග ප්‍රතිඵල ආදිය

**ශ්‍රී ලංකා සමෘද්ධි අධිකාරියේ VI වැනි ශ්‍රේණියේ සමෘද්ධි කළමනාකරුවන්, V වැනි ශ්‍රේණියට උසස් කිරීම සඳහා වන තරග විභාගය - 2009**

01. ශ්‍රී ලංකා සමෘද්ධි අධිකාරියේ VI වැනි ශ්‍රේණියේ සමෘද්ධි කළමනාකරුවන් ලෙස වසර 06ක සේවා කාලයක් ඇති සමෘද්ධි කළමනාකරුවන් V වැනි ශ්‍රේණියට උසස් කිරීම සඳහා වන තරග විභාගය, විභාග කොමසාරිස් ජනරාල් විසින් කොළඹ දී 2009 දෙසැම්බර් මස පවත්වනු ලැබේ.

02. විභාගය ප්‍රශ්න පත්‍ර 03කින් සමන්විත වේ.

2.1 බුද්ධි පරීක්ෂණය හා අවබෝධය :
විභාග අපේක්ෂකයින්ගේ අවබෝධ කරගැනීමේ හැකියාව, තර්කානුකූල බුද්ධිය හා ක්ෂණිකව සිතීමේ හැකියාව පිළිබඳව සොයා බලන ප්‍රශ්න පත්‍රයකි.

- ලකුණු 100 යි.
- කාලය පැය 1 1/2 යි.
- සමත්වීම සඳහා ගතයුතු අවම ලකුණු 40% කි.

2.2 ගම නැගුම හා සමෘද්ධි විෂයය පිළිබඳ දැනීම :

මේ සඳහා අදාළ ප්‍රශ්න පත්‍රය කොටස් කිහිපයකින් ( A, B, C, D හා E වශයෙන්) පැවැත්විය යුතු අතර ප්‍රශ්න පත්‍රයේ පළමුවැනි කොටස සෑම සමෘද්ධි කළමනාකරුවෙකුම පොදුවේ පිළිතුරු සැපයිය හැකි සමෘද්ධි වැඩසටහන හා ගම නැගුම වැඩසටහන හා ඊට ආශ්‍රිත පොදු කරුණු ඇතුළත්ව සැකසුනු ප්‍රශ්න පත්‍රයකි.

ප්‍රශ්න පත්‍රයේ සෙසු කොටස් තෝරාගෙන පිළිතුරු සැපයිය හැකි ආකාරයේ විය යුතු අතර එම එක් එක් කොටස් මහා සංගම්, බැංකු සංගම්, කළමනාකරුවන්, ව්‍යාපෘති කළමනාකරුවන්, මූලස්ථාන කළමනාකරුවන්, දිස්ත්‍රික් හා ප්‍රාදේශීය ලේකම් කාර්යාලවල කළමනාකරුවන් සහ ප්‍රධාන කාර්යාලීය කළමනාකරුවන් වෙනුවෙන් ඔවුන් ඉටු කරනු ලබන රාජකාරි හා විෂය දැනුම ආශ්‍රිතව සැකසුනු ප්‍රශ්න පත්‍රයකි.

- ලකුණු 100 යි.
- කාලය පැය 1 1/2 යි.
- සමත්වීම සඳහා ගතයුතු අවම ලකුණු 40% කි.

2.3 මුදල් රෙගුලාසි, ආයතන සංග්‍රහය හා වෙනත් අදාළ පනත් පිළිබඳ දැනුම හා සාමාන්‍ය දැනීමේ ප්‍රශ්න පත්‍රය

මෙහිදී ආයතන සංග්‍රහය, මුදල් රෙගුලාසි හා අදාළ පනත්වල තෝරාගත් පරිච්ඡේදයන් පිළිබඳව කළමනාකරුවන්ගේ සාමාන්‍ය දැනීම මැන බලන ප්‍රශ්න පත්‍රයකි. එම තෝරාගත් පරිච්ඡේදවලට ආයතන

සංග්‍රහයේ I, II, III, IV, VII, XII, XIV, XV, XXV පරිච්ඡේද හා මුදල් රෙගුලාසි I, II, III, XIII යන පරිච්ඡේද ඇතුළත් විය යුතුය.

- ලකුණු 100 යි.
- කාලය පැය 1 1/2 යි.
- සමත්වීම සඳහා ගතයුතු අවම ලකුණු 40% කි.

03. මෙම පරීක්ෂණය සිංහල හා දෙමළ මාධ්‍යවලින් පමණක් පවත්වනු ලැබේ. පරීක්ෂණ සඳහා ඉල්ලුම් කිරීමේ ආදර්ශ අයැදුම්පත්‍රයක් මෙම නිවේදනය අවසානයේ පළකර ඇත. එම ආදර්ශ අයැදුම්පත්‍රය අනුව අපේක්ෂකයින් විසින් ස්වකීය අයැදුම්පත්‍ර පිළියෙල කරගත යුතුයි. අයැදුම්පත්‍රය පිළියෙල කර ගත යුත්තේ ඒ 4 ප්‍රමාණයේ කඩදාසියක පමණි. අයැදුම්පත්‍රය සම්පූර්ණ කළ යුත්තේ අපේක්ෂකයා විභාගයට ඉදිරිපත් වන භාෂා මාධ්‍යයෙන් ය. ඉල්ලුම් කරන මාධ්‍යය පසුව වෙනස් කිරීමට ඉඩ දෙනු නොලැබේ. ඉල්ලුම්පත්‍රයේ ශීර්ෂ අංක 1.0 සිට 4.0 තෙක් පළමුවැනි පිටුවට ද ඉතිරිය 2 වැනි පිටුවට ද වන ලෙස ගෙන සකස් කළයුතු අතර ඊට අදාළ තොරතුරු තම අත් අකුරින් ම පැහැදිලි ව ඇතුළත් කළ යුතුය. ආදර්ශ ඉල්ලුම්පත්‍රයට අනුකූල නොවන ඉල්ලුම්පත්‍රත්, අසම්පූර්ණ ලෙස තොරතුරු සඳහන් කර ඇති ඉල්ලුම්පත්‍රත් දැනුම් දීමකින් තොරව ප්‍රතික්ෂේප කරනු ලැබේ. එම ඉල්ලුම්පත්‍රයේ ඡායා පිටපතක් ළඟ තබා ගැනීම ප්‍රයෝජනවත් වනු ඇත. ඉල්ලුම්පත්‍රය පිළියෙල කරගන්නා විට එහි ශීර්ෂයේ සඳහන් විභාගයේ නම සිංහල ඉල්ලුම්පත්‍රවල සිංහලට අමතරව ඉංග්‍රීසියෙන් ද, දෙමළ ඉල්ලුම්පත්‍රවල දෙමළට අමතරව ඉංග්‍රීසියෙන් ද යෙදිය යුතුය.

04. අයැදුම්පත්‍රය තම අංශ ප්‍රධානියා මගින් (දිස්ත්‍රික් ලේකම්/ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයකට අනුයුක්ත වන්නේ නම් එහි දිස්ත්‍රික් ලේකම්/දිස්ත්‍රික් සමෘද්ධි අධ්‍යක්ෂ, ප්‍රාදේශීය ලේකම්/නියෝජ්‍ය සමෘද්ධි අධ්‍යක්ෂ මගින්) 2009.11.13 දිනට හෝ ඊට පෙර නියෝජ්‍ය විභාග කොමසාරිස්, ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව, සංවිධාන හා විදේශ විභාග ශාඛාව, පැලවත්ත, බත්තරමුල්ල යන ලිපිනයට ලැබෙන සේ ලියාපදිංචි තැපෑලෙන් එවිය යුතුය. අයැදුම්පත්‍රය බහා එවන කවරයේ වමත්පස ඉහළ කෙළවරේ අයැදුම්කරන විභාගයේ නම සඳහන් කළ යුතුය. විභාගය සඳහා වූ අයැදුම්පත් භාරගන්නා අවසාන දිනට පසුව ලැබෙන අයැදුම්පත්‍ර ප්‍රතික්ෂේප කරනු ලැබේ.

05. අයැදුම්කරුවන් වෙත ප්‍රවේශ පත්‍ර නිකුත් කළ වහාම ඒ බව සඳහන් කරමින් පුවත්පත් නිවේදනයක් ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව මගින් පළ කරනු ඇත. නිවේදනය පළවී දින 2 ක් හෝ 3 ක් ගතවූ පසුවත් ප්‍රවේශ පත්‍රය නොලැබුණි නම් දැන්වීමේ සඳහන් ආකාරයට ඒ පිළිබඳව ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව වෙත දන්වා සිටිය යුතුයි. ඔබ වෙත තබාගත් අයැදුම් පත්‍රයේ සහතික කළ ඡායා පිටපත් ද, ලියාපදිංචි කළ කුවිතාන්සිය ද, කොළඹින් බැහැර ප්‍රදේශයක නම් ප්‍රවේශපත්‍රය එවීම සඳහා ෆැක්ස් අංකයක් ද සඳහන් ඔබගේ ඉල්ලීම් ලිපිය ද ළඟ තබාගෙන ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව වෙත දැන්වීම වඩාත් ඵලදායි වනු ඇත.

06. අපේක්ෂකයින් විභාග ශාලාව තුළදී තමන් පෙනී සිටින සෑම විෂයක් සඳහාම විභාග ශාලාධිපතිවරයා සෑහීමකට පත්වන පරිදි ස්වකීය අනන්‍යතාව සනාථ කළ යුතුය. ඒ සඳහා පහත සඳහන් ලියවිලි අතරින් එකක් පමණක් පිළිගැනේ :-

1. පුද්ගලයින් ලියාපදිංචි කිරීමේ කොමසාරිස් විසින් නිකුත් කරන ලද ජාතික හැඳුනුම්පත්‍රය
2. වලංගු විදේශ ගමන් බලපත්‍රය (පාස්පෝට් බලපත්‍රය)

07. මෙම විභාග පැවැත්වීම සම්බන්ධයෙන් විභාග කොමසාරිස් ජනරාල් විසින් පනවනු ලබන නීතිරීතිවලට විභාග අපේක්ෂකයින් යටත් වේ. එම නීතිරීති උල්ලංඝනය කළහොත් විභාග කොමසාරිස් ජනරාල් විසින් පනවනු ලබන දඬුවමකට යටත් වීමට ඔහුට හෝ ඇයට සිදුවනු ඇත. අපේක්ෂකයකුට විභාග ප්‍රවේශ පත්‍රයක් නිකුත් කිරීම ඔහු හෝ ඇය විභාගයට ඉදිරිපත් වීමට සුදුසුකම් සපුරා ඇති බවට පිළිගැනීමක් ලෙස නොසැලකිය යුතු ය.

08. මෙම විභාගයට පෙනී සිටීමට අයැදුම්පත්‍ර එවා ඇති සියලු දෙනාට විභාග කොමසාරිස් ජනරාල් විසින් ප්‍රවේශපත්‍ර නිකුත් කරනු ලබන අතර, විභාගයට පෙනී සිටීම සඳහා ඔවුන්ට තමන්ගේ කාර්යාල භාර ප්‍රධානීන් විසින් රාජකාරි නිවාඩු ලබාදෙනු ඇත. විභාගය ආරම්භ වන දින තම අත්සන් සහතික කරවාගත් ප්‍රවේශ පත්‍රය ශාලාධිපති වෙත ඉදිරිපත් කළ යුතු ය.

09. මෙම රෙගුලාසිවලට අඩංගු නොවූ යම් කරුණක් වේතොත්, ශ්‍රී ලංකා සමෘද්ධි අධිකාරියේ අධ්‍යක්ෂ මණ්ඩලයේ අභිමතය පරිදි ඒ ගැන ක්‍රියා කරනු ඇත.

ආර්. පී. බී. තිලකසිරි,  
අධ්‍යක්ෂ ජනරාල්,  
ශ්‍රී ලංකා සමෘද්ධි අධිකාරිය.

04 වැනි මහල,  
සෙත්සිරිපාය,  
බත්තරමුල්ල.

## ශ්‍රී ලංකා සමෘද්ධි අධිකාරියේ VI වැනි ශ්‍රේණියේ සමෘද්ධි කළමනාකරුවන් V වැනි ශ්‍රේණියට උසස් කිරීම සඳහා වන තරග විභාගය - 2009

## Competitive Examination for Promotion of Grade VI Samurdhi Managers to Grade V - 2009

විභාගයට පෙනී සිටින භාෂා මාධ්‍යය ☐  
සිංහල - 02 (අදාළ අංකය කොටුව  
දෙමළ - 03 තුළ ලියන්න)

☐  
කාර්යාලීය ප්‍රයෝජනය සඳහා

1.0 නම :———.

1.1 මුලකුරු අගට යොදා මුලකුරු සමග නම :———.  
(ඉංග්‍රීසි කැපිටල් අකුරෙන්)  
උදා : Nimal, J. M. D.

1.2 සම්පූර්ණ නම :———.  
(ඉංග්‍රීසි කැපිටල් අකුරෙන්)

1.3 සම්පූර්ණ නම :———.  
(සිංහලෙන්/දෙමළෙන්)

2.0 රාජකාරි ලිපිනය :———.  
(ඉංග්‍රීසි කැපිටල් අකුරෙන්)  
(ප්‍රවේශ පත්‍ර මෙම ලිපිනයට තැපැල් කරනු ඇත)

2.1 ස්ථිර ලිපිනය :———.  
(සිංහලෙන්/දෙමළෙන්)

3.0 ස්ත්‍රී/පුරුෂ භාවය :———.

3.1 ස්ත්‍රී - 1, පුරුෂ - 0 ☐

අදාළ අංකය කොටුව තුළ ලියන්න.

3.2 විවාහක/අවිවාහක බව  
අවිවාහක - 1 විවාහක - 2 ☐

අදාළ අංකය කොටුව තුළ ලියන්න.

3.3 උපන් දිනය : වර්ෂය | | | | | මාසය | | | දිනය | | |

3.4 ඉල්ලුම්පත්‍ර භාරගන්නා අවසාන දිනට වයස :

අවු. | | | මාස | | | දින | | |

4.0 ජාතික හැඳුනුම්පත් අංකය : | | | | | | | | | | |

5.0 තනතුර හා ශ්‍රේණිය :

ඉහත දැක්වෙන කරුණු නිවැරදි බවත්, ඉල්ලුම්කර ඇති භාෂා මාධ්‍යයෙන් මෙම විභාගයට පෙනී සිටීමට හිමිකම් ඇති බවත් ප්‍රකාශ කරමි. තවද විභාගය පැවැත්වීම සම්බන්ධයෙන් විභාග කොමසාරිස් ජනරාල් විසින් පනවනු ලබන නීතිරීතිවලට මම යටත් වන බව ද ප්‍රකාශ කරමි.

————.
අපේක්ෂකයාගේ අත්සන

දිනය :————.

විභාග කොමසාරිස් ජනරාල්,

ඉදිරිපත් කරමි.

ඉහත විස්තර දැක්වෙන අපේක්ෂකයාට/අපේක්ෂිකාවට මෙම විභාගයට පෙනී සිටීමට සුදුසුකම් ඇති බවත්, ඔහු/ඇය විසින් දක්වා ඇති භාෂා මාධ්‍යයෙන් මෙම විභාගයට පෙනී සිටීමට ඔහුට/ඇයට සුදුසුකම් ඇති බවත් සනාථ කරමි.

————,
අංශ/දිස්ත්‍රික් ප්‍රධානියාගේ අත්සන.
පදවි නාමය හා නිල මුද්‍රාව.

දිනය :————.

10-438

---

## රාජ්‍ය කළමනාකරණ සහකාර සේවයේ III වැනි පන්තියට බඳවා ගැනීමේ විවෘත තරග විභාගය - 2009

1.0 රාජ්‍ය කළමනාකරණ සහකාර සේවයේ III වැනි පන්තියේ තනතුරුවලට බඳවා ගැනීමේ විවෘත තරග විභාගය සඳහා සුදුසුකම් ලත් ශ්‍රී ලංකා පුරවැසියන්ගෙන් අයැදුම්පත් කැඳවනු ලැබේ.

2.0 විභාග කොමසාරිස් ජනරාල් විසින් පවත්වනු ලබන ලිඛිත පරීක්ෂණයක ප්‍රතිඵල අනුව කුසලතාව මත සුදුසුකම් සපුරා ඇති අපේක්ෂකයන්, දිස්ත්‍රික් ජනගහන අනුපාත පදනමින් රාජ්‍ය කළමනාකරණ සහකාර සේවයේ III වැනි පන්තියේ තනතුරු සඳහා පත් කිරීමට තෝරාගනු ඇත.

3.0 පත් කරනු ලබන සංඛ්‍යාව හා පත්වීම ක්‍රියාත්මවන වන දිනය පත්වීම් බලධරයා විසින් නිශ්චය කරනු ලැබේ. කිසියම් ඇබෑර්තු සංඛ්‍යාවක් හෝ ඇබෑර්තු සියල්ලම හෝ නොපිරවීමට පත්වීම් බලධරයාට බලය ඇත.

4.0 *වැටුප* :- අංක 06/2006(IV) 2007.08.24 දිනැති රාජ්‍ය පරිපාලන චක්‍රලේඛයට අනුව, රාජ්‍ය කළමනාකරණ සහකාර සේවයේ III, II, හා I වැනි පන්තිවලට අදාළ මාසික වැටුප් පරිමාණය

රු. 13,990, 10 x 145, 11 x 170 - 6 x 240 - 4 x 320 - රු. 23,230 වේ. රු. 15,440 න් ඔබ්බට යාම සඳහා II වැනි පන්තියට උසස් වීම ද රු. 17,310 න් ඔබ්බට යාම සඳහා 1 වැනි පන්තියට උසස් වීම ද ලබාගත යුතු ය.

5.0 මෙම තනතුර ස්ථිර හා විශ්‍රාම වැටුප් සහිතය.

6.0 *සුදුසුකම්* :- රාජ්‍ය කළමනාකරණ සහකාර සේවයේ III වැනි පන්තියේ තනතුරුවලට බඳවා ගැනීම සඳහා පහත සඳහන් සුදුසුකම් අදාළ වේ.

(*අ*) ශ්‍රී ලංකාවේ පුරවැසියෙකු විය යුතුය.
(*ආ*) අයදුම්පත් භාර ගන්නා අවසාන දිනයට වයස අවුරුදු 18 ට නොඅඩු හා අවුරුදු 30 ට නොවැඩි විය යුතුය.
(*ඇ*) යහපත් චරිතයකින් යුක්ත විය යුතුය.
(*ඈ*) පහත සඳහන් අධ්‍යාපන සුදුසුකම් සම්පූර්ණ කර තිබිය යුතුය.

(1) සිංහල/දෙමළ/ඉංග්‍රීසි භාෂාව සහ ගණිතය ඇතුළුව විෂයන් හතරකට (04) සම්මාන සාමර්ථය සහිතව එක් වරක දී විෂයන් හයකින් (06) අධ්‍යයන පොදු සහතික පත්‍ර (සාමාන්‍ය පෙළ) විභාගය සමත් ව තිබීම;

*සහ*

(2) අධ්‍යයන පොදු සහතික පත්‍ර (උසස් පෙළ) විභාගයේ දී සාමාන්‍ය පොදු පරීක්ෂණය හා සාමාන්‍ය ඉංග්‍රීසි හැර සියලු ම විෂයයන්ගෙන් එකවර සමත් ව තිබීම.

(පැරණි විෂය නිර්දේශය යටතේ විෂය 03 කින් එක්වර සමත් ව තිබීම ප්‍රමාණවත් වේ.)

සෑම අයදුම්කරුවෙකුම තනතුරට අදාළ සුදුසුකම් 2009 නොවැම්බර් මස 16 දින හෝ ඊට පෙර හෝ සම්පූර්ණ කර තිබීම අනිවාර්ය වේ.

7.0 දිස්ත්‍රික් ජනගහන අනුපාත පදනම මත තෝරා ගැනීම.

(*අ*) සේවයට බඳවා ගැනීම නියෝජනාත්මක පදනමක් මත කෙරෙනු ඇත. එක් එක් පරිපාලන දිස්ත්‍රික්කයක ජන සංඛ්‍යාවට සමානුපාතිකව සහ රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ 15/90 ට අදාළව ඒ ඒ දිස්ත්‍රික්කය සඳහා ඇබෑර්තු සංඛ්‍යාවෙන් නියමිත ගණනක් වෙන් කරනු ලැබේ. යම් දිස්ත්‍රික්කයකින් පිරවිය යුතු ඇබෑර්තු සංඛ්‍යාව සඳහා තරග කිරීමට සුදුස්සන් වනුයේ එම දිස්ත්‍රික්කයෙන් ඉල්ලුම් කරන අයදුම්කරුවන් පමණි.

(i) යම් දිස්ත්‍රික්කයට ඉහත සඳහන් පරිදි වෙන් කළ ඇබෑර්තු සංඛ්‍යාව එම දිස්ත්‍රික්කයට අන්තර්ග්‍රහණය කර ගනු නොලැබේ නම් එම ඇබෑර්තු සංඛ්‍යාව පළාත තුළ යාබද දිස්ත්‍රික්කවලට නැවත බෙදා හරිනු ලැබේ.

(ii) පත් කිරීමට තිබෙන මුළු තනතුරු සංඛ්‍යාව ස්වල්පයක් නම්, එම හේතුව මත දිස්ත්‍රික් ජන සංඛ්‍යා පදනම අදාළ කර ගත නොහැකි වන විට කුසලතා අනුපිළිවෙලින් සුදුස්සන් තෝරා ගනු ලැබේ.

(iii) විභාගයේ දී අවශ්‍ය අවම ලකුණු ලබාගත් සංඛ්‍යාව පවත්නා පුරප්පාඩු සංඛ්‍යාවට වඩා අඩුවන විට දිස්ත්‍රික් ජන සංඛ්‍යා පදනම මත තෝරා ගැනීම සිදු නොකෙරේ.

(ආ) දිස්ත්‍රික්කයට අයත් වීම සඳහා තිබිය යුතු සුදුසුකම් - දිස්ත්‍රික්කයක පුරප්පාඩු සඳහා තරග කිරීමට නම් පහත සඳහන් කරුණු අතරින් එකක් හෝ සපුරා තිබිය යුතු ය.

(i) අපේක්ෂකයා එම දිස්ත්‍රික්කය තුළ උපන් අයකු විය යුතු ය;

එසේ නැතහොත්

(ii) විභාගය සඳහා සුදුසුකම් සම්පූර්ණ කළ යුතු අවසන් දිනයට පූර්වයෙන් වූ අවුරුදු පහක් (05) ඇතුළත ඔහු/ඇය එම දිස්ත්‍රික්කය තුළ යටත් පිරිසෙයින් අවුරුදු තුනක් (03) වත් අඛණ්ඩව ස්ථිර වශයෙන් පදිංචිව සිටි අයකු විය යුතු ය;

එසේ නැතහොත්

(iii) ඔහු/ඇය නොකඩවා අවුරුදු 05 ක් එම දිස්ත්‍රික්කයෙහි ස්වකීය ද්විතීයික පාසල් අධ්‍යාපනය ලබා තිබිය යුතු ය.

(ඇ) අයදුම්කරුවන් ඉහත (ආ) (ii) යටතේ තමන් අයත් දිස්ත්‍රික්කය සනාථ කිරීම සඳහා අයදුම්පත් භාර ගන්නා අවසාන දිනට පූර්වාසන්න අවුරුදු තුනක (03) ඡන්ද හිමි නාමලේඛන සහ ප්‍රාදේශීය ලේකම් විසින් අනුඅත්සන් කළ ග්‍රාම නිලධාරී සහතිකය ඉදිරිපත් කිරීමට බැඳී සිටිය යුතු ය.

සටහන - 1. යම් අපේක්ෂකයකුගේ පියා හෝ මව හෝ රජයේ, පළාත් සභා සේවයේ හෝ සංස්ථාවක මාරු කළ හැකි සේවයක යෙදී සිටියේ නම් එම අපේක්ෂකයාට තමාගේ, තම පියාගේ හෝ මවගේ හෝ උපන් ස්ථානය තමා අයත් දිස්ත්‍රික්කය වශයෙන් තෝරා ගැනීමට අවසර දෙනු ලැබේ. (ඒ සඳහා අයදුම්කරු විසින් තම දෙමාපියන්ගේ උප්පැන්න සහතික පිටපත් ඉදිරිපත් කළ යුතුය.)

2. කිසිම අපේක්ෂකයෙකුට එක් දිස්ත්‍රික්කයට වැඩි ගණනක ඇබෑර්තු සඳහා තරග කිරීමට අවසර දෙනු නොලැබේ. තමන් වඩාත් කැමති දිස්ත්‍රික්කය කවරක් දැයි වරක් සඳහන් කළ පසු එය වෙනස් කළ නොහැකිය.

8.0 පවත්නා පුරප්පාඩු සංඛ්‍යාවෙන් 3% ක් ආබාධ සහිත පුද්ගලයින් සඳහා වෙන් කෙරෙනු ඇත. විභාගයේ දී සුදුසුකම් ලබන ආබාධ සහිත පුද්ගලයින් අතරින් ඉහළ ලකුණු මට්ටමේ 3% ක ප්‍රතිශතයක් පමණක් පත්වීම් ලබාදීම සඳහා තෝරා ගැනෙනු ඇත. තෝරා ගනු ලබන අපේක්ෂකයන්ගේ ලකුණු මට්ටම යටත් පිරිසෙයින් 50% ක් වත් විය යුතුය. පත්වීමක් සඳහා තෝරා ගනු ලැබූ අපේක්ෂයෙකු විශේෂ වෛද්‍ය පරීක්ෂණ මණ්ඩලයක් වෙත ඉදිරිපත් කරන අතර, විශේෂඥ වෛද්‍ය වාර්තාවකින් තම ආබාධ සහිත තත්ත්වය හා එය අදාළ තනතුරේ රාජකාරි ඉටු කිරීම සඳහා බාධාවක් නොවන බව තහවුරු කළ යුතුය.

9.0 විභාග පරිපාටිය :- විභාගය, ප්‍රශ්න පත්‍ර දෙකකින් යුක්ත වේ. මෙම විභාගය සිංහල, දෙමළ, සහ ඉංග්‍රීසි මාධ්‍යවලින් පැවැත්වෙන අතර ඉල්ලුම්කරන මාධ්‍ය පසුව වෙනස් කිරීමට ඉඩ දෙනු නොලැබේ.

| | | ලකුණු | කාලය |
|---|---|---|---|
| (i) | භාෂා හැකියාව | 100 යි | පැය 1 1/2 යි |
| (ii) | අභියෝග්‍යතාව | 100 යි | පැය 1 යි |

භාෂා හැකියාව : මෙම ප්‍රශ්න පත්‍රය අපේක්ෂකයන්ගේ අදහස් ප්‍රකාශනය, අවබෝධය, අක්ෂර වින්‍යාසය සහ සරළ ව්‍යාකරණ භාවිතය පිළිබඳ දැනුම පරීක්ෂා කෙරෙන ප්‍රශ්නවලින් සමන්විත වේ.

අභියෝග්‍යතාව : මෙම ප්‍රශ්න පත්‍රය අපේක්ෂකයන්ගේ සංඛ්‍යාමය හැකියාවන්, තර්කන ශක්තිය, සාමාන්‍ය බුද්ධිය ආදිය මැනෙන අයුරින් සැකසෙන ප්‍රශ්නවලින් සමන්විත වේ.

(රාජකාරි කටයුතු සඳහා අපේක්ෂකයන්ගේ සුදුසුකම හා හැකියාව පරීක්ෂා කිරීම පිණිස මෙම ප්‍රශ්න පත්‍ර සකස් කෙරේ.)

මෙම විභාගය තරග විභාගයක් වුව ද පත්වීම් ලැබීමට සුදුසුකම් ලැබීම සඳහා එක් එක් විෂයය සඳහා වෙන් කර ඇති ලකුණුවලින් යටත් පිරිසෙයින් සියයට හතලිහක් වත් (40%) අපේක්ෂකයන් විසින් ලබාගත යුතු අතර, විභාගයේ මුළු ලකුණු ගණනින් යටත් පිරිසෙයින් සියයට පනහක් වත් (50%) ලබාගත යුතු වේ. තරග විභාගය සඳහා වෙන් කොට ඇති පුරප්පාඩු ගණන සපුරාලන පරිදි ලබාගත් ලකුණු අනුපිළිවෙල තරයේ ම අනුගමනය කරමින් පත්වීම් දෙනු ලැබේ.

10.0 ව්‍යාජ තොරතුරු සඳහා දඬුවම් - ඉල්ලුම් පත්‍රය පිරවීමේ දී ඉතා සැළකිලිමත්ව නිරවද්‍ය තොරතුරු සැපයිය යුතුය. මේ විභාගයේ නීතිරීති අනුව යම් අපේක්ෂකයෙකු නුසුදුසු බව අනාවරණය වුවහොත් විභාගයට පෙර හෝ විභාගය පැවැත්වෙද්දී හෝ විභාගයෙන් පසුව හෝ ඕනෑම අවස්ථාවක ඔහුගේ/ඇයගේ අපේක්ෂකත්වය අවලංගු කළ හැකිය. අයදුම්කරුවෙකු විසින් ඉදිරිපත් කරන ලද තොරතුරුක් ඕනෑම අවස්ථාවක අසත්‍ය බව පෙනී ගියහොත් හෝ ඔහු/ඇය රජයේ සේවයෙන් පහ කිරීමට පිළිවන.

11.0 විභාග ගාස්තු :- විභාග ගාස්තුව රු. 250 කි. මෙම මුදල විභාග කොමසාරිස් ජනරාල්ගේ 4000-20-03-20-13 ආදායම් ශීර්ෂය යටතේ ඕනෑම ප්‍රාදේශීය ලේකම් කාර්යාලයකට හෝ දිස්ත්‍රික් ලේකම් කාර්යාලයකට හෝ ගෙවිය හැකිය. ඒ සඳහා නිකුත් කරන රිසිට්පත අයදුම්පතේ අදාළ කොටුවේ නොගැළවෙන සේ ඇලවිය යුතුය. (රිසිට්පතේ ඡායාස්ථ පිටපතක් මතු ප්‍රයෝජනය සඳහා ළඟ තබා ගත යුතුය.) කිසිම හේතුවක් නිසාවත් විභාග ගාස්තු ආපසු ගෙවනු නොලබන අතර, මුදල් ඇණවුම් හා මුද්දර භාරගනු නොලැබේ.

12.0 අයදුම්පත්‍ර :- ඒ 4(සෙ. මී. 21x29) (සාමාන්‍ය භාෆ්ෂීට්) ප්‍රමාණයේ කඩදාසි භාවිතා කරමින්,

(අ) අංක 01 සිට 03 තෙක් ඡේදයන් පළමු පිටුවට ද,
(ආ) අංක 04 සිට ඉදිරියට වන ඡේදයන් අනෙක් පිටුවලට ද, ඇතුලත් වන සේ, අයදුම්පත්‍රය පිළියෙල කරගත යුතුය.
(ඇ) ඉල්ලුම් පත්‍රය පිළියෙල කර ගන්නා විට එහි ශීර්ෂයේ සඳහන් විභාගයේ නම සිංහල අයදුම්පත්‍රවල සිංහලට අමතරව ඉංග්‍රීසියෙන් ද දෙමළ අයදුම්පත්‍රවල දෙමළට අමතරව ඉංග්‍රීසියෙන් ද සඳහන් කළ යුතුය.

නියමිත ආදර්ශ ආකෘතියට අනුකූල නොවන, නියමිත දිනට පෙර විභාග ගාස්තු ගෙවා නොමැති හා නිවැරදිව සම්පූර්ණ කර නොමැති අසම්පූර්ණ තත්ත්වයේ පවතින අයදුම්පත්‍ර කිසිදු දැනුම්දීමකින් තොරව ප්‍රතික්ෂේප කරනු ලැබේ. නිසි පරිදි අයදුම්පත්‍ර සම්පූර්ණ නොකිරීමෙන් සිදුවන පාඩුව අයදුම්කරුවන් විසින් දරාගත යුතුය. ඉල්ලුම්පත්‍රයේ ඡායා පිටපතක් ළඟ තබා ගැනීම ප්‍රයෝජනවත් වනු ඇති අතර, සම්පූර්ණ කරනු ලබන ඉල්ලුම්පත්‍රය විභාග නිවේදනයේ දැක්වෙන ඉල්ලුම්පත්‍රයට අනුකූලද යන්න පිළිබඳව අයදුම්කරු විසින් විමසා බැලිය යුතු වේ. එසේ නොවුනහොත් අයදුම්පත ප්‍රතික්ෂේප විය හැක.

*සැ. යු.*- විභාගයට පෙනී සිටීමට ඉල්ලුම් කළ නගර පසුව වෙනස් කිරීමට ඉඩ දෙනු නොලැබේ. යම් නගරයකට ඉල්ලුම් කළ අපේක්ෂකයන් ගණන ප්‍රමාණවත් නොවේ නම් දෙවන කැමැත්ත ලෙස සඳහන් කළ නගරය වෙත යොමු කෙරෙන අතර, එම දෙවන නගරය සඳහා ද ප්‍රමාණවත් අපේක්ෂකයින් ගණනක් නොසිටියහොත් යාබද නගරයක් වෙත යොමු කරනු ලැබේ.

12.1 *ගැසට් නිවේදනයේ* සඳහන් සුදුසුකම් ඇති අය පමණක් ඉල්ලුම් කර ඇතැයි යන පූර්ව නිගමනය මත නියමිත විභාග ගාස්තු ගෙවා නියමිත දිනට හෝ එදිනට පෙර හෝ ඉල්ලුම්පත්‍ර ඉදිරිපත් කර ඇති සියලු අයදුම්කරුවන්ට තරඟ විභාගයට පෙනී සිටීමට විභාග කොමසාරිස් ජනරාල් විසින් ඉඩ දෙනු ලැබේ. තරඟ විභාගයට පෙනී සිටීම සඳහා ප්‍රවේශ පත්‍රයක් නිකුත් කිරීම අයදුම්කරු මෙම තනතුර සඳහා සුදුසුකම් සපුරා ඇති බවට පිළිගැනීමක් ලෙස සලකනු නොලැබේ. අයදුම්කරුවන් සම්මුඛ පරීක්ෂණයට කැඳවා ගැසට් නිවේදනය අනුව සුදුසුකම් තිබේදැයි පරීක්ෂා කරන අවස්ථාවේ අවශ්‍ය සුදුසුකම් නොමැති බව අනාවරණය වුවහොත් එම අයගේ විභාග අපේක්ෂකත්වය අවලංගු කරනු ලැබේ.

12.2 අයදුම්පත්‍රය බහා එවන කවරයේ වමත් පස ඉහළ කෙළවරේ "රාජ්‍ය කළමනාකරණ සහකාර සේවයේ III වන පන්තියට බඳවා ගැනීමේ විවෘත තරඟ විභාගය" 2009" යන්න සහ ඔබ තරඟ කරන දිස්ත්‍රික්කය ද සඳහන් කරන්න.

12.3 අයදුම්පත්‍රයේ අපේක්ෂකයාගේ අත්සන රජයේ විද්‍යාලයක, විදුහල්පතිවරයකු, සාමදාන විනිශ්චයකාරවරයෙකු, දිවුරුම් කොමසාරිස්වරයෙකු, ප්‍රසිද්ධ නොතාරිස්වරයෙකු, ත්‍රිවිධ හමුදාවේ අධිකාරි බලයලත් නිලධාරියෙකු, පොලිස් සේවයේ ගැසට් කළ තනතුරක් දරන නිලධාරියෙකු, වාර්ෂික වැටුප රු. 2,40,360 ක් හෝ ඊට වැඩි රජයේ ස්ථිර තනතුරක් දරන නිලධාරියෙකු හෝ විසින් සහතික කරනු ලැබ තිබිය යුතුය.

12.4 සම්පූර්ණ කරන ලද අයදුම්පත්‍රය 2009 නොවැම්බර් මස 16 වැනි දින හෝ ඊට පෙර පහත දැක්වෙන ලිපිනයට ලියාපදිංචි තැපෑලෙන් එවිය යුතුය.

විභාග කොමසාරිස් ජනරාල්,
සංවිධාන හා විදේශ විභාග ශාඛාව,
ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව,
පැලවත්ත, බත්තරමුල්ල.

13.0 *විභාගයට පෙනී සිටීම*.- අයදුම්කරුවන් වෙත ප්‍රවේශ පත්‍ර නිකුත් කළ වහාම ඒ බව සඳහන් කරමින් පුවත්පත් නිවේදනයක් ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව මගින් පළ කරනු ඇත. නිවේදනය පළ වී දින 2 ක් හෝ 3 ක් ගතවූ පසුවත් ප්‍රවේශ පත්‍රය නොලැබුණි නම් දැන්වීමේ සඳහන් ආකාරයට ඒ බව ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව වෙත දන්වා සිටිය යුතුය. ඔබ වෙත තබා ගත් අයදුම්පත්‍රයේ හා මුදල් ගෙවූ කුවිතාන්සියේ සහතික කළ ඡායා පිටපතක්ද, ලියාපදිංචි කළ කුවිතාන්සිය ද, කොළඹින් බැහැර ප්‍රදේශයක නම් ප්‍රවේශ පත්‍රය එවීම සඳහා ෆැක්ස් අංකයක් ද සඳහන් ඔබගේ ඉල්ලීම් ලිපිය ද ළඟ තබාගෙන ම ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව වෙත දැන්වීම වඩාත් ඵලදායී වනු ඇත.

14.0 අපේක්ෂකයින්ගේ අනන්‍යතාව සනාථ කිරීම සඳහා පහත සඳහන් ලියකියවිලිවලින් එකක් විභාග ශාලාධිපති වෙත ඉදිරිපත් කළ යුතුය.

i. පුද්ගලයින් ලියාපදිංචි කිරීමේ දෙපාර්තමේන්තුව මගින් නිකුත් කරන ලද වලංගු ජාතික හැඳුනුම් පත;

ii. වලංගු විදේශ ගමන් බලපත්‍රය.

15.0 අපේක්ෂකයෙකු හට විභාග ප්‍රවේශ පත්‍රයක් නිකුත් කිරීම ඔහු හෝ ඇය විභාගයට ඉදිරිපත් වීමට සුදුසුකම් සපුරා ඇති බවට පිළිගැනීමක් ලෙස නොසැළකිය යුතුය. විභාගයට පැවැත්වීම සම්බන්ධයෙන් විභාග කොමසාරිස් ජනරාල් විසින් පනවනු ලබන නීතිරීතිවලට ද විභාග අපේක්ෂකයින් යටත් වේ. එම නීතිරීති උල්ලංඝනය කළ හොත් විභාග කොමසාරිස් ජනරාල් විසින් පනවනු ලබන දඬුවමකට යටත් වීමට ඔහුට හෝ ඇයට සිදුවනු ඇත.

16.0 මෙහි සඳහන් නොවන යම් කරුණක් වෙතොත්, ඒ සම්බන්ධව ඒකාබද්ධ සේවා අධ්‍යක්ෂ ජනරාල් විසින් තීරණය කරනු ඇත. සියලුම අයදුම්කරුවන් මෙම ගැසට් පත්‍රයේ සඳහන් පොදු විභාග නීතිරීති අනුව කටයුතු කිරීමට බැඳී සිටිනු ඇත.

බී. පී. පී. එස්. අබේගුණරත්න,
ඒකාබද්ධ සේවා අධ්‍යක්ෂ ජනරාල්,
රාජ්‍ය පරිපාලන සහ
ස්වදේශ කටයුතු අමාත්‍යාංශය.

2009 සැප්තැම්බර් මස 29 වැනි දින,
රාජ්‍ය පරිපාලන සහ ස්වදේශ කටයුතු අමාත්‍යාංශය.
නිදහස් චතුරශ්‍රය, කොළඹ 07.

ආදර්ශ අයදුම්පත්‍රය

රාජ්‍ය කළමනාකරණ සහකාර සේවයේ III වැනි පන්තියට බඳවා ගැනීමේ විවෘත තරඟ විභාගය - 2009

Open Competitive Examination for Recruitment to Class III of Public Management Assistants Service - 2009

(දෙන ලද කොටු තුළ නිවැරදි සංකේතය/අංකය පැහැදිලිව සටහන් කරන්න)

| |
|---|
| |

(කාර්යාලයීය ප්‍රයෝජනය සඳහා)

විභාගයට පෙනී සිටින භාෂා මාධ්‍ය
සිංහල - 2
දෙමළ -3
ඉංග්‍රීසි -4

| |
|---|
| |

(අදාළ අංකය කොටුව තුළ ලියන්න)

* *ගැසට් නිවේදනය* අනුව ඉල්ලුම්කරු විභාගයට පෙනී සිටීමට අපේක්ෂා කරන නගරය හා නගර අංකය සඳහන් කරන්න. (විභාග මධ්‍යස්ථාන පිහිටුවන නගර සහ නගර අංක සඳහා උපලේඛන - II බලන්න)

| | නගරය | නගර අංකය |
|---|---|---|
| 1. | | |
| 2. | | |

* පුරප්පාඩු සඳහා තරඟ කිරීමට *ගැසට් නිවේදනයේ* 7.0 වන ඡේදයට අනුකූලව ඔබ තෝරා ගන්නා දිස්ත්‍රික්කය. (දිස්ත්‍රික්ක අංක සහිත උපලේඛනය - 1 බලන්න. අදාළ දිස්ත්‍රික්කය හා දිස්ත්‍රික් අංකය කොටුව තුළ ලියන්න)

| දිස්ත්‍රික්කය | දිස්ත්‍රික්ක අංකය |
|---|---|
| | |

* ඔබ විභාගයට පෙනී සිටින්නේ ගැසට් නිවේදනයේ 8.0 ඡේදයේ ප්‍රකාරව, ආබාධිත පුනරුත්ථාපන කොන්දේසි යටතේද?
(මෙම කොටස පිරවීමට පෙර ගැසට් නිවේදනයේ 8.0 ඡේදය හොඳින් කියවන්නේ නම් මැනවි)

ඔව් -1
නැත -2
(අදාළ අංකය කොටුව තුළ ලියන්න)

---

1.0 1.1 මුලකුරු අගට යොදා මුලකුරු සමග නම :———.
(ඉංග්‍රීසි කැපිටල් අකුරෙන්) උදා : PERERA, A. B. C.

1.2 සම්පූර්ණ නම :———.
(ඉංග්‍රීසි කැපිටල් අකුරෙන්)

1.3 සම්පූර්ණ නම :———.
(සිංහලෙන්/දෙමළෙන්)

1.4 ජාතික හැඳුනුම්පත් අංකය

2.0 2.1 ස්ථිර ලිපිනය :———.
(ඉංග්‍රීසි කැපිටල් අකුරෙන්)

2.2 ස්ථිර ලිපිනය :———.
(සිංහලෙන්/දෙමළෙන්)

2.3 ප්‍රවේශ පත්‍ර එවිය යුතු ලිපිනය :———.
(ඉංග්‍රීසි කැපිටල් අකුරෙන්)

3.0 3.1 ස්ත්‍රී/පුරුෂ භාවය - ස්ත්‍රී -1 පුරුෂ -0
(අදාළ අංකය කොටුව තුළ ලියන්න)

3.2 උපන් දිනය : වර්ෂය මාසය දිනය

3.3 2009.11.16 දිනට වයස : අවුරුදු මාස දින

4.0 4.1 දිස්ත්‍රික්කයේ පදිංචිව සිටින්නේ කවදා සිට ද? :———.

4.2 උප දිසාපති/ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසය :———.

4.3 ග්‍රාම නිලධාරී කොට්ඨාසය :———.

5.0 අධ්‍යාපන සුදුසුකම් :

5.1 අ.පො.ස. (සා. පෙළ) විභාගය පිළිබඳ විස්තර

i. විභාගයේ වර්ෂය හා මාසය :———.

ii. විභාග අංකය :———.

iii. ප්‍රතිඵල

| විෂයය | ශ්‍රේණිය | විෂයය | ශ්‍රේණිය |
|---|---|---|---|
| 1. | | 6. | |
| 2. | | 7. | |
| 3. | | 8. | |
| 4. | | 9. | |
| 5. | | 10. | |

5.2 අ.පො.ස. (උ.පෙළ) විභාගය පිළිබඳ විස්තර

i. විභාගයේ වර්ෂය හා මාසය :———.

ii. විභාග අංකය :———.

iii. ප්‍රතිඵල

| විෂයය | ශ්‍රේණිය |
|---|---|
| 1. | |
| 2. | |
| 3. | |
| 4. | |

5.3 පිළිගත් විශ්ව විද්‍යාලයක උපාධියක් ලබා ඇත්නම්,

i. විශ්ව විද්‍යාලය :———.

ii. උපාධිය :———.

iii. විභාග වර්ෂය :———.

6.0 වෙනත් සුදුසුකම් :———.

7.0 ඔබ කවරදාක හෝ කවර හෝ චෝදනාවක් සඳහා උසාවියකින් වරදකරු කරනු ලැබ තිබේද?

(අදාළ කොටුවේ ✓ ලකුණ යොදන්න) (ඔව් නම් විස්තර සඳහන් කරන්න)

ඔව් නැත

8.0 විභාග ගාස්තු ගෙවූ ලදුපත පිළිබඳ විස්තර :

i. විභාග ගාස්තු ගෙවූ කාර්යාලය :———.

ii. ලදුපත් අංකය හා දිනය :———.

iii. ගෙවූ මුදල :———.

ලදුපත නොගැලවෙන සේ මෙහි අලවන්න

9.0 *අයැදුම්කරුගේ සහතිකය :*

(අ) මෙම ඉල්ලුම්පත්‍රයේ මවිසින් සපයා ඇති තොරතුරු මා දන්නා තරමින් සත්‍ය හා නිවැරදි බවත් ගෞරවයෙන් ප්‍රකාශ කර සිටිමි. මෙහි යම් කොටස් සම්පූර්ණ නොකිරීමෙන් සහ/හෝ වැරදි ලෙස සම්පූර්ණ කිරීමෙන් සිදුවිය හැකි අලාභය විඳදරා ගැනීමට එකඟ වෙමි. තවද මෙහි සියලුම කොටස් නිවැරදිව සම්පූර්ණ කර ඇති බව ද ප්‍රකාශ කරමි.

(ආ) මවිසින් කරන ලද මෙම ප්‍රකාශය අසත්‍ය යැයි ඔප්පු වුවහොත්, පත්කරනු ලැබීමට පෙර නුසුදුස්සකු වන බව සහ පත්වීම ලැබීමෙන් පසු සේවයෙන් පහකරනු ලැබීමට යටත්වන බව ද මම දනිමි.

(ඇ) තව ද විභාගය පැවැත්වීම සම්බන්ධයෙන් විභාග කොමසාරිස් ජනරාල් විසින් පනවනු ලබන නීතිරීතිවලට මම යටත් වන බව ද ප්‍රකාශ කරමි.

(ඇ) මෙහි සඳහන් කිසිඳු තොරතුරක් පසුව වෙනස් නොකරමි.

———.
අයැදුම්කරුගේ අත්සන

දිනය :———.

10.0 අයැදුම්කරුගේ අත්සන සහතික කිරීම :

මෙම අයැදුම්පත ඉදිරිපත් කරනු ලබන .......................... මයා/මිය/මෙනෙවිය මා පෞද්ගලිකව දන්නා හඳුනන බව ද ඔහු/ඇය මා ඉදිරිපිට දී ............... දින ඔහුගේ/ඇයගේ අත්සන තැබූ බවද, නියමිත විභාග ගාස්තු ගෙවා ඇති බවද, එම ලදුපත අලවා ඇති බව ද සහතික කරමි.

———,
අත්සන සහතික කරන
නිලධාරියාගේ අත්සන.

දිනය :———.

සහතික කරන නිලධාරියාගේ සම්පූර්ණ නම :———.

තනතුර :———.

ලිපිනය :———.

(නිල මුද්‍රාවෙන් සනාථ කරන්න)

## උපලේඛනය - I
### දිස්ත්‍රික් නාම ලේඛනය හා අංක

| *දිස්ත්‍රික්කය* | *දිස්ත්‍රික්ක අංකය* |
|---|---|
| කොළඹ | 01 |
| ගම්පහ | 02 |
| කළුතර | 03 |
| මාතලේ | 04 |
| මහනුවර | 05 |
| නුවරඑළිය | 06 |
| ගාල්ල | 07 |
| මාතර | 08 |
| හම්බන්තොට | 09 |
| යාපනය | 10 |
| මන්නාරම | 11 |
| මුලතිව් | 12 |
| වව්නියාව | 13 |
| ත්‍රිකුණාමලය | 14 |
| මඩකලපුව | 15 |
| අම්පාර | 16 |
| පුත්තලම | 17 |
| කුරුණෑගල | 18 |
| අනුරාධපුරය | 19 |
| පොළොන්නරුව | 20 |
| බදුල්ල | 21 |
| මොණරාගල | 22 |
| කෑගල්ල | 23 |
| රත්නපුර | 24 |
| කිලිනොච්චිය | 25 |

## උපලේඛනය - II
### විභාග මධ්‍යස්ථාන පිහිටුවන නගරයන්

| *දිස්ත්‍රික්කය* | *නගරය* | *නගර අංකය* |
|---|---|---|
| 01 කොළඹ | කොටහේන | 01 |
| | මරදාන | 02 |
| | බොරැල්ල | 03 |
| | කුරුඳුවත්ත | 04 |
| | බම්බලපිටිය | 05 |
| | හැව්ලොක් ටවුම | 06 |
| | නුගේගොඩ | 07 |
| | මොරටුව | 08 |
| | පිළියන්දල | 09 |
| | හෝමාගම | 10 |
| | මහරගම | 11 |
| | හංවැල්ල | 12 |
| | අවිස්සාවේල්ල | 13 |
| 02 ගම්පහ | මීගමුව | 14 |
| | මිනුවන්ගොඩ | 15 |
| | දිවුලපිටිය | 16 |
| | වේයන්ගොඩ | 17 |
| | ගම්පහ | 18 |
| | ජා-ඇල | 19 |
| | වත්තල | 20 |
| | කැළණිය | 21 |
| | දොම්පේ | 22 |
| 03 කළුතර | හොරණ | 23 |
| | පානදුර | 24 |
| | කළුතර | 25 |
| | මතුගම | 26 |
| | අලුත්ගම | 27 |
| 04 මාතලේ | මාතලේ | 28 |
| | ගලේවෙල | 29 |
| | නාඋල | 30 |
| | ලග්ගල - පල්ලේගම | 31 |
| 05 මහනුවර | මහනුවර | 32 |
| | කටුගස්තොට | 33 |
| | තෙල්දෙණිය | 34 |
| | වත්තේගම | 35 |
| | නුගවෙල | 36 |
| | ගලගෙදර | 37 |
| | ගම්පොළ | 38 |
| 06 නුවරඑළිය | හඟුරන්කැත | 39 |
| | නුවරඑළිය | 40 |
| | වලපනේ | 41 |
| | හැටන් | 42 |
| | ගිනිගත්හේන | 43 |
| 07 ගාල්ල | අම්බලන්ගොඩ | 44 |
| | ගාල්ල | 45 |
| | බද්දේගම | 46 |
| 08 මාතර | වැලිගම | 47 |
| | මාතර | 48 |

| දිස්ත්‍රික්කය | නගරය | නගර අංකය |
|---|---|---|
| | කඹුරුපිටිය | 49 |
| | හක්මන | 50 |
| | දෙයියන්දර | 51 |
| | දික්වැල්ල | 52 |
| | අකුරැස්ස | 53 |
| | කොටපොල | 54 |
| 09 හම්බන්තොට | බෙලිඅත්ත | 55 |
| | වලස්මුල්ල | 56 |
| | වීරකැටිය | 57 |
| | තංගල්ල | 58 |
| | අම්බලන්තොට | 59 |
| | හම්බන්තොට | 60 |
| | තිස්සමහාරාමය | 61 |
| 10 යාපනය | චාවකච්චේරිය | 62 |
| | යාපනය | 63 |
| | තෙලිප්පල්ලෙයි | 64 |
| | පේද්‍රුරුතුඩුව | 65 |
| 11 මන්නාරම | මන්නාරම | 66 |
| | මුරුක්කන් | 67 |
| 12 මුලතිව් | මුලතිව් | 68 |
| 13 වවුනියා | වවුනියාව | 69 |
| 14 ත්‍රිකුණාමලය | කන්තලේ | 70 |
| | ත්‍රිකුණාමලය | 71 |
| | මුතූර් | 72 |
| | පදවි පරාක්‍රමපුර | 73 |
| | කින්නියා | 74 |
| 15 මඩකලපුව | මඩකලපුව | 75 |
| | එරාවූර් | 76 |
| | කාතන්කුඩි | 77 |
| 16 අම්පාර | අම්පාර | 78 |
| | සේරංකඩ | 79 |
| | කල්මුණ | 80 |
| | අක්කරපත්තු | 81 |
| | සමන්තුරේ | 82 |
| 17 පුත්තලම | වෙන්නප්පුව | 83 |
| | මාදම්පේ | 84 |
| | හලාවත | 85 |
| | පුත්තලම | 86 |
| 18 කුරුණෑගල | කුලියාපිටිය | 87 |
| | බිංගිරිය | 88 |
| | නාරම්මල | 89 |
| | පොල්ගහවෙල | 90 |
| | කුරුණෑගල | 91 |
| | ඉබ්බාගමුව | 92 |
| | දොඩම්ගස්ලන්ද | 93 |
| | මොරතිහ | 94 |
| | නිකවැරටිය | 95 |
| | මහව | 96 |

| දිස්ත්‍රික්කය | නගරය | නගර අංකය |
|---|---|---|
| 19. අනුරාධපුරය | මැදවච්චිය | 97 |
| | කැකිරාව | 98 |
| | අනුරාධපුරය | 99 |
| | ගලෙන්බිඳුණුවැව | 100 |
| | කහටගස්දිගිලිය | 101 |
| 20 පොළොන්නරුව | පොළොන්නරුව | 102 |
| | හිඟුරක්ගොඩ | 103 |
| 21 බදුල්ල | බණ්ඩාරවෙල | 104 |
| | වැලිමඩ | 105 |
| | බදුල්ල | 106 |
| | පස්සර | 107 |
| | මහියංගනය | 108 |
| | ගිරාඳුරුකෝට්ටේ | 109 |
| | හසලක | 110 |
| 22 මොණරාගල | බිබිල | 111 |
| | මොණරාගල | 112 |
| | වැල්ලවාය | 113 |
| 23 කෑගල්ල | කෑගල්ල | 114 |
| | රඹුක්කන | 115 |
| | මාවනැල්ල | 116 |
| | රුවන්වැල්ල | 117 |
| 24 රත්නපුර | ඇහැලියගොඩ | 118 |
| | රත්නපුර | 119 |
| | පැල්මඩුල්ල | 120 |
| | බලංගොඩ | 121 |
| | කලවාන | 122 |
| | ඇඹිලිපිටිය | 123 |
| 25 කිළිනොච්චි | කිළිනොච්චිය | 124 |
| | පලෙයි | 125 |

10-521

---

**ශ්‍රී ලංකා පරිපාලන සේවයට බඳවා ගැනීම සඳහා වන විවෘත තරග විභාගය - 2009**

මෙම නිවේදනයේ "ලේකම්" යන පදයෙන් අදහස් කෙරෙන්නේ "රාජ්‍ය පරිපාලන සහ ස්වදේශ කටයුතු අමාත්‍යාංශයේ ලේකම්" ය

"සේවය" යන පදයෙන් අදහස් කෙරෙන්නේ "ශ්‍රී ලංකා පරිපාලන සේවය" ය

1. ලිඛිත විභාගය :- මෙම විභාගය පහත සඳහන් ප්‍රශ්න පත්‍රවලින් සමන්විත වේ.

(i) සාමාන්‍ය බුද්ධිය
(ii) රචනය හා සාරාංශය
(iii) සාමාන්‍ය දැනුම
(iv) කළමනාකරණ අභියෝග්‍යතාව

*විභාග දිනය.*-මෙම විභාගය 2010 ජනවාරි මස කොළඹ නගරයේදී (නගර අංක 01) හා යාපන නගරයේදී (නගර අංක 02) පැවැත්වෙනවා ඇත. විභාගයට ඉල්ලුම් කළ නගරය පසුව වෙනස් කිරීමට ඉඩ දෙනු නොලැබේ. මෙම විභාගය කල් දැමීමට හෝ අවලංගු කිරීමට රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ/අමාත්‍ය මණ්ඩලයේ උපදෙස්වලට යටත්ව ලේකම්ට බලය ඇත.

වාචික පරීක්ෂණය.- ලිඛිත විභාගයේ සියලුම ප්‍රශ්න පත්‍රවලට පෙනී සිටි අයැදුම්කරුවන් අතරින් ප්‍රමාණවත් බවට රාජ්‍ය සේවා කොමිෂන් සභාව/අමාත්‍ය මණ්ඩලය විසින් නියම කරනු ලබන ඉහළම මට්ටමක මුළු ලකුණු ප්‍රමාණයක් ලබාගත්තාවූද අපේක්ෂකයින් සම්බන්ධයෙන් ව්‍යුහගත වාචික පරීක්ෂණය පැවැත්වෙන දිනය ලේකම් විසින් තීරණය කරනු ඇත.

2. පත් කරනු ලබන සංඛ්‍යාව හා පත්වීම ක්‍රියාත්මක වන දිනය රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ/අමාත්‍ය මණ්ඩලයේ නියෝග අනුව තීරණය කරනු ලැබේ.

3. සේවා කොන්දේසි.- රාජ්‍ය සේවයේ පත්වීම් පාලනය කෙරෙන පොදු කොන්දේසිවලට ද, (ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ අංක 1419/3 සහ 2005 නොවැම්බර් මස 14 වැනි දින දරන අති විශේෂ ගැසට් පත්‍රයේ පළ කරන ලද) 2005 ඔක්තෝබර් මස 28 වැනි දින දරන සේවා ව්‍යවස්ථා සංග්‍රහයෙන් පනවා ඇති නියමයන් හා කොන්දේසිවලට ද, එම ව්‍යවස්ථාවට කර ඇති හෝ මින්මතු කෙරෙන හෝ සංශෝධනවලට ද, යටත්ව තෝරාගනු ලබන අපේක්ෂකයෙකු සේවයේ III වැනි පන්තියට පත්කරනු ලැබේ.

3.1 තමා වෙත පිරිනමන ලද තනතුරේ රාජකාරි නියමිත දිනයේදී බාර ගැනීමට අපොහොසත් වන හා/හෝ පත් කරන ලද තනතුරක හෝ පත් කරන ලද ප්‍රදේශයක රාජකාරි භාර ගැනීම ප්‍රතික්ෂේප කරන හෝ මගහරින හෝ අයැදුම්කරුවන්ගේ පත්වීම අහෝසි කරනු ලැබීමට ඉඩ ඇත.

4. ව්‍යුහය හා මාසික වැටුප් පරිමාණය ඃ-

විශේෂ ශ්‍රේණිය - රු. 42,390 - 12 x 1,310 - රු 58,110.
I වැනි පංතිය - රු. 36,755 - 17 x 1,050 - රු. 53,555.
II වැනි පංතිය - රු. 30,175 - 8 x 790 - රු. 35,705.
III වැනි පංතිය - රු. 22,935 - 10 x 645 - රු. 29,385.

(පත්වීමේ දින සිට වසර 03 ක් ඇතුළත I වැනි කාර්යක්ෂමතා කඩඉම සහ පත්වීමේ දින සිට වසර 06 ක් ඇතුළත II වැනි කාර්යක්ෂමතා කඩඉම සමත් විය යුතු අතර, පත්වීම ලැබ වසර 05 ක් ගතවීමට පෙර 2007.05.28 දිනැති රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ අංක 07/2007 පරිදි දෙවැනි රාජ්‍ය භාෂාව පිළිබඳ ප්‍රවීණතාවයක් ලබා ගත යුතුය)

මෙම විභාගය මගින් බඳවා ගැනීම් සිදු කරනුයේ ශ්‍රී ලංකා පරිපාලන සේවයේ III වැනි පන්තිය සඳහා වේ.

5. සෞඛ්‍ය හා චරිතය.- අපේක්ෂකයා සෞඛ්‍ය අතින් නිසි පරිදි සුදුසුකම් ලබා ඇති බවට ද විශිෂ්ට චරිතයකින් යුක්ත බවට ද, ලේකම් සෑහීමකට පත්විය යුතුය. ඔහු හොඳ ඇස් පෙනීමකින් යුක්ත විය යුතු අතර දිවයිනේ ඕනෑම ප්‍රදේශයක සේවය කිරීමට මනා ශාරීරික සෞඛ්‍යයකින් යුක්ත විය යුතුය. තෝරා ගනු ලබන අපේක්ෂකයින් වෛද්‍ය පරීක්ෂණයට භාජනය කෙරෙනු ඇත.

6. සුදුසුකම්.- මේ සඳහා පෙනී සිටින අපේක්ෂයෙකු,

i. ශ්‍රී ලංකාවේ පුරවැසියෙකු විය යුතුය.
ii. විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් පිළිගත් විශ්ව විද්‍යාලයක උපාධිධාරියෙකු විය යුතුය.
   (අ) උපාධිය බලපවත්නා දිනය 2009.11.16 දින හෝ එදිනට පෙර දිනයක් විය යුතුය.
iii. 2009.11.16 දිනට වයස අවුරුදු 28 එළඹ නොසිටිය යුතුය.
iv. විශිෂ්ඨ චරිතයකින් හා මනා ශාරීරික යෝග්‍යතාවයකින් ද යුක්ත විය යුතුය.
v. යම් ආගමික නිකායක පැවිදිවරයක් දරන කිසිදු තැනැත්තකුට මෙම විභාගය සඳහා පෙනී සිටීමට අවසර නොමැත.

සටහන.-

i. ශ්‍රී ලංකා පරිපාලන සේවයට බඳවා ගැනීම සඳහා වන තරග විභාගයට, දෙවරකට වඩා පෙනී සිටීමට කිසිවකුට අවසර නොමැත.
ii. මෙම විභාගය සඳහා අයැදුම් කිරීමට අවශ්‍ය සුදුසුකම් 2009.11.16 දින වන විට සෑම ආකාරයකින්ම සම්පූර්ණ කර තිබිය යුතුය.

7. විභාග ගාස්තු.-විභාගය සඳහා වූ ගාස්තුව රු. 300 කි. එය ඉල්ලුම්පත් භාර ගන්නා අවසාන දිනට පළමුව දිස්ත්‍රික් ලේකම්/ප්‍රාදේශීය ලේකම් කාර්යාලයකට ආදායම් ශීර්ෂ 2003.20.13 ට බැර කිරීම සඳහා ගෙවිය යුතුය. දිස්ත්‍රික් ලේකම්/ප්‍රාදේශීය ලේකම් කාර්යාලයකින් ලබා ගන්නා ලදුපත ඉල්ලුම් පත්‍රයක් අදාළ කොටුවෙහි ඇලවිය යුතුය. මෙම ගාස්තුව ආපසු ගෙවනු නොලැබේ. ලදුපතෙහි ඡායා පිටපතක් ළඟ තබාගැනීම ප්‍රායෝජනවත් විය හැකිය.

8. *ඉල්ලු කිරීමේ ක්‍රමය.-*

(අ) ඉල්ලුම් පත්‍රය මෙම නිවේදනයට අමුණා ඇති ආදර්ශ ආකෘතියට අනුකූල විය යුතු අතර, එය කඩදාසියේ දෙපැත්ත පාවිච්චි කරමින් 8 1/2" x 12" (A4) ප්‍රමාණයේ කඩදාසියක සකස් කර අපේක්ෂකයා ම පිරවිය යුතුය. 1.0 සිට 3.11 තෙක් වන ශිර්ෂ ඉල්ලුම්පත් කඩදාසියේ පළමු වැනි පිටුවේද, 4.0 සිට 8.0 තෙක් එහි දෙවැනි පිටුවේද වන පරිද්දෙන් තම ඉල්ලුම් පත්‍රය සකස් කළ යුතු බව විශේෂයෙන් සැළකිය යුතුය. ආදර්ශ ඉල්ලුම්පත්‍රයට අනුකූල නොවන ඉල්ලුම්පත්‍රත්, අසම්පූර්ණ ලෙස තොරතුරු සඳහන් කර ඇති ඉල්ලුම්පත්‍රත් දැනුම් දීමකින් තොරව ප්‍රතික්ෂේප කරනු ලැබේ. (ඉල්ලුම්පත්‍රයේ ඡායා පිටපතක් ලඟ තබා ගැනීම ප්‍රයෝජනවත් විය හැක) සම්පූර්ණ කරන ලද ඉල්ලුම් පත්‍රය විභාග නිවේදනයේ දැක්වෙන ඉල්ලුම්පත්‍රයට අනුකූලද යන්න පිළිබඳව අයැදුම්කරු විසින් විමසා බැලිය යුතු වේ. එසේ නොවුනහොත් අයැදුම්පත ප්‍රතික්ෂේප විය හැක.

(ආ) ඉල්ලුම් පත්‍රය අපේක්ෂකයා විභාගයට පෙනී සිටීමට අදහස් කරන භාෂාවෙන් ම විය යුතු ය.

(ඇ) විභාගය සඳහා වන සම්පූර්ණ කර ලද ඉල්ලුම් පත්‍රය ලියාපදිංචි තැපෑලෙන් 2009.11.16 වැනි දින හෝ ඊට කලින් හෝ ලැබෙන පිණිස බත්තරමුල්ල, පැලවත්ත, විභාග දෙපාර්තමේන්තුව (සංවිධාන හා විදේශ විභාග ශාඛාව), විභාග කොමසාරිස් ජනරාල් වෙතට එවිය යුතුය. ඉල්ලුම් පත්‍රය බහා ඇති කවරයේ වමත් පස ඉහළ කෙළවරේ පැහැදිළිව "ශ්‍රී ලංකා පරිපාලන සේවයට බඳවා ගැනීම පිණිස වන විවෘත තරග විභාගය 2009" යන වචන පැහැදිලි ලෙස ලිවිය යුතුය. මෙදිනට පසුව ලැබෙන කිසිම ඉල්ලුම්පතක් භාරගනු නොලැබේ. ඉල්ලුම්පත්‍රය පිළියෙල කරගන්නා විට එහි ශීර්ෂයේ සඳහන් විභාගයේ නම සිංහල ඉල්ලුම්පත්‍රවල සිංහලට අමතරව ඉංග්‍රීසියෙන් ද දෙමළ ඉල්ලුම්පත්‍රවල දෙමළට අමතරව ඉංග්‍රීසියෙන්ද යෙදීම අත්‍යවශ්‍ය වේ.

(ඇ) අයැදුම්පත්‍රයේ අපේක්ෂකයාගේ අත්සන රජයේ විද්‍යාලයක විදුහල්පතිවරයෙකු, සාමදාන විනිශ්චයකරුවකු, දිවුරුම් කොමසාරිස්වරයෙකු නීතිඥවරයෙකු, ප්‍රසිද්ධ නොතාරිස්වරයෙකු, ත්‍රිවිධ හමුදාවේ අධිකාරි බලයලත් නිලධාරියෙකු, පොලිස් සේවයේ ගැසට් කළ තනතුරක් දරන නිලධාරියෙකු හෝ රු. 240,360 කට වැඩි මූලික වාර්ෂික වැටුපක් ලබන රජයේ ස්ථිර තනතුරක් දරන නිලධාරියෙකු හෝ විසින් සහතික කරනු ලැබ තිබිය යුතුය.

(ඉ) සෑම ආකාරයකින්ම සම්පූර්ණ නොවන ඉල්ලුම් පත්‍ර ප්‍රතික්ෂේප කරනු ලැබේ. තැපැල් කිරීමේ දී ඉල්ලුම් පත්‍රයක් නැතිවීම හෝ ප්‍රමාද වීම ගැන කිසිම පැමිණිල්ලක් සලකා බලනු නොලැබේ.

(ඊ) ඉල්ලුම්පත් ලද බව දන්වනු නොලැබේ. අයැදුම්කරුවන් වෙත ප්‍රවේශ පත්‍ර නිකුත් කළ වහාම ඒ බව සඳහන් කරමින් පුවත්පත් නිවේදනයක් ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව මගින් පළ කරනු ඇත. නිවේදනය පළ වී දින 2ක් හෝ 3 ක් ගත වූ පසුවත් ප්‍රවේශ පත්‍රය නොලැබුණි නම් දැන්වීමේ සඳහන් ආකාරයට ඒ බව ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව වෙත දන්වා සිටිය යුතුයි. ඔබ වෙත තබාගත් අයැදුම්පත්‍රයේ හා මුදල් ගෙවූ කුවිතාන්සියේ සහතික කළ ඡායා පිටපත් ද ලියාපදිංචි කළ කුවිතාන්සිය ද කොළඹින් බැහැර ප්‍රදේශයක නම් ප්‍රවේශපත්‍රය එවීම සඳහා ෆැක්ස් අංකයක් ද සඳහන් ඔබගේ ඉල්ලීම් ලිපිය ද ළඟ තබාගෙන ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව වෙත දැන්වීම වඩාත් ඵලදායී වනු ඇත.

9. *විභාගයට ඇතුළුවීම.-*

(අ) ඉල්ලුම්පත් ලැබී ඇති සියලුම පුද්ගලයින්ට විභාග කොමසාරිස් ජනරාල් විසින් ප්‍රවේශ පත්‍ර නිකුත් කරනු ඇත. විභාගයට පෙනී සිටින අපේක්ෂකයකු විභාග මධ්‍යස්ථානයේ ශාලාධිපති වෙත තම ප්‍රවේශ පත්‍රය ඉදිරිපත් කළ යුතුය. තම ප්‍රවේශ පත්‍රය ඉදිරිපත් නොකරන අපේක්ෂකයකුට විභාගයට පෙනී සිටීමට අවසර දෙනු නොලැබේ.

(ආ) අපේක්ෂකයෙකු තමාට නියම කර ඇති විභාග ශාලාවේ දී විභාගයට පෙනී සිටිය යුතුය. සෑම අපේක්ෂකයකු ම නියමිත විභාග ශාලාවට අදාළ ප්‍රවේශ පත්‍රය අත්සන සහතික කරවාගෙන පළමුවෙන් ම එම ශාලාවේ පෙනී සිටින දින, එහි ශාලාධිපති වෙත භාරදිය යුතුය. සෑම අපේක්ෂකයකු ම අනුගමනය කළයුතු නීති මාලාවක් මෙම *ගැසට් පත්‍රයේ* පළකර ඇත. විභාගය පැවැත්වීම සම්බන්ධයෙන් විභාග කොමසාරිස් ජනරාල් විසින් පනවනු ලබන නීතිරීතිවලට විභාග අපේක්ෂකයින් යටත් වේ. එම නීතිරීති උල්ලංඝනය කළහොත් විභාග කොමසාරිස් ජනරාල් විසින් පනවනු ලබන දඬුවමකට යටත්වීමට ඔහුට හෝ ඇයට සිදුවනු ඇත.

*සටහන.-* අපේක්ෂකයකුට විභාග ප්‍රවේශ පත්‍රයක් නිකුත් කිරීම ඔහු හෝ ඇය විභාගයට ඉදිරිපත්වීමට සුදුසුකම් සපුරා ඇති බවට පිළිගැනීමක් ලෙස සලකනු නොලැබේ.

10. *අපේක්ෂකයින්ගේ අනන්‍යතාව.*—තමා පෙනී සිටින සෑම විෂයක් සම්බන්ධයෙන් ම විභාග ශාලාධිපති සෑහීමකට පත් වන අයුරින් අපේක්ෂකයකු විභාග ශාලාවේ දී තම අනන්‍යතාව ඔප්පු කර සිටිය යුතුය. මේ සඳහා පහත සඳහන් ඕනෑම ලේඛනයක් පමණක් පිළිගනු ඇත. :

(අ) පුද්ගලයින් ලියාපදිංචි කිරීමේ දෙපාර්තමේන්තුව මගින් නිකුත් කර ඇති ජාතික හැඳුනුම්පත;

(ආ) වලංගු විදේශ ගමන් බලපත්‍රයක්.

11. *සාවද්‍ය තොරතුරු සැපයීමට දඬුවම්.*—අපේක්ෂයෙකුට සුදුසුකම් නොමැති බව අනාවරණය වුවහොත් විභාගයට කලින් හෝ විභාගය පවත්වන කාලයේ දී හෝ විභාගයෙන් පසුව හෝ ඕනෑම අවස්ථාවක දී ඔහුගේ අපේක්ෂකත්වය අවලංගු කිරීමට ඉඩ ඇත. අපේක්ෂකයෙකු ඉදිරිපත් කර ඇති කිසියම් කරුණක් සාවද්‍ය බව දැන දැනම ඉදිරිපත් කර ඇති බව හෙළි වුවහොත්, එසේ නැතිනම් යම් වැදගත් කරුණක් ඔහු/ඇය ඕනෑකමකින් යටපත් කර ඇත්නම් ඔහු/ඇය රජයේ සේවයෙන් පහ කිරීමට ඉඩ ඇත.

12. මෙම රෙගුලාසිවල සලකා නොමැති කරුණු පිළිබඳව රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ/අමාත්‍ය මණ්ඩලයේ උපදෙස්වලට යටත්ව ලේකම් තීරණය කරන පරිදි කටයුතු කරනු ඇත.

13. *විභාග ක්‍රමය හා විභාග මාධ්‍යය* :-

(අ) විභාගය සිංහල, දෙමළ සහ ඉංග්‍රීසි යන මාධ්‍යයන්ගෙන් පවත්වනු ලැබේ. විභාගයට ඉල්ලුම් කරන භාෂා මාධ්‍යය පසුව වෙනස් කිරීමට ඉඩ දෙනු නොලැබේ.

(ආ) අපේක්ෂකයකු විභාගයට පෙනී සිටිය යුතු වන්නේ සුදුසුකම් ලත් උපාධිය ලබාගත් භාෂාවෙන් ම හෝ රාජ්‍ය භාෂාවෙන් විය යුතුය.

(ඇ) අපේක්ෂකයකු සුදුසුකම් ලත් උපාධියේ විෂයයන් භාෂා දෙකකින් හෝ වැඩි ගණනකින් හෝ සමත් වී ඇත්නම් එම උපාධියේ දී ඔහු සමත් වූ විෂයයන්ගෙන් වැඩි ගණනකට පෙනී සිටි භාෂාවෙන් හෝ රාජ්‍ය භාෂාවකින් විභාගයට පෙනී සිටිය යුතුය.

(ඈ) ප්‍රධාන විෂයය එක භාෂාවකිනුත්, අතිරේක විෂයය තවත් භාෂාවකිනුත් සමත් වී ඇති විශේෂ උපාධියක් ඇති අපේක්ෂකයකු ප්‍රධාන විෂයයෙන් සාමාර්ථය ලත් භාෂාවෙන් හෝ රාජ්‍ය භාෂාවකින් හෝ විභාගයට පෙනී සිටිය යුතුය.

*සටහන* :-

(i) ඉහත (ආ) සහ (ඇ) හි ඇති සුදුසුකම් ලත් උපාධිය යන පදයෙන් අදහස් කෙරෙන්නේ 6(ii) ඡේදයේ ඇති උපාධි සුදුසුකම් වේ.

(ii) අපේක්ෂකයෙකු විභාගයේ දී පෙනී සිටින සියලුම ප්‍රශ්න පත්‍රවලට එකම භාෂාවකින් පිළිතුරු සැපයිය යුතුය.

(iii) තම ඉල්ලුම් පත්‍රයෙහි සඳහන් විභාග භාෂාව වෙනස් කිරීමට අපේක්‍ෂකයෙකුට ඉඩ දෙනු නොලැබේ.

14. *තෝරා ගැනීමේ ක්‍රමය.-* පහත සඳහන් විෂයයන්ගෙන් සමන්විත ලිඛිත පරීක්ෂණයක් :

(i) සාමාන්‍ය බුද්ධිය - කාලය පැය 01 යි - ලකුණු 100 යි,
(ii) රචනය හා සාරාංශය ලිවීම - කාලය පැය 02 යි - ලකුණු 100 යි,
(iii) සාමාන්‍ය දැනුම - කාලය පැය 02 යි - ලකුණු 100 යි,
(iv) කළමනාකරණ අභියෝග්‍යතාවය - කාලය පැය 02 යි - ලකුණු 100 යි.

අපේක්ෂකයින් විසින් සියලුම ප්‍රශ්න පත්‍ර සඳහා පෙනී සිටිය යුතුය.

*වාචික පරීක්ෂණය* : (ලකුණු 25 යි)

ලිඛිත පරීක්ෂණයේ සියලුම ප්‍රශ්න පත්‍රවලට පෙනී සිටි අයැදුම්කරුවන් අතරින් සුදුසුකම් ලැබුවන් වාචික පරීක්ෂණයට කැඳවනු ලැබේ. එක් එක් ප්‍රශ්න පත්‍රයට 40% ක් හෝ ඊට වැඩියෙන් ලබා ගත්තා වූ ද රාජ්‍ය සේවා කොමිෂන් සභාව/අමාත්‍ය මණ්ඩලය විසින් පුරප්පාඩු සංඛ්‍යාවට අනුකූලව ප්‍රමාණවත් බවට නියම කරනු ලබන ලකුණු සීමාවකට ඉහළින් මුළු ලකුණු ප්‍රමාණයක් ලබා ගත්තා වූ ද අපේක්ෂකයින් පමණක් සම්මුඛ පරීක්ෂණයට කැඳවනු ඇත. ඉහත සුදුසුකම් ලබන අයැදුම්කරුවන් ප්‍රමාණවත් සංඛ්‍යාවක් සිටී නම් පුරප්පාඩු සංඛ්‍යාව මෙන් දෙගුණයක් වන අපේක්ෂකයින් සංඛ්‍යාවක් වාචික පරීක්ෂණය සඳහා කැඳවනු ලැබේ. (ලකුණු ලබා දීමේ ක්‍රමය පත්වීම් බලධාරියා/රාජ්‍ය සේවා කොමිෂන් සභාව විසින් බඳවා ගැනීමේ මුල් අවස්ථාවේ දී අනුමත කරනු ලැබේ.)

15. ලිඛිත විභාගයට පෙනී සිටියා වූ ද, සම්මුඛ පරීක්ෂණයට සහභාගී වූ ද, අයදුම්කරුවන් අතුරින් ඉහළම මුළු ලකුණු ලැබූ අයදුම්කරුවන් කුසලතා අනුපිළිවෙලට පත්වීම් සඳහා තෝරාගනු ලැබේ. (සම්මුඛ පරීක්ෂණයට සහභාගී වීම පත්වීම් පිරිනැමීමට සුදුසුකම් සම්පූර්ණ කිරීමක් සේ සලකනු නොලැබේ.)

16. පත්කරනු ලබන සංඛ්‍යාව රාජ්‍ය සේවා කොමිෂන් සභාව/අමාත්‍ය මණ්ඩලය මගින් තීරණය කරනු ලැබේ.

17. *විෂය නිර්දේශය* :-

(i) *සාමාන්‍ය බුද්ධිය* (කාලය පැය 1 යි - ලකුණු 100 යි)

පදගත, සංඛ්‍යාත්මක සහ රූපාකර සංදර්භයක් තුළ ඉදිරිපත් කෙරෙන ගැටලු සම්බන්ධයෙන් අයදුම්කරුගේ නිගමනයන් සහ ප්‍රතිචාරයන් පරීක්ෂා කිරීම තුළින් අයදුම්කරුගේ අවබෝධ කර ගැනීමේ ශක්තිය හා බුද්ධිය මැනීම මෙයින් අපේක්ෂා කෙරේ.

(ii) *රචනය සහ සාරාංශය ලිවීම* (කාලය පැය 2 යි ලකුණු 100 යි)

දෙන ලද මාතෘකාවන්/තේමාවන් සමූහයක් අතුරෙන් අපේක්ෂකයා විසින් ම තෝරා ගන්නා ලද මාතෘකාවන්/තේමාවන් ඔස්සේ අදහස් සහ තොරතුරු ඉදිරිපත් කිරීම ගොනු කිරීම සහ විකාශනය කිරීම සම්බන්ධයෙන් අපේක්ෂකයා දක්වන තර්කනය හා පරිකල්පන ශක්තිය මැන බැලීමට සහ තරමක් සංකීර්ණ ඡේදයක්, ලියවිල්ලක් හෝ සංදේශයක් වටහා ගැනීමට සහ එහි ඇති ප්‍රධාන අදහස් තමාගේම වචනයෙන් සාරාංශ වශයෙන් පැහැදිලි ව සහ නිවැරදි ව ප්‍රකාශ කිරීමට අපේක්ෂකයා සතු හැකියාව මැන බැලීම මෙයින් අපේක්ෂා කෙරේ.

(iii) *සාමාන්‍ය දැනුම* (කාලය පැය 2 යි - ලකුණු 100 යි)

ජාතික, කලාපීය සහ ලෝකයේ විවිධ සංවිධාන පරිසරයන් තුළ මෙන්ම අප සමාජය තුළ පවතින සමාජයීය, සංස්කෘතික, අධ්‍යාපනික, විද්‍යාත්මක, දේශපාලනමය, ආර්ථික හා අනෙකුත් අදාළ සාධකයන් සම්බන්ධව අපේක්ෂකයා සතු දැනුවත්භාවය සහ අවබෝධය මැන බැලීම මෙයින් අපේක්ෂා කෙරේ.

(iv) *කළමනාකරණය සඳහා අභියෝග්‍යතාව* (කාලය පැය 2 යි - ලකුණු 100 යි)

ගැටලු හා ඒවාට හේතු හඳුනා ගැනීම, තීරණ ගැනීම, අන්තර් පුද්ගල සම්බන්ධතා පැවැත්වීම, සන්නිවේදන කුසලතාව, ස්වයං විනය ප්‍රතිපත්ති හා උපාය මාර්ග සකස් කිරීම යනාදී වශයෙන් අපේක්ෂකයෙකු සතු විශිෂ්ට කළමනාකරණ කුසලතාවයන් ඔහුට යොමු කරනු ලබන සිද්ධි හා ප්‍රස්ථාවයන් අනුසාරයෙන් නිර්ණය කිරීම මෙයින් අපේක්ෂා කෙරේ.

අමාත්‍ය මණ්ඩලයේ නියෝග පරිදි,

ඩී. දිසානායක,<br>
ලේකම්,<br>
රාජ්‍ය පරිපාලන හා<br>
ස්වදේශ කටයුතු අමාත්‍යාංශය.

2009 සැප්තැම්බර් මස 30 වැනි දින,<br>
රාජ්‍ය පරිපාලන හා ස්වදේශ කටයුතු අමාත්‍යාංශය,<br>
නිදහස් චතුරශ්‍රය,<br>
කොළඹ 07.

ආදර්ශ අයදුම්පත

[ ]

(කාර්යාලයීය ප්‍රයෝජනය සඳහා)

ශ්‍රී ලංකා පරිපාලන සේවයට බඳවා ගැනීම සඳහා වන විවෘත තරග විභාගය - 2009

Open Competitive Examination for Recruitment to the Sri Lanka Administrative Service - 2009

ඉල්ලුම්පත්‍රය

| 1.0 මාධ්‍යය— | 2.0 නගරය |
| --- | --- |
| විභාගයට පෙනී සිටින භාෂා මාධ්‍යය [ ]<br>සිංහල - 2<br>දෙමළ - 3<br>ඉංග්‍රීසි - 4<br><br>(අදාළ අංකය කොටුව තුළ ලියන්න) | විභාගයට පෙනී සිටීමට අපේක්ෂිත නගරය [ ]<br><br>එම නගර අංකය [ ][ ]<br><br>(ගැසට් නිවේදනයේ 1 වන ඡේදයට අනුව) (නගරය පසුව වෙනස් කිරීමට ඉඩ දෙනු නොලැබේ.) |

3.0 පෞද්ගලික තොරතුරු :

3.1 මුලකුරු අගට යොදා මුලකුරු සමග නම :———.
ඉංග්‍රීසි කැපිටල් අකුරෙන් [උදාහරණ (SILVA, A. B.)]

3.2 සම්පූර්ණ නම (ඉංග්‍රීසි කැපිටල් අකුරෙන්) :———.

3.3 සම්පූර්ණ නම (සිංහලෙන්/දෙමළෙන්) :———.

3.4 ස්ථිර ලිපිනය (ඉංග්‍රීසි කැපිටල් අකුරෙන්) (ප්‍රවේශ පත්‍රය මෙම ලිපිනයට තැපැල් කරනු ලැබේ) :———.

3.5 ස්ථිර ලිපිනය (සිංහලෙන්/දෙමළෙන්) :———.

3.6 ස්ත්‍රී/පුරුෂ භාවය (පුරුෂ -0, ස්ත්‍රී - 1) :
අදාළ අංකය කොටුව තුළ ලියන්න. [ ]

3.7 විවාහක/අවිවාහක බව :
අදාළ අංකය කොටුව තුළ ලියන්න. [ ]
(අවිවාහක -1, විවාහක -2)

3.8 ජන වර්ගය :
අදාළ අංකය කොටුව තුළ ලියන්න. [ ]
(සිංහල - 1, දෙමළ - 2 ඉන්දියානු දෙමළ - 3
මුස්ලිම් - 4, වෙනත් - 5).

3.9 ජාතික හැඳුනුම්පත් අංකය : [ | | | | | | | | | ]

3.10 උපන් දිනය : වර්ෂය [ | | | ] මාසය [ | ] දිනය [ | ]

3.11 ඉල්ලුම්පත්‍ර භාරගන්නා අවසාන දිනට වයස : අවුරුදු [ | ] මාස [ | ] දින [ | ]

4.0 ශ්‍රී ලංකා පරිපාලන සේවයට පත්කිරීම සඳහා වූ මීට පෙර පැවැත්වූ විභාගයට පෙනී සිටි වර්ෂ සඳහන් කරන්න :

(අ) ———
(ආ) ———
(ඇ) ———

5.0 (i) උපාධිය ලද දිනය (මෙම සුදුසුකම් ඇත්දැයි බැලීමට නිවේදනයේ 6 (ii) කරුණාකර හොඳින් කියවා බලන්න) :——.
(ii) විශ්වවිද්‍යාල/ආයතනය :———.
(iii) ලියාපදිංචි වූ අංකය :———.
(iv) බාහිර/අභ්‍යන්තර :———.
(v) උපාධිය :———.
(vi) විෂයයන් :———.
(vii) පන්තිය :———.
(viii) ඉහළ/පහළ :———.
(ix) විභාග අංකය :———.
(x) විභාගයට පෙනී සිටි භාෂා මාධ්‍යය :———.

6.0 මුදල් කුවිතාන්සිය මනා ලෙස අලවන්න :-

| (ලදු පත නොගැලවෙන සේ මෙහි අලවන්න)<br>(ලදුපතේ ඡායා පිටපතක් ළඟ තබාගැනීම ප්‍රයෝජනවත් වනු ඇත) |
|---|

7.0 අයදුම්කරුගේ සහතිකය :

මෙහි සඳහන් කර ඇති තොරතුරු මාගේ දැනීමේ හා විශ්වාසය පරිදි සත්‍ය බවත්, විභාග ගාස්තු ගෙවන ලද අංක……………හා ………… වැනි දින දරන මුදල් කුවිතාන්සිය මීට අලවා ඇති බවත් ප්‍රකාශ කරමි. තවද විභාග නීතිරීතිවලට අනුව ක්‍රියා කිරීමටත්, මෙම විභාගය පිළිබඳ කොන්දේසි අනුව මා නුදුසුස්සකු බව පෙනී ගියහොත්, විභාගයට පෙර හෝ එය පවත්වද්දී හෝ ඉන් පසුව හෝ මාගේ විභාග අපේක්ෂකත්වය අවලංගු කිරීමට ගනු ලබන යම් තීරණයකට මම එකඟ වෙමි. තවද විභාගය පැවැත්වීම සම්බන්ධයෙන් විභාග කොමසාරිස් ජනරාල් විසින් පනවනු ලබන නීතිරීතිවලට මම යටත් වන බව ද ප්‍රකාශ කරමි.

———,
අයදුම්කරුගේ අත්සන.

දිනය :———.

8.0 අයදුම්කරුගේ අත්සන සහතික කිරීම (*ගැසට් නිවේදනයේ 8 (ඈ) පරිදි විය යුතුය*) :

මෙම ඉල්ලුම් පත්‍රය ඉදිරිපත් කරන……………… (සම්පූර්ණ නම) යන අය මා පෞද්ගලිකව හඳුනන බවත්, නියමිත විභාග ගාස්තුව ගෙවා ඇති බවත්, එම ලදුපත අලවා ඇති බවත්, ………… දින ඔහුගේ/ඇයගේ අත්සන මා ඉදිරියේ දී තැබූ බවත් මම සහතික කරමි.

———,
(අත්සන සහතික කරන
නිලධාරියාගේ අත්සන)

දිනය :———.
අත්සන සහතික කරන නිලධාරියාගේ සම්පූර්ණ නම :———.
තනතුර :———.
ලිපිනය :———.
(නිල මුද්‍රාවකින් සනාථ කළ යුතුයි).

10-634

## සංශෝධනයයි

**ඉඩම් හා ඉඩම් සංවර්ධන අමාත්‍යාංශය**

මිනින්දෝරු දෙපාර්තමේන්තුව

ශ්‍රී ලංකා තාක්ෂණ සේවයේ ඡායාරේඛනමිතික ශිල්පී තනතුරේ පුහුණු කිරීමේ ශ්‍රේණියට බඳවා ගැනීම සඳහා පවත්වනු ලබන විවෘත තරග විභාගය

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ *ගැසට් පත්‍රයේ* 2009 සැප්තැම්බර් මස 25 දින පළ කරන ලද මිනින්දෝරු දෙපාර්තමේන්තුවේ ශ්‍රී ලංකා තාක්ෂණ සේවයේ ඡායාරේඛනමිතික ශිල්පී තනතුරේ පුහුණු කිරීමේ ශ්‍රේණියට බඳවාගැනීමට අදාළ අධ්‍යාපන සුදුසුකම් පහත සඳහන් පරිදි සංශෝධනය විය යුතුය.

(අ) භාෂාව හෝ සාහිත්‍යය, ගණිතය, විද්‍යාව සහ තවත් එක් විෂයයකට සම්මාන සහිතව විෂයයන් 06 කින් අ.පො.ස. (සා. පෙ.) විභාගය දෙවරකට නොවැඩි වාර ගණනක දී සමත්වීම සහ ක්ෂේත්‍රයට අදාල විෂයයන් එනම්, ශුද්ධ ගණිතය, ව්‍යවහාරික ගණිතය, සංයුක්ත ගණිතය, භෞතික විද්‍යාව හා රසායන විද්‍යාව යන විෂයයන් අතරින් විෂයයන් දෙකක් සහිතව විද්‍යා විෂයයන් තුනකින් (03) අ.පො.ස. (උ.පෙ.) විභාගය එකවර සමත්වීම,

හෝ

(ආ) ඉහත (අ) හි සඳහන් මූලික අධ්‍යාපන සුදුසුකම් සහිතව රජයේ පිළිගත් කාර්මික විද්‍යාලයක ක්ෂේත්‍රයට අදාළ ජාතික තාක්ෂණ සහතිකය (තුන් අවුරුදු අර්ධකාලීන පුහුණු පාඨමාලාව) හෝ සැලසුම් ශිල්පය පිළිබඳ එක් අවුරුදු පූර්ණකාලීන පුහුණු පාඨමාලාව සාර්ථකව සම්පූර්ණ කර අදාළ සහතිකය ලබා තිබීම.

සටහන - විවෘත තරග විභාගයෙන් තාක්ෂණ සේවයේ පුහුණු කිරීමේ ශ්‍රේණියට සුදුසුකම් ලබන, එනම්,

(i) (අ) ඡේදයේ සඳහන් සුදුසුකම් සහිත අයදුම්කරුවන් සේවයට අදාළ විෂයය නිර්දේශය අනුව ලබා ගන්නා දෙවසරක න්‍යායාත්මක හා ප්‍රායෝගික පුහුණුව සාර්ථකව නිම කොට අදාළ විභාගය සමත්වීමෙන් පසු III ශ්‍රේණියේ වැටුප් පරිමාණයේ ආරම්භක පියවරේ තබනු ඇත.

(ii) (ආ) ඡේදයේ සඳහන් සුදුසුකම් සහිත අයදුම්කරුවන් සේවයට අදාළ විෂයය නිර්දේශය අනුව ලබා ගන්නා එක් වසරක න්‍යායාත්මක හා ප්‍රායෝගික පුහුණුව සාර්ථකව නිම කොට අදාළ විභාගය සමත්වීමෙන් පසු III ශ්‍රේණියේ වැටුප් පරිමාණයේ ආරම්භක පියවරේ තබනු ඇත.

ඒ අනුව මෙම තනතුරට බඳවාගැනීමට අයදුම්පත් කැඳවීමේ අවසන් දිනය 2009.11.03 දින දක්වා දීර්ඝ කර ඇත.

මේ වන විට ඉදිරිපත් කර ඇති ඉහත සුදුසුකම් සපුරා නැති අයදුම්පත් ප්‍රතික්ෂේප කිරීමට සිදුවන බව ද දන්වමි.

එස්. එම්. ඩබ්. ප්‍රනාන්දු,
සර්වේයර් ජනරාල්.

2009 ඔක්තෝබර් මස 02 වැනි දින,
මිනින්දෝරු දෙපාර්තමේන්තුව,
කොළඹ 05.

10-630

**උසස් අධ්‍යාපන අමාත්‍යංශය - ශ්‍රී ලංකා උසස් තාක්‍ෂණ අධ්‍යාපන ආයතනය**

වෘත්තීය සංවර්ධනය සඳහා මග

**උසස් තාක්‍ෂණ ආයතන සඳහා සිසුන් ඇතුළත් කිරීම - 2010 අධ්‍යයන වර්ෂය**

ශ්‍රී ලංකා උසස් තාක්ෂණ අධ්‍යාපන ආයතනය (SLIATE) මගින් මෙහෙයවන මෙහි පහත දැක්වෙන උසස් ජාතික ඩිප්ලෝමා හා ජාතික ඩිප්ලෝමා පාඨමාලා සඳහා 2008 වර්ෂයේ හෝ ඊට පෙර වර්ෂවල පැරණි හා නව නිර්දේශය යටතේ අ.පො.ස. (උ./පෙළ) සමත් අදාළ සුදුසුකම් ඇති අපේක්ෂකයින්ගෙන් අයදුම්පත් කැඳවනු ලැබේ.

*අයදුම්පත් :*

ආදර්ශ අයදුම්පත පහත දක්වා ඇත. එම ආදර්ශ අයදුම්පත්‍රයට අනුව සකස්කර ගන්නා ලද අයදුම්පත්‍රයක් ඉංග්‍රීසියෙන් සම්පූර්ණ කර රු. 250 ක මුදලක් කොළඹ මහජන බැංකු උද්‍යාන වීදියේ ශාඛාවෙන් හෝ ශ්‍රී ලංකාවේ වෙනත් ඕනෑම මහජන බැංකු ශාඛාවක් මගින් අංක 025-100133397613 දරන ශ්‍රී ලංකා උසස් තාක්ෂණ අධ්‍යාපන ආයතන ජංගම ගිණුමට බැරකොට ලබාගන්නා ලද කුවිතාන්සිය අයදුම්පතේ අලවා ඔබගේ අයදුම්පත "අ" කොටසේ සඳහන් පාඨමාලා පැවැත්වෙන උසස් තාක්‍ෂණ ආයතනයට හෝ උසස් තාක්‍ෂණ ආයතන අංශයට ලියාපදිංචි තැපැලෙන් එවිය යුතුය. ලියුම් කවරයෙහි වම් පස ඉහළ කෙළවරෙහි ඔබ විසින් අයදුම් කරනු ලබන පාඨමාලාවේ නම සඳහන් කළ යුතුය. එක් ආයතනයකට වඩා අයදුම් කරන්නේ නම් අයදුම්කරනු ලබන සෑම අයදුම් පත්‍රයක් සඳහාම වෙන වෙනම රු. 250 ක වටිනාකමින් යුත් කුවිතාන්සි සමගින් අයැදුම්පත් ඉදිරිපත් කළ යුතුය. උක්ත අංක දරන ගිණුමට හැර වෙනත් ගිණුම්වලට බැර කරන ලද කුවිතාන්සි සහිත අයදුම්පත් හා අසම්පූර්ණ අයදුම්පත් ප්‍රතික්ෂේප කෙරේ.

අයදුම්පත් භාරගන්නා අවසන් දිනට පසු ලැබෙන අයදුම්පත් ප්‍රතික්ෂේප කරනු ලැබේ.

"අ" කොටසෙහි ශ්‍රී ලංකා උසස් තාක්ෂණ අධ්‍යාපන ආයතනයට අයත් උසස් තාක්‍ෂණ ආයතන/ආයතන අංශවල පවත්වනු ලබන පාඨමාලා හා ලිපිනයන් දක්වා ඇති අතර අයදුම්කරුවන් තම සුදුසුකම් හා සරිලන පාඨමාලා තෝරා ගත යුත්තේ "ආ" කොටසෙහි සඳහන් පාඨමාලා ලැයිස්තුව තුළිනි.

*දේශන පැවැත්වෙන ආකාරය :*

පූර්ණකාලීන පාඨමාලා සඳහා දේශන සතියේ දිනවල දිවා කාලයේ ද අර්ධකාලීන පාඨමාලා සඳහා දේශන සති අන්ත දිවා කාලයේ ද පැවැත්වේ. අර්ධකාලීන පාඨමාලා අදාළ ක්ෂේත්‍රයේ රැකියාවන්හි නියුක්ත අයට පමණක් සීමා කෙරේ.

*පාඨමාලා ගාස්තු :*

දිවා පාඨමාලා සඳහා ගාස්තු අය කරනු නොලැබේ. අර්ධකාලීන ඉංග්‍රීසි පාඨමාලා සඳහා සෑම සමාසිකයකටම රු. 2,000 බැගින් අයකරනු ලැබේ. උසස් ජාතික ගණකාධිකරණ පාඨමාලාවේ 1 වැනි හා දෙවැනි වසර සඳහා රු. 2,000 ක් ද තෙවැනි හා සිව්වැනි වසර සඳහා රු. 3,000 ක් ද සෑම සමාසිකයකටම අයකරනු ලැබේ. (වසරකට සමාසික දෙකකි). මෙම ගාස්තු වාර්ෂිකව සංශෝධනයකට යටත්වේ.

*සම්මුඛ පරීක්ෂණය :*

සුදුසුකම් අනුව තෝරාගත් අයදුම්කරුවන් අභියෝගතා පරීක්ෂණයට හා/හෝ සම්මුඛ පරීක්‍ෂණයකට පෙනී සිටිය යුතුය. ශිෂ්‍යයන් තෝරාගැනීම මූලිකව උසස් පෙළ විභාගයේ දී ලබාගත් ඒකාබද්ධ ලකුණු හෝ Z-score මත පදනම් වේ. සම්මුඛ පරීක්‍ෂණය සඳහා දිනය, වේලාව, ස්ථානය හා ඉදිරිපත් කළ යුතු ලිපි ලේඛන ආදී විස්තර අදාළ ආයතන ප්‍රධානීන් විසින් ලිපියකින් පෞද්ගලිකව දන්වා එවනු ඇත. **මුල් සහතික නොමැති අවස්ථාවල දී ලියාපදිංචියේ දී ඒවා ඉදිරිපත් කිරීමේ එකඟතාවය මත පමණක් සහතික කළ ඡායාපිටපත් භාරගනු ලැබේ.**

*නේවාසික පහසුකම් :*

දෙහිවල හා නයිවල උසස් තාක්ෂණ ආයතනවල සීමිත කාන්තා නේවාසිකාගාර පහසුකම් හා අම්පාර හාඩි උසස් තාක්ෂණ ආයතනයේ ද සීමිත කාන්තා/පිරිමි නේවාසිකාගාර පහසුකම් ඇත. මෙම පහසුකම් ලබාදෙනුයේ පූර්ණ කාලීන පාඨමාලා සඳහා ලියාපදිංචි වූ සුදුසුකම් ලත් සිසුන්ගේ ස්ථිර පදිංචියේ දුරස්ථභාවය අනුව පමණි.

" අ " කොටස

*උසස් තාක්ෂණ ආයතන/උසස් තාක්ෂණ ආයතන අංශ, ඒවායේ සංකේත අංක , ලිපිනයන් හා දුරකථන අංක :*

| සංකේත අංකය | ආයතන | ලිපිනයන් | දුරකථන අංක | |
|---|---|---|---|---|
| 01. | උසස් තාක්ෂණ ආයතනය, දෙහිවල | වෛද්‍ය පාර, දෙහිවල | 011-2714270 | 011-2738349 |
| 02. | උසස් තාක්ෂණ ආයතනය, ගාල්ල | කළුවැල්ල, ගාල්ල | 091-2244550 | 091-2223774 |
| 03. | උසස් තාක්ෂණ ආයතනය, මහනුවර | අංක 16,කැප්පෙටිපොල පාර, මහනුවර | 081-2226644 | 081-2232097 |
| 04. | උසස් තාක්ෂණ ආයතනය, කුරුණෑගල | අංක 22/1, විල්ගොඩ පාර, කුරුණෑගල | 037-2224911 | 037-2229583 |
| 05. | උසස් තාක්ෂණ ආයතනය, බදුල්ල | ග්‍රීන්ලන්ඩ් ඩ්‍රයිව් , බදුල්ල | 055-2230218 | 055-2223818 |
| 06. | උසස් තාක්ෂණ ආයතනය, යාපනය | අංක 78, පලාලි පාර, යාපනය | 021-2222595 | - |
| 07. | උසස් තාක්ෂණ ආයතනය, නයිවල | නයිවල, එස්සැල්ල, වේයන්ගොඩ | 033-2287519 | 033-2292544 |
| 08. | හාඩි උසස් තාක්ෂණ ආයතනය, අම්පාර | ඉඟිනියාගල පාර, අම්පාර | 063-2223035 | 063-2222056 |
| 09. | උසස් තාක්ෂණ ආයතනය, ත්‍රිකුණාමලය | සෙල්වනායගම්පුරම්, උප්පුවේලි, ත්‍රිකුණාමලය | 026-2223232 | 060-2222593 |
| 10. | උසස් තාක්ෂණ ආයතනය, ලබුදූව | සිරිධම්ම මාවත, ලබුදූව, අක්මීමන | 091-2227880 | 091-2246179 |
| 11. | උසස් තාක්ෂණ ආයතනය, කෑගල්ල | බණ්ඩාරනායක මාවත, කෑගල්ල | 035-2221297 | - |
| 12. | උසස් තාක්ෂණ ආයතන අංශය, අනුරාධපුරය | කාර්මික විද්‍යාලය, නව නගරය, අනුරාධපුරය | 025-2234417 | - |
| *13. | උසස් තාක්ෂණ ආයතන අංශය, රත්නපුරය | අංක 14, නව වෙළඳ සංකීර්ණය, රත්නපුරය | 045-2230780 | - |
| 14. | උසස් තාක්ෂණ ආයතන අංශය, සමන්තුරේ | මහ වීදිය, සමන්තුරේ | 067-2261304 | - |
| 15. | උසස් තාක්ෂණ ආයතන අංශය, මඩකලපුව | කාර්මික විද්‍යාලය, මාන්චන්තුඩුවෙයි, මඩකලපුව | 065-2247519 | - |
| *16. | උසස් තාක්ෂණ ආයතන අංශය, තංගල්ල | ධීවර හා නාවික ඉංජිනේරු විද්‍යාලය, මහවෙල පාර, තංගල්ල | 047-2242327 | 091-2244550 |

* රත්නපුරය හා තංගල්ල උසස් තාක්ෂණ ආයතන අංශවල ලිපිනයන් 2010 ජනවාරි මාසයේ දී වෙනස්විය හැකිය.

**පාඨමාලා හා ඒවා පැවැත්වෙන ආයතන, සහ ආයතන අංශ :**

| පාඨමාලාව | කාලය වසර | පාඨමාලා පැවැත්වෙන ආයතනයන්හි සංකේත අංක |
|---|---|---|
| 1. උසස් ජාතික ගණකාධිකරණ ඩිප්ලෝමා (උ.ජා.ග.ඩි) - දිවා/පූර්ණකාලීන | 4 | 1,2,3,4,5,6,7,9,11,12,14,15 |
| 1.1 උසස් ජාතික ගණකාධිකරණ ඩිප්ලෝමා - සතිඅන්ත/අර්ධකාලීන | 4 | 1,2,3,4,5,6,7,9,11,12,13,14,15,16 |
| 2. උසස් ජාතික කළමනාකරණ ඩිප්ලෝමා (උ.ජා.ක.ඩි.) - දිවා/පූර්ණකාලීන (ඉංග්‍රීසි මාධ්‍යය) | 3 | 1,2,3,4,5,6 |
| 3. උසස් ජාතික තොරතුරු තාක්ෂණ ඩිප්ලෝමා (උ.ජා.තො. තා.ඩි.) - දිවා/පූර්ණකාලීන (ඉංග්‍රීසි මාධ්‍යය) | 2 1/2 | 3,4,5,6,7,8,9,10,11 |
| 4. උසස් ජාතික තාක්ෂණික ඩිප්ලෝමා - කෘෂිකර්මය (උ.ජා.තා.ඩි.) - දිවා/පූර්ණකාලීන (ඉංග්‍රීසි මාධ්‍යය) | 3 | 7,8,10 |
| 5. උසස් ජාතික ඉංග්‍රීසි ඩිප්ලෝමා (උ.ජා.ඩි.- ඉංග්‍රීසි) දිවා/පූර්ණකාලීන | 2 | 1,2,3,4,5,6,8,11 |
| 5.1 උසස් ජාතික ඉංග්‍රීසි ඩිප්ලෝමා (උ.ජා.ඩි-ඉංග්‍රීසි) සතිඅන්ත/අර්ධකාලීන | 2 | 1,2,3,4,5,6,8,9,11,12,14,15 |
| 6. උසස් ජාතික ව්‍යාපාර අධ්‍යයන ඩිප්ලෝමා (උ.ජා.ව්‍යා.අ.ඩි.) - දිවා /පූර්ණකාලීන (ඉංග්‍රීසි මාධ්‍ය) | 3 | 1,2,3,5,6 |
| 7. ව්‍යාපාර මූල්‍ය ජාතික ඩිප්ලෝමා (ව්‍යා.මු.ජා.ඩි.) - දිවා/පූර්ණකාලීන (ඉංග්‍රීසි මාධ්‍ය) | 2 | 1 |

*සැලකිය යුතුයි :*

1. සියලුම පාඨමාලාවලට අදාළ විෂයය නිර්දේශ සංශෝධනයට යටත්ව ඇති අතර, 2010 වර්ෂයේ දී ඇතැම් පාඨමාලා සංශෝධිත විෂයය නිර්දේශයට අනුව ක්‍රියාත්මක වන අතර, එහි දී පාඨමාලා කාලය වෙනස් විය හැකිය.
2. උසස් ජාතික ගණකාධිකරණ ඩිප්ලෝමා (දිවා/පූර්ණකාලීන) පාඨමාලාව පළමු සහ දෙවන වසර සිංහල හෝ දෙමළ මාධ්‍යයෙන් සතියේ දිනවල දිවා කාලයේ ද, තෙවන, සිව්වන වසර ඉංග්‍රීසි මාධ්‍යයෙන් සති අන්තයේ ද දේශන පවත්වනු ඇත.
3. උසස් ජාතික කළමනාකරණ ඩිප්ලෝමා පාඨමාලාව (පූර්ණකාලීන) පළමු හා දෙවන වසර සතියේ දිනවල දිවා කාලයේ දී දේශන පවත්වනු ලබන අතර තෙවන වසර සඳහා දේශන පවත්වනු ලබන්නේ සති අන්තයේ දී ය.
4. අ.පො.ස. (උ.පෙ.) නව නිර්දේශය යටතේ අයදුම්කරන්නන් සාමාන්‍ය පොදු පරීක්ෂණය සමත්ව තිබීම අනිවාර්ය වේ.
5. ඒ ඒ පාඨමාලාවන්ට තෝරා ගැනීමේ දී අ.පො.ස. (උ.පෙ) ඒකාබද්ධ ලකුණු හෝ Z-Score සැලකිල්ලට ගනු ලැබේ.
6. සුදුසුකම් ලද විභාගයේ දී පාඨමාලාවට අදාළ විෂයයන්ගෙන්/විෂයය ක්ෂේත්‍රයේ සාමාර්ථයක් ලත් අය කෙරෙහි වැඩි සැලකිල්ලක් දක්වනු ලැබේ.

7. දිවා/පූර්ණකාලීන පාඨමාලාව සඳහා වයස අවු. 22ට අඩු අය කෙරෙහි වැඩි සැලකිල්ලක් දක්වනු ලැබේ.

8. ශ්‍රී ලංකාවේ විශ්වවිද්‍යාලයක /අනුබද්ධිත විශ්වවිද්‍යාල ආයතනයක, කාර්මික විද්‍යාලයක, අධ්‍යාපන විද්‍යා පීඨයක /ගුරු පුහුණු ආයතනයක හෝ වෙනත් උසස් තාක්ෂණ ආයතනයක අභ්‍යන්තර ශිෂ්‍යයෙකු වශයෙන් පාඨමාලාවක් හැදෑරීම සඳහා ලියාපදිංචි වී ඇති සිසුන් ශ්‍රී ලංකා උසස් තාක්ෂණ අධ්‍යාපන ආයතනයේ දිවා/පූර්ණ කාලීන පාඨමාලාවන් හැදෑරීම සඳහා බඳවා ගැනීමට සුදුසුකම් නොලබයි. කිසියම් ශිෂ්‍යයෙකු පාඨමාලාව හදාරන එකම කාලය තුළ දී වෙනත් ඉහත දැක්වූ රජයේ ආයතනයක පූර්ණකාලීන ශිෂ්‍යයෙකු ලෙස පාඨමාලාවන් හදාරන බව හෙළිදරවු වුවහොත් ඔවුන්ගේ ලියාපදිංචිය ශ්‍රී ලංකා උසස් තාක්ෂණ අධ්‍යාපන ආයතනය විසින් අවලංගු කරන බව ද සැලකිය යුතුය. ශ්‍රී ලංකා උසස් තාක්ෂණ අධ්‍යාපන ආයතනයේ ලියාපදිංචි සිසුන් සඳහා ශ්‍රී ලංකා විශ්වවිද්‍යාලයක ලියාපදිංචිය අහිමි බව ද සැලකිය යුතුය.

9. කුමන හේතුවක් නිසා හෝ තෝරා ගැනීමෙන් පසු පූර්ණකාලීන සිසුන් අදාළ පාඨමාලාව හැදෑරීම සඳහා වෙනත් උසස් තාක්ෂණ ආයතනයකට හෝ ආයතන අංශයකට මාරු කරනු නොලැබේ.

### "*ආ*" කොටස

පාඨමාලාවලට ඇතුළත් වීම සඳහා අවශ්‍ය සුදුසුකම් පහත දැක්වේ:-

01. ***උසස් ජාතික ගණකාධිකරණ ඩිප්ලෝමා (දිවා/පූර්ණකාලීන)***

පහත සඳහන් සුදුසුකම් අතරින් එකක් :-

(i) අ.පො.ස. (උ.පෙ.) පැරණි නිර්දේශය යටතේ ශුද්ධ ගණිතය හෝ ගණකාධිකරණය විෂයය ඇතුළත්ව විෂයයන් හතරෙන්ම සාමාර්ථය ලබා තිබීම. මින් විෂයයන් දෙකකට එම අවස්ථාවේම හෝ වෙනත් අවස්ථාවක දී හෝ සම්මාන සාමාර්ථ ලබා තිබිය යුතුය.

අ.පො.ස. (උ.පෙ.) විභාගයේ දී ශුද්ධ ගණිතය හෝ ගණකාධිකරණ විෂයයන්ට සම්මාන සාමාර්ථයක් ලබා නැත්නම් අ.පො.ස. (සා.පෙ.) විභාගයේ දී ගණිතය විෂයයට සම්මාන සාමාර්ථයක් ලබා තිබිය යුතුය;

*හෝ*

(ii) අ.පො.ස. (උ.පෙ.) නව නිර්දේශය යටතේ සංයුක්ත ගණිතය/ගණකාධිකරණය විෂයය ඇතුළුව විෂයයන් තුනෙන්ම සාමාර්ථය ලබා තිබිය යුතුය. මෙම විෂයයන් තුනෙන් විෂයයන් දෙකකට සම්මාන ලබා තිබිය යුතුය. සංයුක්ත ගණිතය/ගණකාධිකරණය විෂයය සඳහා සම්මාන සාමාර්ථයක් ලබා නැත්නම් අ.පො.ස. (සා.පෙ.) විභාගයේ දී ගණිතය විෂයයට සම්මාන සාමාර්ථයක් ලබා තිබිය යුතුය;

*හෝ*

(iii) කාර්මික අධ්‍යාපන හා පුහුණු කිරීමේ දෙපාර්තමේන්තුව විසින් පවත්වනු ලබන ගණක ශිල්පීය ජාතික සහතිකය සමත්වීම.

*සහ*

(iv) අ.පො.ස. (සා.පෙ.) විභාගයේ දී ඉංග්‍රීසි භාෂාව විෂයයට සාමාන්‍ය සාමාර්ථයක් ලබා තිබිය යුතුය.
අ.පො.ස. (උ.පෙළ) පැරණි නිර්දේශය යටතේ විෂයයන් හතරෙන් හෝ නව නිර්දේශය යටතේ විෂයයන් තුනෙන් ලබාගත් ඉහළම ලකුණු තෝරා ගැනීමේ පදනම වේ.

1.1 ***උසස් ජාතික ගණකාධිකරණ ඩිප්ලෝමා (අර්ධ කාලීන)***

පහත සඳහන් සුදුසුකම් අතුරෙන් එකක් :-

(i) පිළිගත් විශ්වවිද්‍යාලයක උපාධියක් හෝ අන්තර් මාධ්‍ය පරීක්ෂණය හෝ සමත්වීම;
(ii) අ.පො.ස. (උ.පෙ.) පැරණි නිර්දේශය යටතේ එක් අවස්ථාවක දී විෂයයන් හතරකින් හෝ නව නිර්දේශය යටතේ එක් අවස්ථාවක දී විෂයයන් තුනකින් සාමාර්ථයක් ලබා තිබීම;
(iii) කාර්මික අධ්‍යාපන හා පුහුණු කිරීමේ දෙපාර්තමේන්තුව විසින් පවත්වනු ලබන ගණක ශිල්පීය ජාතික සහතිකය සාමාර්ථයක් ලබා තිබීම; කාර්මික අධ්‍යාපන හා පුහුණු කිරීමේ දෙපාර්තමේන්තුව විසින් පවත්වනු ලබන ව්‍යාපාර අධ්‍යයන ජාතික සහතිකය (ගණකාධිකරණය) සාමාර්ථයක් ලබා තිබීම;
(iv) කාර්මික අධ්‍යාපන හා පුහුණු කිරීමේ දෙපාර්තමේන්තුව විසින් පවත්වනු ලබන ගණකාධිකරණය පිළිබඳ ජාතික සහතිකය සාමාර්ථයක් ලබා තිබීම.

*සැ. යු. (අ)* *ප්‍රායෝගික පළපුරුද්ද.*—අයදුම්කරු රජයේ, ව්‍යවස්ථාපිත මණ්ඩලයක හෝ පිළිගත් ආයතනයක අදාළ ක්ෂේත්‍රයේ රැකියාවක නිරතව සිටින අයෙකු විය යුතුය.

*(ආ)* පහත සඳහන් සුදුසුකම් දරන්නන් උසස් ජාතික ගණකාධිකරණ ඩිප්ලෝමාවේ ප්‍රථම වසරින් නිදහස් කර එහි 11 වසරට බඳවා ගැනීම සෙසු අවශ්‍යතාවන් සපුරාලීමේ හා ඉඩකඩ තිබීමේ කොන්දේසියට යටත්ව අනුමත කර ඇත.

(i) ව්‍යාපාර අධ්‍යයන/මූල්‍ය පිළිබඳ ජාතික ඩිප්ලෝමාව
(ii) උසස් ජාතික වාණිජ/කළමනාකරණ ඩිප්ලෝමා හෝ එහි II වසර පරීක්ෂණය
(iii) විද්‍යාවේදී (ව්‍යාපාර පරිපාලන) උපාධිය
(iv) වාණිජවේදී උපාධිය
(v) විද්‍යාවේදී (ගණකාධිකරණය) උපාධිය
(vi) ශ්‍රී ලංකා වරළත් ගණකාධිකාරී ආයතනයේ I සහ II පරීක්‍ෂණය
(vii) වරළත් කළමණාකාරිත්ව හා ගණකාධිකරණ ආයතනයේ I සහ II පරීක්‍ෂණය
(viii) ශ්‍රී ලංකා ගණකාධිකරණ ශිල්පීය ආයතනයේ III අදියර පරීක්‍ෂණය

**02. උසස් ජාතික කළමනාකරණ ඩිප්ලෝමා (දිවා/පූර්ණ කාලීන)**

පහත සඳහන් සුදුසුකම් අතුරින් එකක් :-

(i) ඕනෑම විෂය ධාරාවකින් අ.පො.ස. (උ.පෙ.) පැරණි නිර්දේශය යටතේ එක් වරක දී විෂයයන් හතරකින් සමත්වීම හෝ නව නිර්දේශය යටතේ එකවරක දී විෂයයන් තුනකින් සමත්වීම සහ අ.පො.ස. (සා.පෙ.) විභාගයේ දී ගණිතය හා ඉංග්‍රීසි භාෂාවට සාමාන්‍ය සාමාර්ථ ලබා තිබීම;

*හෝ*

(ii) කාර්මික අධ්‍යාපන හා පුහුණු කිරීම් දෙපාර්තමේන්තුව මගින් පවත්වනු ලබන ගණක ශිල්පීන් සඳහා වූ ජාතික සහතික පත්‍රය හෝ රාජ්‍ය පරිපාලනය හෝ අලෙවිකරණය සඳහා වූ ව්‍යාපාර අධ්‍යයන ජාතික සහතිකය සමත්වීම;

සහ

අ.පො.ස. (සා.පෙ.) විභාගයේ දී ගණිතය හා ඉංග්‍රීසි භාෂාවට සාමාර්ථයක් ලබා තිබීම.

**03. උසස් ජාතික තොරතුරු තාක්‍ෂණ ඩිප්ලෝමා (දිවා/පූර්ණ කාලීන)**

පහත සඳහන් සුදුසුකම් අතුරින් එකක්.

(i) අ.පො.ස. (උ.පෙ.) පැරණි නිර්දේශය යටතේ භෞතික විද්‍යාව/කෘෂි විද්‍යාව, ශුද්ධ ගණිතය හා ගණකාධිකරණය යන විෂයයන් අතරින් එකක් සහිතව විෂයයන් හතරකින් එකවර සමත්වී තිබීම;

*හෝ*

(ii) අ.පො.ස. (උ.පෙළ) පැරණි නිර්දේශය යටතේ භෞතික විද්‍යාව/කෘෂි විද්‍යාව, සත්ත්ව විද්‍යාව, උද්භිද විද්‍යාව, රසායන විද්‍යාව යන විෂයයන් අතරින් එකක් සහිතව විෂයයන් හතරකින් එකවර සමත්වී තිබීම;

*හෝ*

(iii) අ.පො.ස. (උ.පෙළ,) නව නිර්දේශය යටතේ භෞතික විද්‍යාව/කෘෂි විද්‍යාව, සංයුක්ත ගණිතය හා ගණකාධිකරණය යන විෂයයන් අතරින් එකක් සහිතව විෂයයන් තුනකින් එකවර සමත්වී තිබීම;

*හෝ*

(iv) අ.පො.ස. (උ.පෙළ,) නව නිර්දේශය යටතේ භෞතික විද්‍යාව/කෘෂි විද්‍යාව , ජීව විද්‍යාව, රසායන විද්‍යාව යන විෂයයන් අතරින් එකක් සහිතව විෂයයන් තුනකින් එකවර සමත්වී තිබීම;

*සහ*

(v) අ.පො.ස. (සා.පෙ.) විභාගය සඳහා ඉංග්‍රීසි භාෂාව විෂයයට හා ගණිතය විෂයයට සාමාන්‍ය සාමාර්ථයක් ලබා තිබීම.
කෘෂි විද්‍යාව අ.පො.ස. (උ.පෙ.) 1995 සිට ක්‍රියාත්මක වන නව විෂයය නිර්දේශය වේ.

**04. උසස් ජාතික තාක්ෂණික ඩිප්ලෝමා (කෘෂිකර්මය) (දිවා/පූර්ණ කාලීන)**

(i) අ.පො.ස. (උ.පෙ.) පැරණි නිර්දේශය යටතේ ජීව විද්‍යා අංශයෙන්, රසායන විද්‍යාව, කෘෂි විද්‍යාව, උද්භිද විද්‍යාව, භෞතික විද්‍යාව, හා සත්ත්ව විද්‍යාව යන විෂයයන් අතරින් දෙකක් සහිතව විෂයයන් හතරකින් එකවර සමත්වී තිබීම;

*හෝ*

(ii) එක් වතාවක දී අ.පො.ස. (උ. පෙ.) නව නිර්දේශය යටතේ ජීව විද්‍යා අංශයෙන්, රසායන විද්‍යාව, කෘෂි විද්‍යාව, ජීව විද්‍යාව, භෞතික විද්‍යාව යන විෂයයන්ගෙන් දෙකක් සහිතව විෂයයන් තුනකින් සමත්වී තිබීම;

සහ

(iii) අ.පො.ස. (සා.පෙ.) විභාගයේ දී ඉංග්‍රීසි භාෂාව විෂයයට හා ගණිතය විෂයයට සාමාන්‍ය සාමාර්ථයක් ලබා තිබීම.

**05. උසස් ජාතික ඉංග්‍රීසි පිළිබඳ ඩිප්ලෝමා - (පූර්ණ කාලීන/අර්ධ කාලීන)**

පහත සඳහන් සුදුසුකම් අතුරෙන් එකක් තිබිය යුතුය. :

(i) ඉංග්‍රීසි විෂයය ඇතුළුව අ.පො.ස. (උ.පෙ.) විෂයයන් තුනකින් සාමාර්ථය.
(ii) අ.පො.ස. (උ.පෙ.) විභාගයේ දී විෂයයන් තුනකින් සාමාර්ථය සහ අ.පො.ස. (සා.පෙ.) විභාගයේ දී ඉංග්‍රීසි සාහිත්‍ය පිළිබඳ සාමාර්ථයක් සහ ඉංග්‍රීසි භාෂාව විෂයයට සම්මාන සාමාර්ථය (සී).
(iii) අ.පො.ස. (උ.පෙ.) විභාගයේ දී විෂයයන් තුනකින් සාමාර්ථය සහ අ.පො.ස. (සා.පෙ.) විභාගයේ දී ඉංග්‍රීසි භාෂාව විෂයය සඳහා විශිෂ්ට සාමාර්ථය (ඒ හෝ බී).
(iv) ඉංග්‍රීසි (විශේෂ) ගුරු පුහුණු සහතිකය හෝ විද්‍යා පීඨ ඩිප්ලෝමා සහතිකය (ඉංග්‍රීසි).
(v) අ.පො.ස. (උ.පෙ.) විභාගයේ දී විෂයයන් තුනකින් සාමාර්ථය සහ කාර්මික අධ්‍යාපන හා පුහුණු කිරීමේ දෙපාර්තමේන්තුව විසින් පවත්වනු ලබන වාණිජ කර්මාන්ත සහ වැඩිදුර අධ්‍යාපනය සඳහා වන ඉංග්‍රීසි පිළිබඳ ජාතික සහතික පත්‍ර විභාගයෙන් සාමාර්ථය.

**06. උසස් ජාතික ව්‍යාපාර අධ්‍යයනය පිළිබඳ ඩිප්ලෝමා (දිවා/පූර්ණ කාලීන)**

පහත සඳහන් සුදුසුකම් අතුරෙන් එකක් තිබිය යුතුය :

(i) අ.පො.ස. (උ.පෙළ) පැරණි නිර්දේශය යටතේ ආර්ථික විද්‍යාව, වාණිජ හා මූල්‍ය සහ ගණකාධිකරණ යන විෂයයන් තුනෙන් අ.පො.ස. (උ.පෙ.) සාමාර්ථයක් හෝ ඉහත සඳහන් විෂයයන් දෙකකින් සහ ශුද්ධ ගණිතය, දේශපාලන විද්‍යාව, භූගෝල විද්‍යාව, සිංහල, දෙමළ, ඉංග්‍රීසි, තර්ක ශාස්ත්‍රය හෝ ඉතිහාසය, ව්‍යාපාර සංඛ්‍යානය යන විෂයයන් අතුරෙන් එක් විෂයයක් ද සාමාර්ථයක් ලබා තිබීම;

හෝ

(ii) අ.පො.ස. (උ.පෙ.) නව නිර්දේශය යටතේ ආර්ථික විද්‍යාව, ව්‍යාපාර අධ්‍යයනය හා ගිණුම්කරණය යන විෂයයන් තුනෙන් සාමාර්ථය හෝ ඉහත විෂයයන් දෙකක් සහ භූගෝල විද්‍යාව, ගෘහ ආර්ථික විද්‍යාව, දේශපාලන විද්‍යාව, තර්ක ශාස්ත්‍රය හා විද්‍යාත්මක ක්‍රමය, කෘෂි විද්‍යාව, සංයුක්ත ගණිතය හා ව්‍යාපාර සංඛ්‍යානය යන විෂයයන්ගෙන් එකක් ඇතුළුව විෂයයන් තුනකින් එක්වරක දී සාමාර්ථය ලබා තිබීම;

හෝ

(iii) කාර්මික අධ්‍යාපන හා පුහුණු කිරීමේ දෙපාර්තමේන්තුව විසින් පවත්වනු ලබන ගණක ශිල්පීන් සඳහා වූ ජාතික සහතිකය සාමාර්ථයක් ලබා තිබීම;

සහ

(iv) අ.පො.ස. (සා.පෙ.) විභාගය සඳහා ඉංග්‍රීසි භාෂාව විෂයයට හා ගණිතය විෂයයට සාමාන්‍ය සාමාර්ථයක් ලබා තිබීම.

**07. ව්‍යාපාර හා මූල්‍ය පිළිබඳ ජාතික ඩිප්ලෝමා (දිවා/පූර්ණකාලීන)**

පහත සඳහන් සුදුසුකම් අතරින් එකක් තිබිය යුතුය. :

(i) අ.පො.ස. (උ.පෙ.) පැරණි නිර්දේශය යටතේ ආර්ථික විද්‍යාව, වාණිජ හා මූල්‍ය ගණකාධිකරණය ඇතුළු විෂයයන් හතරකින් එක් වරක දී සමත්වී තිබීම;

හෝ

(ii) අ.පො.ස. (උ.පෙ.) නව නිර්දේශය යටතේ ආර්ථික විද්‍යාව සහ ව්‍යාපාර අධ්‍යයනය සහ ගිණුම්කරණය යන විෂයයන් තුනෙන් සාමාර්ථය හෝ ඉහත විෂයයන් දෙකක් සහ භූගෝල විද්‍යාව, ගෘහ ආර්ථික විද්‍යාව, දේශපාලන විද්‍යාව, තර්ක ශාස්ත්‍රය හා විද්‍යාත්මක ක්‍රමය, කෘෂි විද්‍යාව හෝ සංයුක්ත ගණිතය යන විෂයයන්ගෙන් එකක් ඇතුළුව එක් වරක දී විෂයයන් තුනකින් සමත්ව තිබීම;

සහ

(iii) අ.පො.ස. (සා.පෙ.) විභාගය සඳහා ඉංග්‍රීසි භාෂාව විෂයයට හා ගණිතය විෂයයට සාමාන්‍ය සාමාර්ථයක් ලබා තිබීම.

සටහන :

1. යාපනය, ත්‍රිකුණාමලය, සමන්තුරේ, මඩකලපුව හා දෙහිවල යන ආයතනයන්හි උසස් ජාතික ගණකාධිකරණ ඩිප්ලෝමා පාඨමාලාව දෙමළ මාධ්‍යයෙන් ද පැවැත්වේ. ත්‍රිකුණාමලය, උසස් තාක්‍ෂණ ආයතනයේ උසස් ජාතික ගණකාධිකරණ ඩිප්ලෝමා (පූර්ණ කාලීන) පාඨමාලාව සිංහල මාධ්‍යයෙන් ද පැවැත්වේ.

2. උසස් ජාතික ගණකාධිකරණ ඩිප්ලෝමා සහතිකය 2008 ඔක්තෝබර් රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ 46/90 (iii) අනුව පිළිගත් විශ්ව විද්‍යාලයක වානිජ විද්‍යාවේදී උපාධිය සාමාන්‍ය සාමාර්ථයට සමානව පිළිගෙන ඇත.

3. දෙහිවල උසස් තාක්‍ෂණ ආයතනයේ උසස් ජාතික ගණකාධිකරණ ඩිප්ලෝමා (අර්ධ කාලීන) පාඨමාලාව සිංහල, දෙමළ හා ඉංග්‍රීසි මාධ්‍යයෙන් ද, මහනුවර උසස් තාක්‍ෂණ ආයතනයේ උසස් ජාතික ගණකාධිකරණ ඩිප්ලෝමා (අර්ධ කාලීන) පාඨමාලාව සිංහල, දෙමළ මාධ්‍යයෙන් පැවැත්වේ.

4. ඔබගේ සුදුසුකම්වලට අනුව ඔබ ප්‍රවේශය සඳහා සලකා බැලීමට කැමති පාඨමාලා ඔබගේ කැමැත්තේ අනුපිළිවෙලින් සඳහන් කරන්න.

ශ්‍රී ලංකා උසස් තාක්‍ෂණ අධ්‍යාපන ආයතනයට 2010 අධ්‍යයන වර්ෂය සඳහා සිසුන් ඇතුළත් කිරීම සම්බන්ධයෙන් ශ්‍රී ලංකා උසස් තාක්‍ෂණ අධ්‍යාපන ආයතනයේ අධ්‍යක්‍ෂ ජනරාල්වරයාගේ තීරණය අවසාන තීරණය වේ.

අයදුම්පත් භාරගන්නා අවසාන දිනය 2009 නොවැම්බර් මස 06 වේ.

එච්. ටී. කමල් පත්මසිරි,
අධ්‍යක්ෂ ජනරාල්,
ශ්‍රී ලංකා උසස් තාක්‍ෂණ අධ්‍යාපන ආයතනය.

අංක 18/2, වෝඩ් පෙදෙස,
කොළඹ 07.
Web site : www.sliate.net

Office use only – Course Number ..........................................

*Specimen Application Form*

**SRI LANKA INSTITUTE OF ADVANCED TECHNOLOGICAL EDUCATION**

***Application Form for Admission to Higher National Diploma/National Diploma Course***

Name of the Institute/Institute Section :————.

| *Name of the Course* | *Order of Preference* | *Medium* |
|---|---|---|
| 1. ............................ | .......................................... | ................................ |
| 2. ............................ | .......................................... | ................................ |
| 3. ............................ | .......................................... | ................................ |

1. Name with initials :————.

2. Name/Names denoted by Initials :————.

3. Address :————.

4. Date of Birth :
   Year :————. Month :————. Date :————.

   Age (as at 01.01.2010) :
   Years :————. Months :————. Days :————.

5. National Identity Card No. :————.

6. Sex :————.
   Male/Female

7. Administrative District :————. Contac Number :————.

8. (i) Results of GCE (A/L) Examination ( in or before 2008)

Year :————. Index No. :————. Medium :————.

| *Pass Subjects* | *Grade* |
|---|---|
| 1. ...................................... | ...................................... |
| 2. ...................................... | ...................................... |
| 3. ...................................... | ...................................... |
| 4. ...................................... | ...................................... |

If under new syllabus indicate pass or fail in the general paper :————.

Aggregate/Average marks or Z-score of the above examination, issued by the Department of Examination :————.

(ii) Result of GCE (O/L) Examination :————.

Year : ...................................... Index No.: ...................................... Medium :...............

| *Subject* | *Grade* | *Subject* | *Grade* |
|---|---|---|---|
| 1. ...................................... | ...................................... | 6 . ...................................... | ...................................... |
| 2. ...................................... | ...................................... | 7 . ...................................... | ...................................... |
| 3. ...................................... | ...................................... | 8 . ...................................... | ...................................... |
| 4. ...................................... | ...................................... | 9 . ...................................... | ...................................... |
| 5. ...................................... | ...................................... | 10 . ...................................... | ...................................... |

9. Highest Qualification in English as a subject :————.

10. Details of Occupation :————. Date of Appointment :————.
(only for part-time/weekend courses)

Post :————.
E. P. F. Number :————.
Place of Work and Address :————.

I hereby declare that I am not following any other full-time course of study in any other state institution. I am aware that my registration will be cancelled at any time during the period of study if it is found that I concurrently follow a full-time course at any other state institution. I hereby certify that the information furnished here is true and accurate to the best of my knowledge.

————,
Signature of Applicant.

Date :————.

(The Bank receipt for Rs. 250 payable to SLIATE should be annexed).

10-557

## ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව

### දහම් පාසල් අවසාන සහතික පත්‍ර විභාගය - 2009

### ව්‍යවස්ථා සහ නිර්දේශ පත්‍රය

01. 2009 වසරට නියමිත දහම් පාසල් අවසාන සහතික පත්‍ර විභාගය, විභාග කොමසාරිස් ජනරාල් විසින් 2010 ජනවාරි මස 16 සහ පෙබරවාරි මස 14 අතර සති අන්තයක දී දිවයින පුරා පිහිටුවනු ලබන විභාග මධ්‍යස්ථානවල දී පවත්වනු ලැබේ.

02. *විභාග මධ්‍යස්ථාන.* - උපලේඛනයේ දක්වා ඇති සෑම දිස්ත්‍රික්කයක් තුළ ම අයදුම්කරුවන්ගේ සංඛ්‍යාව අනුව විභාග මධ්‍යස්ථාන පිහිටවනු ඇත.

එහෙත් යම් මධ්‍යස්ථානයක් සඳහා ප්‍රමාණවත් අයදුම්කරුවන් සංඛ්‍යාවක් ඉදිරිපත් නොවන අවස්ථාවල දී එකී විභාග මධ්‍යස්ථානය අවලංගු කොට අදාළ අයදුම්කරුවන් ඊට ආසන්නව පිහිටි වෙනත් විභාග මධ්‍යස්ථානයක් වෙත යොමු කිරීමට සිදුවනු ඇත. විභාග මධ්‍යස්ථාන පිහිටුවන දිස්ත්‍රික්ක හා නගර දැක්වෙන ලැයිස්තුව I වැනි උපලේඛනයෙහි දක්වා ඇත.

03. *භාෂා මාධ්‍යය.*—මෙම විභාගය සිංහල දෙමළ සහ ඉංග්‍රීසි යන භාෂාත්‍රයෙන්ම පවත්වනු ලැබේ.

04. *සුදුසුකම්.*—මෙම විභාගය සඳහා ඉල්ලුම් කරන සෑම අයදුම්කරුවකු ම පහත දක්වා ඇති සුදුසුකම් අතුරෙන් යටත් පිරිසෙයින් කවර හෝ එක් සුදුසුකමක් සපුරා තිබිය යුතුය.

4.1 දහම් පාසලක නව වැනි ශ්‍රේණිය සමත් වී දහම් පාසල් අවසාන සහතික පත්‍ර පන්තියේ යටත් පිරිසෙයින් වර්ෂයක් හෝ ඉගෙනුම් කටයුතුවල නිරත වීම;

හෝ

4.2 ජාතික පොදු අධ්‍යාපන සහතික පත්‍ර (සාමාන්‍ය පෙළ) විභාගයෙන් හෝ අධ්‍යයන පොදු සහතික පත්‍ර (සාමාන්‍ය පෙළ) විභාගයෙන් බුද්ධ ධර්මය ඇතුළුව විෂයයන් හයකින් සමත් වී සිටීම හෝ ජ්‍යෙෂ්ඨ පාඨශාලා සහතික පත්‍ර විභාගයෙන් බුද්ධ ධර්මය සහිතව සමත් වී සිටීම;

හෝ

4.3 කොළඹ තරුණ බෞද්ධ සංගමය මගින් පවත්වන ලද බෞද්ධ ශිෂ්‍ය විභාගයේ ජ්‍යෙෂ්ඨ විභාගයෙන් සමත් වී සිටීම.

*සටහන.*— (i) මෙම විභාගය සඳහා ඉදිරිපත් වන සෑම අයදුම්කරුවකු ම ඉහත 4 වැනි ඡේදයේ දක්වා ඇති සුදුසුකම් සපුරා ඇති බවට දහම් පාසල් ප්‍රධානාචාර්යවරයෙකු, පරිවේණාධිපතිවරයකු හෝ විද්‍යාලයාධිපතිවරයකු හෝ විසින් සහතික කළ යුතුය.

(ii) විභාගාපේක්ෂකයන්ට මෙම විභාගය සඳහා ඉදිරිපත් විය හැක්කේ දහම් පාසල් අයදුම්කරුවකු වශයෙන් පමණකි.

05. *අයදුම් කිරීම* :—

5.1 *දහම් පාසල් අයදුම්කරුවෝ.*—පසුගිය වසරේ සිසුන් ඉදිරිපත් කළ සියලු ම දහම් පාසල් වෙත ප්‍රමාණවත් ඉල්ලුම්පත්‍ර සහ උපදෙස් පත්‍රිකා තැපැල් මගින් එවීමට කටයුතු සලසා ඇත. අයදුම්පත් නොලැබුණු හෝ 2008 වසරේ විභාගයට ඉල්ලුම් නොකළ හෝ යම් දහම් පාසලක් වේ නම්, දහම් පාසලේ නම, ලිපිනය, ඉදිරිපත් කරන අයදුම්කරුවන් ගණන යන විස්තර සඳහන් කොට මෙහි 5. 6 වන ඡේදයේ සඳහන් ලිපිනයට 2009.10.30 වැනි දිනට පෙර දැන්විය යුතුය.

5.2 *බාහිර අයදුම්කරුවෝ.*—1999 වසරේ සිට බාහිර අයදුම්කරුවන් ලෙස කිසිදු අපේක්ෂකයකුට මෙම විභාගයට පෙනී සිටීමට ඉඩ දෙනු නොලැබේ. එසේ වුවත්, ඉහත 4 වැනි ඡේදයේ සඳහන් සුදුසුකම් සපුරා ඇති යම් විභාගාපේක්ෂකයකු වේ නම්, තමන් පදිංචි ස්ථානයට ආසන්න දහම් පාසල මගින් රුපියල් 100 ක විභාග ගාස්තුවක් ගෙවා විභාගයට පෙනී සිටීමට ඉල්ලුම් කළ හැකිය. මේ සඳහා අවශ්‍ය උපදෙස් සියලු ම දහම් පාසල් ප්‍රධානීන් වෙත ලබා දෙනු ඇත.

5.3 අදාළ දහම් පාසල් ප්‍රධානීන් විසින් ම ඉදිරිපත් කළ යුතු මෙම අයදුම්පත් පිටපත් දෙකකින් යුතුව සකස් කර මුල් පිටපත විභාග කොමසාරිස් ජනරාල් වෙත ඉදිරිපත් කළ යුතු අතර, අනෙක් පිටපත දහම් පාසල් ප්‍රධානියා වෙත තබා ගත යුතුය. අයදුම්පත්‍ර දෙකෙහි ම ප්‍රධානාචාර්යවරයා අත්සන් කර තිබිය යුතුය.

5.4 අයදුම්පත්‍ර භාර ගැනීමේ අවසාන දිනය 2009.11.20 වැනි දින වේ.

5.5 අයදුම්පත් පැහැදිළිව ද, නිවැරදිව ද සම්පූර්ණ කළ යුතුය. එසේ නොවන අයදුම්පත් සහ අයදුම්පත් භාරගන්නා අවසාන දිනයට පසුව ලැබෙන අයදුම්පත් ප්‍රතික්ෂේප කරනු ලැබේ.

5.6 දහම් පාසලේ ලිපිනය නිවැරදිව සඳහන් කළයුතු අතර, ලිපිනය වෙනස් වී නම් එය දැන්විය යුතුය. දුරකථන පහසුකම් ඇත්නම් එම අංකය ද සඳහන් කරන්න. සම්පූර්ණ කරන ලද අයදුම්පත් ලියාපදිංචි තැපෑලෙන් පහත සඳහන් ලිපිනයට ඉදිරිපත් කළ යුතුය. අයදුම්පත් ලැබුන බව දන්වා එවනු නොලැබේ.

විභාග කොමසාරිස් ජනරාල්,<br>
සංවිධාන හා විදේශ විභාග ශාඛාව,<br>
ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව,<br>
පැලවත්ත, බත්තරමුල්ල.

5.7 අයදුම්පත් බහා එවන කවරයේ වමත් පස ඉහළ කෙළවරේ "දහම් පාසල් අවසාන සහතික පත්‍ර විභාගය - 2009" යනුවෙන් ද ඉල්ලුම් කරන නගරය ද සඳහන් කළ යුතුය.

5.8 කිසිදු සහතිකයක් අයදුම්පත් සමග අමුණා එවීම අවශ්‍ය නොවේ.

5.9 අයදුම්කරුවන්ගේ අදාළ සහතික පිළිබඳවත් සුදුසුකම් ලබා තිබීම පිළිබඳවත් අයදුම්පත් සහතික කරන පරිවේණාධිපතිවරයා, ප්‍රධානාචාර්යවරයා හෝ විද්‍යාලයාධිපතිවරයා වගකිව යුතුය.

6. *විභාග ගාස්තු.*—මෙම විභාගය සඳහා නියමිත සම්පූර්ණ විභාග ගාස්තුව රුපියල් 100 කි. එහෙත් ප්‍රථම වතාවට ඉදිරිපත් වන අයදුම්කරුවන් මෙම විභාග ගාස්තුවෙන් නිදහස් කරනු ලැබේ. ඌන සාමාර්ථයය සම්පූර්ණ කිරීම සඳහා වන විෂයයට විභාග ගාස්තුව රුපියල් 50 කි.

6.1 *විභාග ගාස්තු ගෙවීම.*—දහම් පාසල් ප්‍රධානාචාර්ය විසින් විභාග ගාස්තු ගෙවීමට නියමිත සියලු ම අයදුම්කරුවන්ගේ විභාග ගාස්තු එකතු කොට, දිවයිනේ ඕනෑම තැපැල් කාර්යාලයකට එම මුදල ගෙවා, එක් ලදු පතක් ලබාගෙන, එම ලදු පත අයදුම්පත්‍රයේ පසු පිටේ නොගැලවෙන සේ අලවා එවිය යුතුය.

ලදුපතේ ඡායා පිටපතක් ළඟ තබාගැනීම ප්‍රයෝජනවත් වනු ඇත. (මුද්දර හා මුදල් ඇණවුම් භාරගනු නොලැබේ.).

6.2 *විභාග ගාස්තු ආපසු ගෙවීම.*—කුමන කරුණක් නිසාවත් මෙම විභාගය සඳහා ගෙවන ගාස්තුව වෙනත් විභාගයකට මාරු කිරීමක් හෝ ආපසු ගෙවීමක් හෝ සිදු කරනු නොලැබේ.

7. *ප්‍රවේශ පත්‍ර.*—විභාගයට ඇතුළත් කරගන්නා සෑම අයදුම්කරුවකු වෙත ම විභාග කොමසාරිස් ජනරාල් විසින් ප්‍රවේශ පත්‍රයක්, ඉල්ලුම්පත් ඉදිරිපත් කළ දහම් පාසල් ප්‍රධානාචාර්ය මගින් නිකුත් කරනු ඇත.

7.1 විභාගයට පෙනී සිටින සෑම අයදුම්කරුවකු විසින් ම ස්වකීය ප්‍රවේශ පත්‍රයේ තම අත්සන සහතික කරවාගෙන, විභාගයට පෙනී සිටින ප්‍රථම අවස්ථාවේදී ම විභාග ශාලාධිපති වෙත භාරදිය යුතුය. යම් අයදුම්කරුවකු තම ප්‍රවේශ පත්‍රය භාර නොදී සිටී නම් හා විභාග කොමසාරිස් ජනරාල් විසින් තමාට නියම කරන විභාග මධ්‍යස්ථානය හැර වෙනත් විභාග මධ්‍යස්ථානයක දී විභාගයට පෙනී සිටී නම්, ඔහුගේ විභාග අපේක්ෂකත්වය අහෝසි වනු ඇත.

7.2 ප්‍රවේශ පත්‍රයේ අයදුම්කරුගේ අත්සන, දහම් පාසල් ප්‍රධානාචාර්යවරයකු හෝ පරිවේණාධිපතිවරයකු හෝ රජයේ විද්‍යාලයාධිපතිවරයකු හෝ වර්ෂයකට රුපියල් 2,40,360 කට වැඩි ඒකාබද්ධ වැටුපක් ලබන රජයේ ස්ථිර සේවයෙහි නියුතු නිලධාරියකු හෝ විසින් සහතික කළ යුතුය.

7.3 විභාගය පැවැත්වීමට දින 07කට පෙර ප්‍රවේශපත්‍රයක් නොලැබුණහොත්, එකී දහම් පාසල් ප්‍රධානියා විසින් ඒ බව නොපමාව විභාග කොමසාරිස් ජනරාල් වෙත දැන්විය යුතුය. එවැනි සෑම අවස්ථාවකදී ම පහත සඳහන් විස්තර සැපයිය යුතුය :

1. විභාගයේ නම :————.
2. දහම් පාසලේ නම :————.
3. දහම් පාසලට ලබා දී ඇති පරිගණක අංකය :————.
4. සම්පූර්ණ නම හා ලිපිනය :————.
5. ඉල්ලුම් කළ විභාග මධ්‍යස්ථානය/නගරය :————.
6. ඉල්ලුම්පත්‍රය තැපැල් කළ තැපැල් කාර්යාලය :————.
7. ලියාපදිංචි කළ අංකය හා දිනය :————.
8. විභාග ගාස්තු ගෙවා ඇත්නම් එම ලදුපතේ අංකය, දිනය හා තැපැල් කාර්යාලය :————.

8. *හැඳුනුම්පත.*—එක් එක් විෂයයට පෙනී සිටින සෑම අවස්ථාවක ම විභාග ශාලාධිපතිට පිළිගත හැකි වන පරිදි අපේක්ෂකයන් විසින් තමන්ගේ අනන්‍යතාව ඔප්පු කිරීම සඳහා සූදානම්ව පැමිණිය යුතුය. මේ සඳහා පහත සඳහන් ලියවිලිවලින් එකක් පිළිගනු ලැබේ ;

8.1 පුද්ගලයින් ලියාපදිංචි කිරීමේ කොමසාරිස් විසින් නිකුත් කරන ලද ජාතික හැඳුනුම්පත,
8.2 වලංගු විදෙස් ගමන් බලපත්‍රය,
8.3 බෞද්ධ කටයුතු දෙපාර්තමේන්තුව මගින් නිකුත් කරන ලද භික්ෂු හැඳුනුම් පත.

9. *සමත් බව තීරණය කිරීම හා ප්‍රතිඵල නිකුත් කිරීම.*—මෙම විභාගය සඳහා නියමිත විෂයයන් ගණන හතරක් වන අතර, විභාගයෙන් සාමාර්ථය ලැබීම සඳහා සෑම විභාග අපේක්ෂකයකු ම එම විෂයයන් හතරෙන් ම සමත් විය යුතුය. කෙසේ වෙතත් එක් වතාවක දී අදාළ විෂයය හතරෙන් එක් විෂයයක් පමණක් අසමත් නම් එය ඌන සාමාර්ථයක් ලෙස සලකනු ලැබේ. විභාගයේ ප්‍රතිඵල නිකුත් කළ දින සිට අනුගාමී වසර දෙකක් (02) ඇතුළත එම ඌන සාමාර්ථය ලැබූ විෂයය සඳහා නැවත පෙනී සිට එය සමත් වී ඌන සාමාර්ථය සම්පූර්ණ කළ හැකිය. (මෙය 2007 වසරේ විභාගයේ සිට බලපැවැත් වේ.).

9.1 අයදුම්කරුවන්ගේ ප්‍රතිඵල ලැයිස්තු අදාළ දහම් පාසල් ප්‍රධානීන් වෙත තැපැල් මගින් එවනු ලැබේ.

10. *සහතික පත්‍ර.*—මෙම විභාගයෙන් සමත් වන සෑම අයදුම්කරුවකුටම සහතික පත්‍රයක් නිකුත් කිරීමට විධිවිධාන යොදනු ලැබේ.

11. *උත්තර පත්‍ර නැවත සමීක්ෂණය.*—දහම් පාසල් ප්‍රධානාචාර්යවරුන්ගේ ඉල්ලීම් මත පමණක් උත්තර පත්‍ර නැවත සමීක්ෂණයට ඉඩදෙනු ලැබේ. විභාගයේ ප්‍රතිඵල නිකුත් වී දින 30ක් ඇතුළත මෙම දෙපාර්තමේන්තුව මගින් නිකුත් කරනු ලබන ආකෘති පත්‍රයකින් උත්තර පත්‍ර නැවත සමීක්ෂණය සඳහා ඉල්ලුම් කළ යුතුය. මේ සඳහා වන ගාස්තු ප්‍රමාණයන් වරින් වර සංශෝධනය වීමට ඉඩ ඇති බැවින්, එය අදාළ අයදුම්පතෙහි දක්වනු ලැබේ. මෙම ගාස්තු ආපසු ගෙවනු ලබන්නේ මුලින්ම දෙන ලද ප්‍රතිඵලයක වෙනසක් කිරීමට සිදුවුවහොත් පමණකි. කවර හේතුවක් නිසාවත් අයදුම්කරුවන්ට හෝ ඔහුගේ නියෝජිතයින්ට හෝ උත්තර පත්‍ර පරීක්ෂා කර බැලීමට ඉඩ දෙනු නොලැබේ.

12. මෙම ව්‍යවස්ථා සහ විෂය නිර්දේශ සංග්‍රහයේ දක්වා ඇති විධිවිධානවලට අනුකූලව ක්‍රියා කිරීමට සියලු ම විභාග අයදුම්කරුවන් බැඳී සිටින අතර, මෙහි විධිවිධාන සලසා නැති කවර හෝ යම් කරුණක් වෙතොත් එය විභාග කොමසාරිස් ජනරාල්ගේ අභිමතය පරිදි තීරණය වනු ඇත.

අනුර එදිරිසිංහ,
විභාග කොමසාරිස් ජනරාල්.

2009 ඔක්තෝබර් මස වැනි දින,
පැලවත්ත,
බත්තරමුල්ල,
ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුවේ දී ය.

***විභාග විෂයය හා විෂයය නිර්දේශය***
***(1993 සිට ඉදිරියට පැවැත්වෙන විභාග සඳහා)***

මෙම විභාගය පැය 03 බැගින් වූ ප්‍රශ්න පත්‍ර 4කින් සමන්විතය.

*I වැනි ප්‍රශ්න පත්‍රය*

බුද්ධ චරිතය

මෙම ප්‍රශ්න පත්‍රය කොටස් තුනකින් යුක්තයි.

*I වැනි කොටස*

බුදුරජාණන් වහන්සේ ලොව පහළ වූ සමයෙහි පැවති භාරතීය සමාජය අවබෝධකර ගැනීම. :—

(අ) සාමාජික පසුබිම
(ආ) දේශපාලනික පසුබිම
(ඇ) ආර්ථික පසුබිම
(ඈ) ආගමික හා දාර්ශනික පසුබිම

*II වැනි කොටස - බුද්ධ චරිතය*

(අ) සිද්ධාර්ථ කුමාරෝත්පත්තියේ සිට සම්බුද්ධ පරිනිර්වාණය තෙක් බුද්ධ චරිතය.

(ආ) බුද්ධ චරිතයේ කැපීපෙනෙන විශිෂ්ට ලක්‍ෂණ - තාදී ගුණය, අසරණයන්ට පිහිටවීම, ගිලනුන්ට උපස්ථාන කිරීම, හික්මවිය යුතු පුද්ගලයන් හික්මවීම, ඉවසීම, අන්‍යමත ඉවසීම
(ඇ) බුදුරජාණන් වහන්සේගේ ලොව්තුරු ගුණ
(ඈ) බුදුරජාණන් වහන්සේගේ සමාජ ශෝධකත්වය
(ඉ) බුදුරජාණන් වහන්සේගේ නායකත්වය

*III වැනි කොටස - බුදුරජාණන් වහන්සේගේ සිව්වණක් පිරිස*

(අ) *භික්ෂු* - පස්වග භික්ෂූන්, සැරියුත් මුගලන්, මහා කාශ්‍යප, ආනන්ද, සීවලී, මහා කච්චාන, පුණ්ණමන්තානි පුත්ත, කුමාර කාශ්‍යප යන රහතන් වහන්සේ පිළිබඳ දැනුම.
(ආ) *භික්ෂුණී* - මහාප්‍රජාපතී ගෝතමී, ඛේමා, උප්පලවණ්ණා, භද්දකච්චානා, ධම්මදින්නා, අම්බපාලි, පටාචාරා යන තෙරණින් වහන්සේ පිළිබඳ දැනුම.
(ඇ) *උපාසක* - සේනිය, බිම්බිසාර, පසේනදී කෝසල, අජාසත්, අනාථ පිණ්ඩික, ධම්මික යන උපාසකවරුන් පිළිබඳ දැනුම.
(ඈ) *උපාසිකා* - විශාඛා, කෝසල මල්ලිකා, සාමාවතී, ඛුජ්ජුත්තරා යන උපාසිකාවන් පිළිබඳ දැනුම.

*2 වැනි ප්‍රශ්න පත්‍රය*

**බුද්ධ ධර්මය හා පාලි භාෂා පරිචය**

මෙම ප්‍රශ්න පත්‍රය කොටස් තුනකින් සමන්විතය.

*I වැනි කොටස - බුද්ධ ධර්මයේ මූලික ඉගැන්වීම*

(අ) පටිච්ච සමුප්පාදය
(ආ) චතුරාර්ය සත්‍යය
(ඇ) ත්‍රිලක්ෂණය
(ඈ) කර්මය සහ පුනර්භවය
(ඉ) නිර්වාණය

මෙම ධර්ම කරුණු පිළිබඳව ථෙරවාදී බෞද්ධ සම්ප්‍රදායයෙහි අර්ථ විවරණය පිළිබඳ සාමාන්‍ය අවබෝධය.

*II වැනි කොටස - භාවනා සහ අභිධර්මය*

(අ) සමථ, විපස්සනා භාවනා
(ආ) අභිධර්මයෙහි සතර පරමාර්ථ ධර්ම පිළිබඳ සාමාන්‍ය දැනුම

*III වැනි කොටස - පාලි භාෂා පරිචය*

පහත සඳහන් ගාථා සහ පාඨ සිංහලයට පරිවර්තනය කිරීම :—

(අ) ධම්මපදය - යමක වග්ග 19, 20 ගාථා, පුප්ඵ වග්ග 03 වැනි ගාථාව, බාල වග්ග - 05, 06, 10, 14, 15 ගාථා පණ්ඩිත වග්ග, 12, 13, 14 ගාථා.

(ආ) චතු භාණවාර පාලි -
(i) මිත්තානිසංස සුත්ත
(ii) මෙත්තානිසංස සුත්ත
(iii) ඛන්ධ පරිත්ත

(ඇ) රසවාහිණී - දුට්ඨ ගාමිණී අභය මහාරඤ්ඤවත්ථු

(ඈ) *වන්දනා ගාථා සහ පාඨ—*
(i) තෙරුවන් ගුණ පාඨ සහ වන්දනා ගාථා
(ii) ආමිස පූජා ගාථා

*3 වැනි ප්‍රශ්න පත්‍රය*

**ශාසන ඉතිහාසය**

මෙම ප්‍රශ්න පත්‍රය කොටස් දෙකකින් යුක්තයි.

(i) භාරතීය ශාසන ඉතිහාසය
(ii) ශ්‍රී ලංකා ශාසන ඉතිහාසය

*I වැනි කොටස - භාරතීය ශාසන ඉතිහාසය*

(අ) බෞද්ධ ධර්මදූත සේවාවේ ආරම්භය සහ බුද්ධ කාලීන ශාසන ව්‍යාප්තිය

(ආ) ධර්ම සංගායනා සතර
(ඇ) අශෝක සමය
(ඈ) අශෝක රජතුමා බෞද්ධයකු වීම
(ඉ) අශෝක ධර්මය
(ඊ) අශෝක රජුගේ ලෝක ශාසනික සේවාව
(උ) බෞද්ධ ඉතිහාසයේ අශෝක රජතුමාට හිමි තැන අගය කිරීම

*II වැනි කොටස - ශ්‍රී ලංකා ශාසන ඉතිහාසය*

(අ) මහින්දාගමනය සහ බුද්ධ ශාසන ප්‍රතිෂ්ඨාපනය

(ආ) භික්ෂුණී සමාජය
(ඇ) ශ්‍රී මහා බෝධීන් වහන්සේ වැඩම කරවීම
(ඈ) දන්ත ධාතූන් වහන්සේ වැඩම කරවීම
(ඉ) මහා විහාරය
(ඊ) අභයගිරි විහාරය
(උ) ජේතවන විහාරය
(ඌ) ත්‍රිපිටකය ග්‍රන්ථාරූඪ කිරීම
(එ) බුදු සමයෙන් ලක්වැසියන් ලද ආභාසය

*4 වැනි ප්‍රශ්න පත්‍රය*

**බෞද්ධ සංස්කෘතිය**

මෙම ප්‍රශ්න පත්‍රය බෞද්ධ සිරිත් විරිත්, ශ්‍රී ලංකාවේ කලා ශිල්ප හා ලෝක බෞද්ධ සංස්කෘතිය යන කොටස් තුනකින් යුක්ත වෙයි.

*I වැනි කොටස - බෞද්ධ සිරිත් විරිත්*

(අ) බෞද්ධ සිරිත් විරිත්වල වැදගත්කම
(ආ) බෞද්ධ ආරාම (පැවිදි) ජීවිතය ආශ්‍රිත සිරිත් විරිත්
(ඇ) ආරාම ජීවිතය පදනම් වූ බෞද්ධ ගිහි සිරිත් විරිත්
(ඈ) ගිහි පවුල් ජීවිතය සම්බන්ධ සිරිත් විරිත්
(ඉ) ශාසනික කටයුතු පිළිබඳ සිරිත් විරිත්

(සාංඝික දාන, කඨින දාන, ධර්ම දේශනා හා ධර්ම ශ්‍රවණ, පිරිත් පින්කම් හා බෝධි පූජා) බෞද්ධ උත්සව.

*II වැනි කොටස - ශ්‍රී ලංකාවේ බෞද්ධ කලා ශිල්ප*

බුදු දහමෙන් සිදු වූ කලා පෝෂණය.
බෞද්ධ ගෘහ නිර්මාණ ශිල්පය. (ස්ථූප, චෛතියඝර, බෝධිඝර, පාඨමාඝර)

බෞද්ධ මූර්ති, කැටයම් හා චිත්‍ර කලාව—

(i) *බුදු පිළිමය* - උපත හා ව්‍යාප්තිය, අනුරාධපුර සමාධි පිළිම, තොලුවිල සමාධි පිළිමය, අවුකන බුදු පිළිමය, ගල් විහාරේ බුදු පිළිම.

(ii) කැටයම් - වාහල්කඩ, සඳකඩ පහන, මුරගල්, කොරවක්ගල් හා පියගැට.

(iii) බෞද්ධ චිත්‍ර කලාව - අනුරාධපුර, පොළොන්නරුව හා මහනුවර යුගයේ බිතුසිතුවම්. (මහියංගන ධාතු ගර්භය, තිවංක පිළිමගේ, දෙගල්දොරුව, කැළණියේ අළුත් විහාරය, ගෝතමී විහාරය යන ස්ථානවල බිතු සිතුවම්)

III වැනි කොටස - සිංහල බෞද්ධ සාහිත්‍ය

බෞද්ධ කථා සාහිත්‍යයේ ආචාර විද්‍යාත්මක වටිනාකම, ජාතක පොත, සද්ධර්ම රත්නාවලිය හා පූජාවලිය පිළිබඳ සාමාන්‍යය දැනීම.

සිංහල භක්ති කාව්‍යය - බුදුගුණ අලංකාරය හා තුන් සරණය පිළිබඳ සාමාන්‍ය දැනුම.

IV වැනි කොටස - ලෝක බෞද්ධ සංස්කෘතිය

පහත සඳහන් රටවලට බුදු දහම පැමිණීම, ව්‍යාප්තිය හා බෞද්ධ සංස්කෘතික ලක්‍ෂණ පිළිබඳ සාමාන්‍ය දැනුම—

(අ) මියන්මාර් (බුරුමය)
(ආ) තායිලන්තය
(ඇ) චීනය
(ඈ) ජපානය

පරිශීලනය කළ යුතු ග්‍රන්ථ :

බෞද්ධ සංස්කෘතිය - සිරිසීවලී හිමි
කලා ශිල්ප හා සාහිත්‍ය - ඩී. ආර්. ජයවර්ධන මයා
අතිරේක කියවීම් පොත් :
බුදු සිරිත - අචාර්ය කේ. ඩී. පී. වික්‍රමසිංහ මයා

I උපලේඛනය

ඒ ඒ දිස්ත්‍රික්කයන් හි විභාග මධ්‍යස්ථාන පිහිටුවන නගර හා නගර අංක :

දිස්ත්‍රික්කය — කොළඹ 01

| නගරය | නගර අංකය |
|---|---|
| කොටහේන | 101 |
| මරදාන | 102 |
| බොරැල්ල | 103 |
| ගල්කිස්ස | 104 |
| බම්බලපිටිය | 105 |
| දෙහිවල | 106 |
| නුගේගොඩ | 107 |
| මොරටුව | 108 |
| පිළියන්දල | 109 |
| හෝමාගම | 110 |
| මහරගම | 111 |
| අවිස්සාවේල්ල | 112 |

දිස්ත්‍රික්කය — ගම්පහ 02

| නගරය | නගර අංකය |
|---|---|
| ගම්පහ | 213 |
| මිනුවන්ගොඩ | 214 |
| මීරිගම | 215 |
| වේයන්ගොඩ | 216 |
| මීගමුව | 217 |
| වත්තල | 218 |
| කැළණිය | 219 |

දිස්ත්‍රික්කය — කළුතර 03

| | |
|---|---|
| කළුතර | 320 |
| පානදුර | 321 |
| හොරණ | 322 |
| මතුගම | 323 |
| අළුත්ගම | 324 |
| මීගහතැන්න | 325 |

දිස්ත්‍රික්කය — මාතලේ 04

| | |
|---|---|
| මාතලේ | 426 |
| ගලේවෙල | 427 |
| නාඋල | 428 |
| ලග්ගල පල්ලේගම | 429 |
| දඹුල්ල | 430 |

දිස්ත්‍රික්කය — මහනුවර 05

| | |
|---|---|
| මහනුවර | 531 |
| කටුගස්තොට | 532 |
| තෙල්දෙනිය | 533 |
| වත්තේගම | 534 |
| ගලහ | 535 |
| නුගවෙල | 536 |
| ගලගෙදර | 537 |
| ගම්පොළ | 538 |
| පිළිමතලාව | 539 |
| මැද මහනුවර | 540 |
| නාවලපිටිය | 541 |

දිස්ත්‍රික්කය — නුවරඑළිය 06

| | |
|---|---|
| නුවරඑළිය | 642 |
| හැඳුනුවැව | 643 |
| හැටන් | 644 |
| ගිනිගත්හේන | 645 |
| හඟුරන්කෙත | 646 |
| වලපනේ | 647 |

දිස්ත්‍රික්කය — ගාල්ල 07

| | |
|---|---|
| ගාල්ල | 748 |
| අම්බලන්ගොඩ | 749 |
| ඇල්පිටිය | 750 |
| උඩුගම | 751 |
| අහංගම | 752 |
| බද්දේගම | 753 |
| බලපිටිය | 754 |

දිස්ත්‍රික්කය — මාතර 08

| | |
|---|---|
| මාතර | 855 |
| වැලිගම | 856 |
| කඹුරුපිටිය | 857 |

| *නගරය* | *නගර අංකය* |
|---|---|
| හක්මණ | 858 |
| දික්වැල්ල | 859 |
| අකුරැස්ස | 860 |
| දෙනියාය | 861 |

දිස්ත්‍රික්කය — හම්බන්තොට 09

| | |
|---|---|
| හම්බන්තොට | 962 |
| වලස්මුල්ල | 963 |
| වීරකැටිය | 964 |
| තංගල්ල | 965 |
| අම්බලන්තොට | 966 |
| බෙලිඅත්ත | 967 |
| තිස්සමහාරාමය | 968 |
| අගුණකොළපැලැස්ස | 969 |

දිස්ත්‍රික්කය — වව්නියාව 10

| | |
|---|---|
| වව්නියාව | 1070 |

දිස්ත්‍රික්කය — ත්‍රිකුණාමලය 11

| | |
|---|---|
| ත්‍රිකුණාමලය | 1171 |
| කන්තලේ | 1172 |

දිස්ත්‍රික්කය — අම්පාර 12

| | |
|---|---|
| අම්පාර | 1273 |
| සේරංකඩ | 1274 |
| මහඔය | 1275 |
| දෙහිඅත්තකණ්ඩිය | 1276 |

දිස්ත්‍රික්කය — පුත්තලම 13

| | |
|---|---|
| පුත්තලම | 1377 |
| ආණමඩුව | 1378 |
| හලාවත | 1379 |
| වෙන්නප්පුව | 1380 |

දිස්ත්‍රික්කය — කුරුණෑගල 14

| | |
|---|---|
| කුරුණෑගල | 1481 |
| පොල්ගහවෙල | 1482 |
| කුලියාපිටිය | 1483 |
| ඉබ්බාගමුව | 1484 |
| මැල්සිරිපුර | 1485 |
| හෙට්ටිපොල | 1486 |
| නිකවැරටිය | 1487 |
| මහව | 1488 |
| ගල්ගමුව | 1489 |

| *නගරය* | *නගර අංකය* |
|---|---|

දිස්ත්‍රික්කය — අනුරාධපුර 15

| | |
|---|---|
| අනුරාධපුරය | 1590 |
| මැදවච්චිය | 1591 |
| කැකිරාව | 1592 |
| පදවිය | 1593 |
| ගලෙන්බිඳුනුවැව | 1594 |
| තඹුත්තේගම | 1595 |
| හොරොව්පතාන | 1596 |
| නොච්චියාගම | 1597 |

දිස්ත්‍රික්කය — පොළොන්නරුව 16

| | |
|---|---|
| පොළොන්නරුව | 1698 |
| මනම්පිටිය | 1699 |
| හිඟුරක්ගොඩ | 1600 |
| මැදිරිගිරිය | 1601 |

දිස්ත්‍රික්කය — බදුල්ල 17

| | |
|---|---|
| බදුල්ල | 1702 |
| වැලිමඩ | 1703 |
| බණ්ඩාරවෙල | 1704 |
| පස්සර | 1705 |
| මහියංගනය | 1706 |
| ගිරාඳුරුකෝට්ටේ | 1707 |
| මීගහකිවුල | 1708 |

දිස්ත්‍රික්කය — මොණරාගල 18

| | |
|---|---|
| මොණරාගල | 1809 |
| බිබිල | 1810 |
| වැල්ලවාය | 1811 |
| කතරගම | 1812 |
| දොඹගහවෙල | 1813 |

දිස්ත්‍රික්කය — කෑගල්ල 19

| | |
|---|---|
| කෑගල්ල | 1914 |
| අරණායක | 1915 |
| රඹුක්කන | 1916 |
| මාවනැල්ල | 1917 |
| රුවන්වැල්ල | 1918 |
| යටියන්තොට | 1919 |
| වරකාපොළ | 1920 |

දිස්ත්‍රික්කය — රත්නපුර 20

| | |
|---|---|
| රත්නපුර | 2021 |
| ඇහැලියගොඩ | 2022 |
| පැල්මඩුල්ල | 2023 |
| බලංගොඩ | 2024 |
| ඇඹිලිපිටිය | 2025 |
| රක්වාන | 2026 |
| කලවාන | 2027 |

10-527

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.